# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2022

**බැසිල් රාජපක්ෂ, පා.ම.**
**මුදල් අමාත්‍ය**

**2021 නොවැම්බර් 12**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2022 (4, 5 සහ 6 වගන්තිවලට අනුකූලව) සහ අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2022 (7, 8 සහ 9 වගන්තිවලට අනුකූලව) ගරු මුදල් අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.

ISBN 978-624-5674-05-3

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාවය - 2021 | ix |
| **I කොටස** | |
| **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2022** | xiii |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | 1 |
| 1.1 සමාලෝචනය | 3 |
| 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් | 5 |
| **II කොටස** | |
| **අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2022** | 9 |
| **01. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | 11 |
| 1.1 සමාලෝචනය | 13 |
| 1.2 රජයේ ආදායම | 16 |
| 1.3 රජයේ වියදම | 35 |
| 1.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 38 |
| 1.5 විදේශ මූල්‍යයනය | 39 |
| **02. ආර්ථික උපනතීන්** | 47 |
| 2.1 සමාලෝචනය | 49 |
| 2.2 ආර්ථික වර්ධනය | 50 |
| 2.3 මුදල් අංශයේ වර්ධනයන් | 58 |
| 2.4 කොටස් වෙළෙඳපොළ | 59 |
| 2.5 විදේශ අංශයේ වර්ධනයන් | 59 |
| **03. රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය** | 63 |
| 3.1 සමාලෝචනය | 65 |
| 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය | 65 |
| **04. 2022 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක** | 73 |

| වගු | | පිටු අංකය |
|---|---|---|
| | **I කොටස** | |
| වගුව 1.1 | මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව 2021 සිට 2025 දක්වා | 4 |
| | **II කොටස** | |
| වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 14 |
| වගුව 1.2 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2021 | 15 |
| වගුව 1.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සංක්ෂිප්තය | 16 |
| වගුව 1.4 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 17 |
| වගුව 1.5 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය | 18 |
| වගුව 1.6 | මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම | 19 |
| වගුව 1.7 | නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම් | 19 |
| වගුව 1.8 | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම | 20 |
| වගුව 1.9 | මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු වල කාර්යසාධනය | 20 |
| වගුව 1.10 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය (ජනවාරි - අගෝස්තු 2021) | 21 |
| වගුව 1.11 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 35 |
| වගුව 1.12 | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම (%) 2020 සිට 2021 දක්වා | 36 |
| වගුව 1.13 | සුබසාධන වියදම් | 37 |
| වගුව 1.14 | කොවිඩ්-19 වසංගතය පාලනය සඳහා වූ රජයේ වියදම | 37 |
| වගුව 1.15 | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 38 |
| වගුව 1.16 | දළ දේශීය ණය මූලාශ්‍ර අනුව | 39 |
| වගුව 1.17 | 2021 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාල මූල්‍ය කොන්දේසි සමග | 40 |
| වගුව 1.18 | විදේශ ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි - 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා | 44 |
| වගුව 2.1 | ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය | 50 |
| වගුව 2.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 55 |
| වගුව 2.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 56 |
| වගුව 2.4 | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 57 |
| වගුව 2.5 | මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය: 2013 = 100) | 59 |
| වගුව 2.6 | ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම් | 60 |
| වගුව 2.7 | විදේශීය වෙළඳාම | 61 |
| වගුව 3.1 | විදුලි උත්පාදන සංයුතිය හා ධාරිතාවය | 66 |
| වගුව 3.2 | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායීත්වය | 69 |
| වගුව 3.3 | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම | 70 |

| රූපසටහන් | | පිටු අංකය |
|---|---|---|
| **II කොටස** | | |
| රූපසටහන 1.1 | මුළු ආදායම් සංයුතිය - 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා | 16 |
| රූපසටහන 1.2 | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම - 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා | 16 |
| රූපසටහන 1.3 | නිෂ්පාදන බදු/ සුරාබදු කාර්යසාධනය - 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා | 18 |
| රූපසටහන 1.4 | මූලාශ්‍ර අනුව දළ දේශීය ණය - 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා | 39 |
| රූපසටහන 1.5 | එක් එක් අංශය වෙනුවෙන් 2021 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන) | 45 |
| රූපසටහන 1.6 | පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව 2021 අගෝස්තු 31 දිනට (ඇ.ඩො. මිලියන) | 45 |
| රූපසටහන 1.7 | 2021 අගෝස්තු 31 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (ඇ.ඩො. මිලියන) | 45 |
| රූපසටහන 1.8 | 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා ණය සේවාකරණ ගෙවීම් සහ 2021 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ පුරෝකථන | 45 |
| රූපසටහන 2.1 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 49 |
| රූපසටහන 2.2 | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2021 පළමු භාගය | 50 |
| රූපසටහන 2.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2021 පළමු භාගය | 52 |
| රූපසටහන 2.4 | කර්මාන්ත අංශයේ සංයුතිය - 2021 පළමු භාගය | 53 |
| රූපසටහන 2.5 | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2021 පළමු භාගය | 54 |
| රූපසටහන 2.6 | සේවා අංශයේ සංයුතිය - 2021 පළමු භාගය | 54 |
| රූපසටහන 2.7 | ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය | 57 |
| රූපසටහන 2.8 | පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 58 |
| රූපසටහන 2.9 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා (පදනම: 2013 = 100) | 59 |
| රූපසටහන 2.10 | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 60 |
| රූපසටහන 2.11 | අපනයන සංයුතිය | 61 |
| රූපසටහන 2.12 | ආනයන සංයුතිය | 62 |

| සටහන් | | |
|---|---|---|
| 1 සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2021 ජනවාරි සිට අගෝස්තු | 23 |
| **ඇමුණුම්** | | |
| ඇමුණුම I | 2021 අගෝස්තු 31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව | 79 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 81 |
| ඇමුණුම III | 2022 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 89 |

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | **2020** | **2021** |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | -9.1 | 8.0 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | -7.3 | 7.1 |
| කර්මාන්ත | පළමු භාගය | % | -14.6 | 12.1 |
| සේවා | පළමු භාගය | % | -5.2 | 5.1 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) - CCPI | සැප්. අවසානයට | % | 4.0 | 5.7 |
| උද්ධමනය (සාමාන්‍ය) - CCPI | සැප්. අවසානයට | % | 4.7 | 4.5 |
| සේවා වියුක්ති අනුපාතය | දෙවන කාර්තුව | % | 5.4 | 5.1 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | දෙවන කාර්තුව | % | 50.2 | 49.8 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-අගෝ. | රු.බිලි. | -975 | -1,119 |
| මුළු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 906 | 942 |
| බදු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 801 | 853 |
| බදු නොවන ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 105 | 89 |
| මුළු වියදම | ජන-අගෝ. | රු.බිලි. | 1,884 | 2,062 |
| වර්තන වියදම් | ජන-අගෝ. | රු.බිලි. | 1,670 | 1,802 |
| රාජ්‍ය ආයෝජන | ජන-අගෝ. | රු.බිලි. | 228 | 270 |
| රාජ්‍ය ණය | ජූලි අවසානයට | රු.බිලි. | 14,261 | 16,752 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 6,445 | 7,903 |
| කෘෂි අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,516 | 1,766 |
| කාර්මික අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 4,905 | 6,093 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,853 | 3,435 |
| අනෙකුත් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,052 | 2,658 |
| ආනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 10,257 | 13,412 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,300 | 2,579 |
| අන්තර් භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 5,692 | 7,942 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,691 | 2,396 |
| ආයෝජන භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,253 | 2,882 |
| වෙළඳ ශේෂය | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -3,812 | -5,509 |
| සංචාරක පැමිණීම් | ජන-සැප් | සංඛ්‍යාව | 507,311 | 37,924 |
| සංචාරක ඉපයීම් | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 681.9 | 51.0 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 5,048.8 | 4,577.5 |
| කොටස් වෙළඳපොල විවිධ ආයෝජනය (ශුද්ධ) | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -172.6 | -181.3 |
| සමස්ත ගෙවුම් ශේෂය (BOP) | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -722.2 | -2,423.3 |
| දළ නිල සංචිත | අගෝ. අවසානයට | ඇ.ඩො.මිලි. | 7,430 | 3,544 |
| විනිමය අනුපාතය (මාසය අග) | සැප්. අවසානයට | ඇ.ඩො./රු. | 185.52 | 199.98 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය ) | ජන-සැප් | ඇ.ඩො./රු. | 185.03 | 201.98 |
| **මුදල් අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සැප්. අවසානයට | % | 4.50 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සැප්. අවසානයට | % | 5.50 | 6.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සැප්. අවසානයට | % | 2.00 | 4.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | සැප්. අවසානයට | % | 6.19 | 6.42 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | සැප්. අවසානයට | % | 4.51 | 6.70 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | සැප්. අවසානයට | % | 4.89 | 7.01 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | 2020 අගෝ./2021 අගෝ. | % | 17.5 | 21.0 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 2020 අගෝ./2021 අගෝ. | % | 5.2 | 15.1 |

## 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා

| වගන්තිය | වගන්තිය | අවශ්‍ය අන්තර්ගතය | අනුකූලතාවය |
|---|---|---|---|
| 4, 5 සහ 6 වගන්ති | රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ භාවිතය ඇගයීම සඳහා සම්මතයක් ඇති කර ගැනීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 7, 8 සහ 9 වගන්ති | අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ඇගයීම සඳහා අවශ්‍ය අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 10, 11 සහ 12 වගන්ති | වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | වසරේ පළමු මාස හතරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | අදාල වර්ෂයේ ජුනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, මහජනතාවට නිකුත් කළ යුතුය. එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 13, 14 සහ 15 වගන්ති | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | පවත්නා වසරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැන ගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) | මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට පෙර මහජනතාවට නිකුත් කර එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 16, 17, 18 සහ 19 වගන්ති | පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සඳහා වන පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශයෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. නව පාර්ලිමේන්තුව රැස් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

* මුදල් ඇමතිවරයා විසින්

** මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින්

## අනුකූලතාවය - 2021

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - මුදල් අමාත්‍යාංශයේ 2020 වාර්ෂික වාර්තාව**

  2020 වසරේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2021 මැයි මස අවසන් වන විට මහජනතාවට නිකුත් කර 2021 ජූනි මස 22 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021**

  2021 වසරේ පළමු මාස හතරෙහි රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2021 ජූනි මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර 2021 ජූලි මස 19 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2022 හි පහත සඳහන් වාර්තා අන්තර්ගත වේ.**

- **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2022**

  මෙම වාර්තාවේ, සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී වැදගත් ලෙස සළකනු ලබන පුළුල් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් දක්වමින් රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

- **අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2022**

  මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාවේ රජයේ ආදායම, වියදම සහ රජයේ ණය ගැනීම් යනාදියේ ඇස්තමේන්තු ඇතුලත් වන අතර, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඇගයීමට පදනම් වන කරුණු ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

# I කොටස

## රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය – 2022

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේදී මුදල් අමාත්‍යවරයා විසින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අයවැය සඳහා පදනම් වූ පුළුල් ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් විය හැකි යැයි රජය විසින් සලකනු ලබන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාව මඟින් පැහැදිලි කරනු ලබයි.

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය | 01

## 1.1 සමාලෝචනය

වේගවත් එන්නත්කරණ ක්‍රියාවලිය සහ සමාජ දුරස්ථභාවය පවත්වාගැනීම වැනි ඖෂධීය නොවන ක්‍රියාමාර්ග තුළින් කොවිඩ්-19 වසංගතය සාර්ථකව පාලනය කිරීමට ශ්‍රී ලංකාව සමත්විය. මෙම වාර්තාව පිළියෙළ කරන අවස්ථාව වන විට එන්නතෙහි තුන්වන මාත්‍රාව ද ලබා දීම ආරම්භ කරමින් වයස අවුරුදු 16 ඉක්ම වූ සුදුසුකම් ලත් ජනගහනයෙන් සියයට 83 ක් පූර්ණ වශයෙන් එන්නත්කරණය කර ඇති අතර එය දියුණු ආර්ථිකයන් හා සමාන මට්ටමක පවතී. මෙම පෙර නොවූ විරූ වසංගතය මැඩපැවැත්වීමේ සාර්ථකත්වය හා කැපවීම හමුවේ 2021 වසරේ දී ආර්ථිකය "නව සාමාන්‍ය තත්ත්වයක" පවත්වා ගෙන යාමට හැකියාව ලැබී ඇත. 2020 වසරෙහි පළමු භාගය තුළ වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සියයට 9.1 ක සංකෝචනයක් වාර්තා කිරීමෙන් පසුව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ "V-හැඩැති" ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් සියයට 8 කින් නැවත වර්ධනය විය. පූර්ව වසංගත මට්ටම කරා ළඟාවෙමින් 2021 වසරේ අගෝස්තු මාසයේ දී අඛණ්ඩව තුන්වන මාසය සඳහා ද ඇ.ඩො. බිලියන 1 ද ඉක්මවමින් අපනයන ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය වූ අතර 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,156 ක අපනයනය පසුගිය වසර 10 තුළ ඕනෑම මාසයක වාර්තා වූ ඉහළම අගය විය. විරැකියා අනුපාතය 2021 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.7 සිට දෙවන කාර්තුවේ දී සියයට 5.1 දක්වා අඩු විය. ආර්ථිකය තීව්‍ර ලෙස යළි යථා තත්ත්වයට පත්වීම, 2021 වසරෙහි පළමු මාස අට තුළ රාජ්‍ය බදු ආදායම සියයට 6.5 කින් ඉහළ නැංවීමට පිටිවහලක් විය. මුදල් හා රාජ්‍ය මූල්‍ය උත්තේජන පැකේජ සහ වසංගතයෙහි උග්‍ර බලපෑම, 2021 වසරේ දී අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ආසන්න වශයෙන් සියයට 11.0 දක්වා පුළුල් වීමට බලපාන ලදී. එසේ වුවද, වසංගතය ආශ්‍රිත වියදම් සැළකිල්ලට නොගත් විට, 2021 වසරේ දී අයවැය හිඟය සියයට 9.8 ක් පමණ වනු ඇත. අයවැය හිඟය පුළුල් වීමත් සමඟ අපේක්ෂා කළ අයුරින්ම රුපියල් මත පදනම් වූ ණය ප්‍රමාණය වැඩි වූ අතර 2019 වසර අවසානය වන විට ආසන්න වශයෙන් සියයට 50 ක් වූ සමස්ත ණය ප්‍රමාණයෙන් විදේශ මුදල් මත පදනම් වූ ණය ප්‍රමාණය ආසන්න වශයෙන් සියයට 40 ට අඩු වීමත් සමඟ ණය විචල්‍යතාවයන් (Debt dynamics) වැඩි දියුණු විය. ඒ අතරම, අපේක්ෂා කළ පරිදි වසංගතයේ හැසිරීම ආර්ථික හා රාජ්‍ය මූල්‍ය අංශ කෙරෙහි ද අහිතකර ලෙස බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ ආර්ථිකය සංකෝචනය හේතුවෙන් 2020/2021 කාලපරිච්ඡේදය තුළ ආසන්න වශයෙන් රු. බිලියන 1,500-2,000 ක් පමණ අහිමි විය. තවද, එහි බලපෑම මධ්‍යකාලීනව ද විහිදී යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එන්නත්කරණයත් සමඟ, විශේෂයෙන්ම දියුණු ආර්ථිකයන් ඇතුළුව, ගෝලීය ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීම අඛණ්ඩව සිදුවිය. කෙසේ වුවද, සීඝ්‍ර ලෙස බෝවන ඩෙල්ටා සහ අනෙකුත් කොවිඩ්-19 වෛරස් ප්‍රභේද ලෝකය පුරා ව්‍යාප්ත වීම හේතුවෙන් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම අඩපණ වී ඇත. මෙවැනි පසුබිමක් තුළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සිය 2021 වසරේ ඔක්තෝබර් මාසයේ පළ කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) පිළිබඳ වාර්තාවේ ගෝලීය වර්ධනය සඳහා වූ පුරෝකථන 2021 වසරේ දී සියයට 5.9 කට ද 2022 වසරේ දී සියයට 4.9 කට ද පහත හෙළන ලදී. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය අවකාශයේ ප්‍රමාණය සහ එක් එක් රටවල ධාරිතා මට්ටම් අනුව රටවල් පුරා අසමාන වූ වර්ධන අපේක්ෂාවන් පවතී. එමෙන්ම ඉල්ලුම් හා සැපයුම් අංශවල අවහිරතා හේතුවෙන් ද වර්ධන අපේක්ෂාවන් ඉහළ අවදානමකට ලක්ව ඇත. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමත් සමඟ යටපත්ව පැවති ඉල්ලුම ඉහළ යාම සමඟින් අගය දාමයන්ට බාධාවන් සිදුවීම තුළින් ගෑස්, ඉන්ධන සහ ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩවල මිල ජාත්‍යන්තර වශයෙන් පෙර නොවූ විරූ ලෙස ඉහළ යාම සහ ප්‍රවාහන වියදම් ඉහළ යාම හේතුවෙන් රටවල් පුරා උද්ධමන පීඩනය ඉහළ ගොස් ඇත. මෑත කාලීනව උද්ධමනය ඉහළ යාම හමුවේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි පහසුවෙන් අවදානමට ලක්විය හැකි ජනතාවගේ ජීවන තත්ත්වය මත මෙම වසංගතය දැඩි බලපෑමක් එල්ල කර ඇත. මෙම ගෝලීය ප්‍රවණතාවය ශ්‍රී ලංකාව තුළ ද පිළිබිඹු කරමින් ඉල්ලුම් හා සැපයුම් යන දෙඅංශයෙහිම වූ කම්පන හේතුවෙන් පැන නගින ආහාරමය සහ ආහාරමය නොවන භාණ්ඩවල මිල ඉහළ යාම, පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉහළ යාමට ද හේතු විය. එය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්කයන් වෙත ළඟා නොවීමකි. කෙසේ වෙතත්, මෑත මාසවල ඉහළ යමින් පවතින උද්ධමනය තාවකාලික තත්ත්වයක් විය හැකි අතර, එය 2022 වසරේ දී මැද තනි අගයකට ළඟාවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසංගතය මඟින් ප්‍රේරණය වූ සංචරන සීමා හේතුවෙන් වැඩිම බලපෑමකට ලක්වූයේ යැයි සැළකිය හැකි ඇ.ඩො. බිලියන 4 ක් ඉපැයූ සංචාරක ක්ෂේත්‍රය 2020 වසරේ පළමු මාස නවය තුළ ඉපැයූ ශුන්‍යයට ආසන්න ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 51 දක්වා වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, සංචරණ සීමා තව දුරටත් ලිහිල් කිරීමත් සමඟ 2021 වසරේ අවසාන කාර්තුවේ දී දේශීය හෝටල්වල කාමර වෙන්කිරීම් සහ විමසීම්වල වර්ධනයක් පෙන්වීමෙන් අනතුරුව සංචාරකයින්ගේ පැමිණීම ක්‍රමානුකූලව වර්ධනය වූ අතර එය 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී 22,771 ක සමාන්‍ය අගයක් දක්වා වැඩි විය.

දේශීය මූල්‍ය වෙළෙඳපොළ ශක්තිමත් කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති පොලී අනුපාත 2021 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ දැමීමත් සමඟ ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය, ලිහිල් ප්‍රතිපත්තියක සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයකට පරිවර්තනය විය. වසංගතයට ප්‍රතිචාරයක් ලෙස 2020 වසරේ මාර්තු මාසයේ සිට අඛණ්ඩව පදනම් අංක 200 දක්වා අඩු කරන ලද නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) 2021 වසරේ අගෝස්තු මාසයේ දී පිළිවෙළින් සියයට 5.00 සහ සියයට 6.00 දක්වා වැඩි කරන ලදී. මීට අමතරව, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකුවල (LCB) සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාල වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) සියයට 2.00 සිට සියයට 4.00 දක්වා වැඩි කරන ලදී.

2022-2025 සඳහා වූ මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව, ප්‍රධාන වශයෙන්ම වසංගතයේ බලපෑම හේතුවෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මෑතකාලීන ප්‍රවණතාවයන් සැලකිල්ලට ගනිමින් සංශෝධනය කර ඇත. සංශෝධිත ඇස්තමේන්තුවට අනුව 2021 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.1 ක් වූ අයවැය හිඟය 2022 වසරේ දී සියයට 8.8 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2022 වසරේ දී ද. දේ. නි. යෙන් සියයට 5 ක් පමණ වනු ඇතැයි අපේක්ෂිත රාජ්‍ය ආයෝජනය සඳහා ප්‍රමාණවත් මූල්‍ය අවකාශයක් සැපයීම වෙනුවෙන් අයවැය හිඟය මධ්‍යකාලීනව තිරසර මට්ටමකට අඩුකිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. ආර්ථික වර්ධනය උත්තේජනය කිරීමේ අරමුණින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වූ රාජ්‍ය ආයෝජනය මධ්‍යකාලීනව සියයට 5-7 අතර පරාසයකට ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආදායම් ඉහළ නැංවීම සහ වියදම් තාර්කීකරණය ආදී ක්‍රියාමාර්ගවල සංකලනයක් මඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තුළින් 2025 වසරේ දී අයවැය හිඟය සියයට 4.8 ක පවත්වා ගැනීමට අපේක්ෂා කරන අතර 2025 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ණය ආසන්න වශයෙන් සියයට 89.2 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

වගුව 1.1 : **2021 සිට 2025 දක්වා මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව - ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස**

| අයිතමය | තාවකාලික | ඇස්තමේන්තු | | පුරෝකථන | | |
|---|---|---|---|---|---|---|
| | **2020** | **2021** | **2022** | **2023** | **2024** | **2025** |
| මුළු ආදායම හා ප්‍රදාන | **9.2** | **9.1** | **12.4** | **13.6** | **14.4** | **15.5** |
| මුළු ආදායම | **9.1** | **9.1** | **12.3** | **13.5** | **14.4** | **15.5** |
| බදු ආදායම | **8.1** | **8.0** | **11.2** | **12.2** | **13.0** | **13.9** |
| ආදායම් බදු | 1.8 | 1.8 | 2.9 | 2.7 | 2.9 | 3.3 |
| භාණ්ඩ හා සේවා මත බදු | 3.9 | 3.9 | 5.7 | 6.2 | 6.6 | 7.1 |
| විදේශීය වෙළඳාම මත බදු | 2.4 | 2.3 | 2.6 | 3.3 | 3.5 | 3.6 |
| බදු නොවන ආදායම | **1.0** | **1.0** | **1.1** | **1.3** | **1.4** | **1.6** |
| ප්‍රදාන | **0.04** | **0.03** | **0.05** | **0.05** | **0.04** | **0.04** |
| මුළු වියදම | **20.3** | **20.2** | **21.2** | **20.9** | **20.5** | **20.4** |
| වර්තන වියදම | **17.0** | **16.7** | **16.2** | **15.4** | **14.5** | **13.7** |
| වැටුප් හා වේතන | 5.3 | 5.1 | 5.3 | 5.1 | 4.8 | 4.5 |
| භාණ්ඩ හා සේවා | 1.2 | 1.1 | 1.0 | 1.0 | 0.9 | 0.8 |
| පොලී ගෙවීම් | 6.5 | 6.4 | 6.1 | 6.1 | 5.8 | 5.5 |
| සහනාධාර හා පැවරුම් | 4.8 | 4.1 | 3.7 | 3.3 | 3.0 | 2.8 |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණයදීම් | **3.3** | **3.5** | **5.0** | **5.6** | **6.0** | **6.7** |
| රාජ්‍ය ආයෝජන | 5.4 | 3.5 | 5.1 | 5.6 | 6.1 | 6.7 |
| ජංගම ගිණුමේ ශේෂය | **-7.9** | **-7.7** | **-3.9** | **-1.8** | **-0.1** | **1.8** |
| ප්‍රාථමික ශේෂය | **-4.6** | **-4.7** | **-2.7** | **-1.3** | **-0.3** | **0.7** |
| අයවැය හිඟය | **-11.1** | **-11.1** | **-8.8** | **-7.3** | **-6.1** | **-4.8** |
| අයවැය හිඟය මූල්‍යනය | **-11.1** | **-11.1** | **-8.8** | **-7.3** | **-6.1** | **-4.8** |
| විදේශීය මූල්‍යනය (ශුද්ධ) | -0.6 | -0.3 | -1.0 | 0.4 | 0.0 | -0.3 |
| දේශීය මූල්‍යනය (ශුද්ධ) | 11.7 | 11.4 | 9.8 | 6.9 | 6.1 | 5.2 |
| මධ්‍යම රජයේ ණය (ද.දේ.නි. % ලෙස) | **101.0** | **102.8** | **101.7** | **98.7** | **94.4** | **89.2** |

මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව
* ඉහත ඇස්තමේන්තු සහ පුරෝකථනයන් 2021 ඔක්තෝබර් මස අවසාන තොරතුරු මත පදනම් වේ.

සමාජයේ සියළුම පාර්ශවයන්ට ප්‍රතිලාභ සලසමින් ආර්ථිකයේ තිරසරබව පවත්වා ගැනීම සහ මධ්‍යකාලීනව සියයට 5-7 පමණ වාර්ෂික වර්ධනයක් පවත්වා ගැනීම "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාවෙහි පුළුල්ව දක්වා ඇති රජයේ ප්‍රතිපත්ති රාමුව මගින් අපේක්ෂා කරයි.

### 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන්

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි දක්වා ඇති ඉලක්ක ලඟාකර ගැනීම සඳහා මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි දක්වා ඇති පරිදි රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් කේන්ද්‍රගත වී ඇත.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීම සහ වර්ධනය උත්තේජනය කිරීම අතර සමතුලිතතාවය පවත්වා ගැනීම රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායය වේ. අඩු බදු අනුපාත, සරල බව සහ අඛණ්ඩ බව මත පදනම් වූ බදු ප්‍රතිපත්තියක් සමඟ ශක්තිමත් රාජ්‍ය ආයෝජන ක්‍රමෝපායයක් හරහා පුද්ගලික අංශය මූලික කරගත් ආර්ථික වර්ධනයකට සහාය වීම සඳහා ද එය සකස්කර ඇත. මෙම වටපිටාව තුළ, සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් ඇති කරනු ලබන වසංගතයක් පවතින අවස්ථාවක, විශේෂයෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට ව්‍යාපාර සඳහා ස්ථාවර පරිසරයක් සපයන අතරම බදු ප්‍රතිපත්තිය ස්ථාවරව පවත්වාගෙන යාමේ තීරණයෙහි සිටිමින් 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත්කරන ලද පුළුල් පරාමිතීන් තුළ තව දුරටත් ක්‍රියාත්මක වීම රජයේ බදු ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, බදු ගෙවන්නන්ට වඩාත් හිතකරවන පරිදි බදු ගෙවීමේ යාන්ත්‍රණ අඛණ්ඩව හඳුන්වා දෙන අතරම කෘත්‍රිම බුද්ධිය සහ විශාල දත්ත විශ්ලේෂණ වැනි උසස් තාක්ෂණික ක්‍රම භාවිතය මගින් බදු පරිපාලනය වේගවත් ලෙස වැඩි දියුණු කිරීමට ද අවධානය යොමුව තිබේ. බදු ගෙවීම් පැහැර හැරීම අවම කිරීම සහ ඉලෙක්ට්‍රොනික අත්සන් (e-Signature), මාර්ගගත ගෙවීම් ක්‍රම හඳුන්වා දීම මගින් බදු පදනම පුළුල් කිරීම සඳහා ක්‍රමවේද සකස් කෙරෙනු ඇත. 2022 වසරේ මුල සිට බදු ව්‍යුහය තව දුරටත් සරල කිරීමේ පිළිවෙතක් ලෙස සංයුක්ත කරන ලද තනි බද්දක් හඳුන්වා දෙනු ඇත.

රජය සතු ව්‍යාසායයන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සමඟ ඉහළ ලාභාංශ සහ අයභාර වැඩි කිරීම, බලපත්‍ර වෙන්දේසි කිරීම ආදිය තුළින් බදු නොවන ආදායම ඉහළ නැංවීමට ද පියවර ගනු ලැබේ.

විශේෂයෙන්ම පුනරාවර්තන වියදම් කළමනාකරණය කිරීමේ දී එම වියදම්වල කාර්යක්ෂමතාවය, ගුණාත්මකභාවය සහ වැඩි දියුණු කරන ලද සේවා සැපයුමක් සහතික කරන අතරම දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරමින් වියදම් දරනු ලබන සෑම ආයතනයක්ම තම ක්‍රියාකාරකම් ප්‍රමුඛතා අනුපිළිවෙළට පෙළගැස්වීමට අවශ්‍ය අනුබලය වියදම් කළමනාකරණය මගින් සපයනු ලබයි. සමාජයේ වෙසෙන අවධානමට ලක්විය හැකි පුද්ගලයින් ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් හරහා ආරක්ෂා කිරීම තහවුරු කරන අතරම ඉලක්කගත සහනාධාර බෙදා හැරීම කරා යොමු වීමට ද රජය උනන්දුවෙන් කටයුතු කරයි.

ජල සම්පාදනය, වාරිමාර්ග, මාර්ග, සෞඛ්‍ය සහ අධ්‍යාපනය, ග්‍රාමීය ගම්මාන සංවර්ධනය, ආහාර සුරක්ෂිතතාවය, නිවාස, කෘෂිකාර්මික සහ කාර්මික අංශවල යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන සැකසුම් කලාප, හරිත ආර්ථිකය, පුනර්ජනනීය බලශක්තිය, තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් යහපාලනය ආදී ප්‍රමුඛතා ක්ෂේත්‍ර කෙරෙහි රාජ්‍ය ආයෝජනයෙහි අවධානය යොමුව ඇති අතර ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍රවලින් මෙම ආයෝජන මූල්‍යයනය කෙරේ. රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය සහ ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ හුවමාරු කිරීම (Build, Operate and Transfer) වැනි යාන්ත්‍රණ ඔස්සේ නාගරික නිවාස, මාර්ග, බලශක්තිය ආදී ව්‍යාපෘතිවල පුද්ගලික අංශයේ සහභාගිත්වය තුළින් මෙය තව දුරටත් විස්තීරණය කෙරෙනු ඇත.

අනිකුත් ක්‍රියාමාර්ග අතර ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදනය (e-GP) හා ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත (e-National Identity Crad) වැනි ක්‍රියාවලින් ඩිජිටල්කරණය කෙරෙහි අවධානය යොමු කිරීම සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂම සේවා සැපයීම සඳහා බාධා පමුණුවනු ලබන නියාමනයන් විචක්ෂණශීලී ලෙස ඉවත් කිරීම යනාදියෙන් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායය සමන්විත වේ.

**සාර්ව ආර්ථික රාමුව:**

- 2022 වසරේ දී සියයට 5.0 ට වැඩි සහ ඉන් ඔබ්බට සියයට 6.0 - 7.0 අතර ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගැනීම.
- සේවා වියුක්තිය සියයට 5.0 ට අඩු මට්ටමක පවත්වා ගැනීම.
- උද්ධමනය සියයට 4.0 - 6.0 පරාසයක පවත්වා ගැනීම සහ තනි ඉලක්කමක පොලී අනුපාතයක් සහතික කිරීම.
- රුපියලේ විනිමය හුවමාරු වටිනාකම ස්ථාවරව පවත්වා ගැනීම.

ප්‍රමාණවත් නොවන ධාරිතාවය, විනිවිදභාවය හා වගවීම හේතුවෙන් රජය සතු ව්‍යවසායයන් හි උප ප්‍රශස්ත කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. රජය සතු ව්‍යවසායයන් මූල්‍ය

වශයෙන් ස්ථාවර, තරඟකාරී සහ නව්‍යකරණයෙන් යුත් ආයතන බවට පත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවශ්‍යව පවතී. ඵලදායීතාවය ඉහළ නැංවීම සහ උපායමාර්ගික නොවන රජය සතු වාණිජ ව්‍යවසායයන් හි හිමිකාරීත්වය පුළුල් කිරීම තුළින් වියදම් අඩු කරමින්, බදු නොවන ආදායම ඉහළ නංවන අතර අයවැය හිඟයට ණය නොවන මූල්‍ය සම්පාදනය මඟින් රාජ්‍ය මූල්‍ය අවකාශයට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වෙළෙඳ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අපනයනකරුවන්ට ශ්‍රේණිගත කිරීම් ලබාදෙනු ඇති අතර එය රේගුවේ දී වේගවත් නිෂ්කාශන සිදු කිරීමට පිටිවහලක් වනු ඇත. ප්‍රධාන දේශීය කර්මාන්තවල සහ විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයේ තත්ත්වයට හානියක් නොවන පරිදි බාධාකාරී නොවන වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලව රේගු බදු නොවන ආනයන බදු (Para Tariff) ඉවත් කිරීම සහ තාර්කිකකරණය කිරීම අඛණ්ඩව සිදු කෙරේ. තවද විවිධ ආයතන මඟින් අනුමැතිය ලබා ගැනීමට ඇති අවශ්‍යතාවය ඉවත් කිරීම තුළින් ආනයන සඳහා බලපත්‍ර ලබා ගැනීම විධිමත් කරනු ඇත. කෙසේ වුවද, අයවැය හිඟය ඉහළයාම හේතුවෙන් ඉහළ ගිය ණය ප්‍රමාණය, ප්‍රකාශයට පත් කරන ලද විදේශ සම්පත් ඒකරාශිකරණය 2020-2025 උපාය මාර්ගයට (Foreign Resource Mobilization 2020 - 2025) අනුකූලව එහි විචලනයේ වෙනසක් දක්නට ලැබුණු අතර එමඟින් විදේශ ණය තාර්කිකරණය කිරීමත් සමඟ විදේශ ණය ප්‍රමාණය 2019 වසරේ දී ආසන්න වශයෙන් ඉහළම අගය වූ සියයට 50 සිට සියයට 40 පමණ දක්වා අඩු විය. සහනදායි කොන්දේසි යටතේ බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ආයතන මඟින් සපයනු ලබන මූල්‍ය පහසුකම් ලබා ගනිමින් මෙම තත්ත්වය පවත්වා ගැනීමට අපේක්ෂා කරයි. ඒ අතරම විශේෂයෙන්ම මාර්ග ඉදිකිරීම, වැව් ප්‍රතිසංස්කරණය වැනි අවම ආනයන අවශ්‍යතා සහිත අංශ සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන මූල්‍යයනය කිරීම දේශීය මූල්‍ය පහසුකම් මඟින් සිදු කරනු ඇත. රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ මාර්ග ඉදිකිරීම්, නිවාස යනාදී කටයුතු පෞද්ගලික අංශය මඟින් සිදු කිරීම තුළින් අරමුදල් චක්‍රීයව ගලායාම හේතුවෙන් සිදුවිය හැකි සියල්ලම එක් අංශයක් කරා ඒකරාශී වීමේ (Crowding Out) බලපෑම් අවම කරනු ඇත.

තිරසර ආර්ථිකයක් සාක්ෂාත් කරගැනීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් කෘෂිකර්මාන්තය සහ බලශක්තිය යන අංශ කාබනික කෘෂිකර්මාන්තය සහ බලශක්ති උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කරා යොමු වෙමින් පවතී. එවැනි පරිවර්තනයන් පාර්ශවකරුවන්ගේ ප්‍රතිරෝධයට ලක් වී ඇති අතර මේ සම්බන්ධයෙන් වන අවශ්‍යතා සපුරාලීම සඳහා වන රජයේ කැපවීම අයවැය තුළින් සිදුවන සම්පත් ප්‍රතිපාදනයෙන් සහ මූල්‍ය අංශය මඟින් පිළිබිඹු කරයි. තවද, හරිත සහ තිරසර මූල්‍යකරණ විකල්පයන්හි විභවතාවය ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

කොවිඩ්-19 වසංගතය මඟින් ආර්ථිකය මත වන බලපෑම ප්‍රධාන අභියෝගයක් ලෙස පවතින අතර එය දේශීය වර්ධනයට පමණක් නොව ගෝලීය වර්ධනය සහ පරිභෝජන රටාවන්ට ද බලපානු ලබන අතර එමඟින් විදේශ සහ මූර්ත අංශ කෙරෙහි ද බලපෑමක් එල්ල කරනු ඇත. විශේෂයෙන්ම තෙල්, ගල් අඟුරු සහ ගෑස් ආදී භාණ්ඩවල ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිල ඉහළ යාම ආර්ථිකයට බලපෑමක් ඇති කරනු ලබන අතරම බලශක්ති ක්ෂේත්‍රයට ද පීඩනයක් එල්ල කරනු ඇත. දේශගුණික විපර්යාසවල ඉහළ යන අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ස්වභාවික හා භෞතික වත්කම්වලට, ආහාරදාමවලට සහ ජීවනෝපායයන්ට සිදුවන හානි සමඟ ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල කරනු ඇත.

# II කොටස

# අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2022

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය කටයුතු ඇගයීම සඳහා අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කළ යුතු අතර එය විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවනවර කියවන දිනයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන් සහ ගෙවුම් ශේෂය සඳහා අදාළ වන ඇස්තමේන්තු සහ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා පදනම් වූ උපකල්පන ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

ඒ අනුව, 2021 වසරේ පළමු මාස අට තුළ රජයේ ආදායම, වියදම සහ ණය ගැනීම පිළිබඳ තාවකාලික දත්ත මෙම වාර්තාවේ ඇතුළත් වේ. රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් සිදුකරනු ලැබ ඇති සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිවන පරිදි මෙම කාලපරිච්ඡේදයට අදාළ ප්‍රධාන සාර්ව ආර්ථික උපනතීන් මෙකී වාර්තාවේ ඇතුළත් වේ. 2022 වසර සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පදනම් කරගත් ආර්ථික සහ අනෙකුත් උපකල්පන පිළිබඳ තොරතුරු, මෙම උපකල්පනවලට අදාල විය හැකි අවදානම් සාධක සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අනෙකුත් තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# 01

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

## 1.1 සමාලෝචනය

වසංගතයේ බලපෑම සහ වසර ගණනාවක් පුරා අඛණ්ඩව පැවති දුර්වල ආර්ථික වර්ධනය හේතුවෙන් වසංගතයට පෙර පැවති රාජ්‍ය මූල්‍ය අවකාශයේ සීමාකාරී බව 2021 පළමු මාස අට තුළ තව දුරටත් තීව්‍ර විය. වසංගතයට පෙර සිටම රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතාවයන් රැසක් පෙන්නුම් කරන ලදී; 2019 දී, දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස බදු ආදායම සියයට 11.6 ක අඩු අගයක පැවතිණ; ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය මූල්‍ය හිඟය සියයට 9.6 දක්වා පුළුල් විය; ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය සියයට 86.8 ක් විය; එසේම වසර 18 ක කාලය තුළ අවම ආර්ථික වර්ධනය වූ සියයට 2.3 වාර්තා විය. 2020 දී, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස බදු අනුපාතය සියයට 8.1 දක්වා අඩු විය; රාජ්‍ය මූල්‍ය හිඟය සියයට 11.1 දක්වා තව දුරටත් පුළුල් විය; එසේම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය සියයට 101 ක් දක්වා වැඩි විය. මේ අතර, අඩපණ වූ ආර්ථිකයේ පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා රජය විසින් දැඩි විශ්වාසයෙන් යුතුව 2019 නොවැම්බර් මස දී සරල, විනිවිදභාවයෙන් යුත් කාර්යක්ෂම බදු පද්ධතියක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, වසංගතය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීම ප්‍රමාද විය. මීට අමතරව, එන්නත්කරණය ඇතුළු වසංගතය හා සම්බන්ධ වියදම් ඉහළ යන ලදී. ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම සඳහා මූල්‍ය ප්‍රදාන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා බදු සහන, ණය පමා සහන සහ අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිලක් පැනවීම වැනි රාජ්‍ය මූල්‍ය සහ මුදල් උත්තේජන ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිපත්තිමය පොලී අනුපාත පහත හෙලන ලද අතර, අනෙකුත් කරුණු අතර ආනයන පාලනය මඟින් විදේශ ශේෂයන් කළමනාකරණය කරන ලදී. අවිනිශ්චිත ගෝලීය ආර්ථික වාතාවරණයක් තුළ වසංගත තත්ත්වයේ දීර්ඝ කාලීන බලපෑම, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි අතිරේක පීඩනයක් එල්ලකර ඇත.

දේශීය හා විදේශීය අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ වුව ද, 2021 වසරේ පළමු මාස අට තුළ දී රාජ්‍ය ආදායම් එක්රැස් කිරීමේ අභිප්‍රායයන් සාර්ථක වී ඇත. ප්‍රදානයන් ද ඇතුළත්ව රාජ්‍ය ආදායම, 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 908.9 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 943.6 ක් දක්වා සියයට 3.8 කින් ඉහළ යන ලදී. ආදායම් බදු, එකතු කළ අගය මත බදු, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු, වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වන බදු (සෙස් බදු) සහ සුරාබදු වලින් එකතු කරන ලද ආදායම ඉහළ යාම පිළිබිඹු කරමින්, 2020 වසරේ පළමු මාස අටට සාපේක්ෂව 2021 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී බදු ආදායම රු. බිලියන 801.3 සිට රු. බිලියන 853.1 ක් දක්වා සියයට 6.5 කින් ඉහළ යන ලදී. කෙසේ වුවද, ගාස්තු සහ අය කිරීම්, කුලී ලැබීම් හා පොලී ආදායම් සහ මහ බැංකු ලාභ පැවරුම් වලින් ලද ආදායම් පහත වැටීම පිළිබිඹු කරමින් බදු නොවන ආදායම, 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ රු. බිලියන 105.0 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 89.4 ක් දක්වා සියයට 14.8 කින් පහත වැටුණි. එසේ වුවද, මූල්‍ය සහ විදුලි සංදේශ අංශයන්ගෙන් ලද ලාභ හා ලාභාංශ පැවරුම් ඉහළ යාම හේතුවෙන් රජය සතු ව්‍යවසායයන්හි ලාභ හා ලාභාංශ 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 14.2 දක්වා සියයට 81.6 කින් ඉහළ යන ලදී.

ආදායම් මත වූ බදු ආදායම, 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද රු. බිලියන 167.4 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 175.2 දක්වා සියයට 4.6 කින් ඉහළ යන ලදී. ආර්ථික කටයුතු තීව්‍ර ලෙස යථා තත්වයට පත්වීම පිළිබිඹු කරමින්, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම රු. බිලියන 158.3 දක්වා සියයට 16.1 කින් වර්ධනය විය. ඒ හා සමගාමීව 2021 වසරේ පළමු මාස අට තුළ ප්‍රාග්ධන ඉපැයීම් බදු ආදායම් රු. මිලියන 239 දක්වා සියයට 66.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.

දේශීය පරිභෝජනය පාදක කොට ගත් බදු ආදායම 2021 පළමු මාස අට තුළ රු. බිලියන 268.7 ක් දක්වා සියයට 20.4 කින් ඉහළ යන ලදී. මත්පැන්, දුම්වැටි සහ පැණි රස අඩංගු කළ බීම වර්ග වැනි දේශීය ක්‍රියාකාරකම් මත සුරාබදු/ නිෂ්පාදන බදු ආදායම් 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 149.1 ක් දක්වා සියයට 11.0 කින් ඉහළ ගිය අතර, දේශීය ක්‍රියාකාරකම් මත වූ එකතු කළ අගය මත බදු (VAT) ආදායම රු. බිලියන 119.4 දක්වා සියයට 37.0 කින් ඉහළ යන ලදී.

ආනයන මත වූ එකතු කළ අගය මත බද්ද, රේගු ආනයන බද්ද, සෙස් බද්ද හා වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද වැනි ආනයන පාදක බදු මඟින් ජනනය වූ ආදායම 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 371.3 දක්වා සියයට 2.4 කින් ඉහළ යන ලදී. කෙසේ වෙතත්, දේශීය මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත අඩු කිරීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම 2021 පළමු මාස අට තුළ දී රු. බිලියන 37.8 දක්වා සියයට 31.4 කින් පහත වැටුණි. මෝටර් වාහන ආනයන සීමා කිරීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන ආනයන මත නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 49.1 දක්වා සියයට 39.0 කින් පහත වැටුණි.

වගුව 1.1 : රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය

රු. මිලියන

| අයිතමය | ජන.-අගෝ. | |
|---|---|---|
| | 2020 | 2021(අ) |
| **ආදායම් හා ප්‍රදාන** | **908,876** | **943,558** |
| **ආදායම** | **906,359** | **942,491** |
| බදු | 801,340 | 853,063 |
| බදු නොවන | 105,020 | 89,428 |
| ප්‍රදාන | 2,516 | 1,067 |
| **වියදම්** | **1,883,706** | **2,062,400** |
| **පුනරාවර්තන** | **1,670,356** | **1,801,521** |
| වැටුප් | 516,354 | 564,151 |
| පොලී ගෙවීම් | 653,498 | 700,538 |
| අනෙකුත් | 500,504 | 536,833 |
| රාජ්‍ය ආයෝජන | 227,939 | 270,283 |
| අනෙකුත් | -14,590 | -9,405 |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය (+)** | **-763,997** | **-859,030** |
| **සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-974,831** | **-1,118,842** |
| **මූල්‍යයනය** | **974,831** | **1,118,842** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | -92,289 | -183,115 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 1,067,119 | 1,301,957 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

2021 වර්ෂයේ අයවැය මඟින් ප්‍රකාශයට පත් කළ පරිදි බදු පැහැර හැරීම අවම කර බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා බදු පරිපාලනය ශක්තිමත් කිරීම කෙරෙහි පෙර නොවූ විරූ ලෙස වැඩි අවධානයක් යොමු කරන ලදී. ඩිජිටල්කරණය කඩිනම් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS), ශ්‍රී ලංකා රේගුවේ රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) සහ ශ්‍රී ලංකා රේගුවේ යෝජිත තනි ප්‍රවේශ කවුළුව (Single Window) වැනි ආදායම් පරිපාලන පද්ධති විධිමත් කරමින් පවතී. සුරාබදු දෙපාර්තමේන්තුව ද ආදායම් පරිපාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කරමින් සිටී. බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව නංවාලීම සඳහා විශාල බදු ගෙවන්නන්ගේ අංශය (LTU), ඉහළ සංස්ථාපිත අංශය (UCU), මධ්‍යම සංස්ථාපිත අංශය (MCU) සහ ප්‍රාදේශීය සංස්ථාපිත අංශය (RCU) ස්ථාපිත කිරීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනයට තවදුරටත් පහසුකම් සලසා දී ඇත. මීට අමතරව, 2021 අප්‍රේල් මස 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි සියලුම සංස්ථාපිත සමාගම් සඳහා ඉලෙක්ට්‍රොනික ගොනුගත කිරීම (e - filing) අනිවාර්ය කර ඇති අතර බදු ආශ්‍රිත මූලාශ්‍ර ලේඛන සඳහා බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය (TIN) භාවිතා කිරීම අනිවාර්ය කර ඇත.

ප්‍රධාන වශයෙන් වැටුප් හා පොලී ගෙවීම් මත පුනරාවර්තන වියදම් ඉහළ යාම හේතු කොට ගෙන 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රාජ්‍ය වියදම, රු. බිලියන 1,883.7 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 2,062.4 දක්වා සියයට 9.5 කින් ඉහළ යන ලදී. පොලී ගෙවීම්, වැටුප් හා විශ්‍රාම වැටුප් මත වියදම ඉහළ යාම සමඟ එන්නත්කරණය ඇතුළු කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ සෞඛ්‍ය වියදම් මූලික කොටගෙන, පුනරාවර්තන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 1,670.4 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,801.5 දක්වා සියයට 7.9 කින් වර්ධනය විය. විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් පහත වැටුණ ද, දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළයාම හේතුවෙන් පොලී ගෙවීම් සඳහා වියදම රු. බිලියන 700.5 ක් දක්වා සියයට 7.2 කින් ඉහළ යන ලදී. 2021 වසරේ පළමු මාස අට තුළ වැටුප් හා වේතන රු. බිලියන 564.2 දක්වා සියයට 9.3 කින් ඉහළ ගිය අතර විශ්‍රාම වැටුප් වියදම් රු. බිලියන 176.1 දක්වා සියයට 10.0 කින් ඉහළ යන ලදී. එසේම ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් 2021 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 260.9 දක්වා සියයට 22.3 කින් ඉහළ යන ලදී.

වගුව **1.2 :** ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2021

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | ජන. - අගෝ. ඇස්තමේන්තුව | ජන. - අගෝ. තත්‍ය(අ) | වෙනස |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **1,951.0** | **1,232.7** | **942.5** | **-290.2** |
| බදු ආදායම | **1,724.0** | **1,117.0** | **853.1** | **-264.0** |
| දේශීය ආදායම් දෙපාර්මේන්තුව | | | | |
| ආදායම් සහ ලාභ මත බද්ද | 371.0 | 233.5 | 175.1 | -58.3 |
| එකතු කල අගය මත බද්ද - දේශීය (ශුද්ධ) | 200.0 | 119.9 | 119.4 | -0.6 |
| අනෙකුත් | 4.5 | 2.6 | 22.7 | 20.1 |
| **උප එකතුව** | **575.5** | **356.0** | **317.2** | **-38.8** |
| ශ්‍රී ලංකා රේගු දෙපාර්මේන්තුව | | | | |
| ආනයන බද්ද | 180.0 | 117.5 | 60.9 | -56.6 |
| එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ) | 110.0 | 71.5 | 80.2 | 8.7 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 170.0 | 112.9 | 92.0 | -20.8 |
| සෙස් බද්ද | 70.0 | 46.1 | 51.2 | 5.1 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 110.0 | 73.1 | 37.8 | -35.3 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද | 315.0 | 211.5 | 108.8 | -102.8 |
| දුම්වැටි | 130.0 | 87.7 | 55.2 | -32.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 85.0 | 56.3 | 37.5 | -18.8 |
| මෝටර් වාහන | 90.0 | 60.9 | 11.6 | -49.3 |
| අනෙකුත් | 10.0 | 6.6 | 4.5 | -2.1 |
| අනෙකුත් | 2.0 | 1.3 | 0.1 | -1.2 |
| **උප එකතුව** | **957.0** | **633.9** | **431.1** | **-202.8** |
| සුරාබදු දෙපාර්තමේන්තුව | | | | |
| මත්පැන්/දුම්කොළ | 160.0 | 106.2 | 89.4 | -16.8 |
| **උප එකතුව** | **160.0** | **106.2** | **89.4** | **-16.8** |
| අනෙකුත් | | | | |
| විදුලි සංදේශ බද්ද | 20.0 | 13.3 | 9.5 | -3.8 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 11.5 | 7.7 | 5.9 | -1.8 |
| **උප එකතුව** | **31.5** | **21.0** | **15.4** | **-5.6** |
| බදු නොවන ආදායම | **227.0** | **115.6** | **89.4** | **-26.2** |
| **මුළු වියදම** | **3,526.0** | **2,350.7** | **2,062.4** | **-288.3** |
| **වර්තන වියදම** | **2,466.0** | **1,644.0** | **1,801.5** | **157.5** |
| වැටුප් හා වේතන | 853.0 | 568.7 | 564.2 | **-4.5** |
| පොලී ගෙවීම | 860.0 | 573.3 | 700.5 | **127.2** |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 250.0 | 166.7 | 176.1 | **9.5** |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 94.0 | 62.7 | 66.5 | **3.8** |
| අනෙකුත් | 409.0 | 272.7 | 294.2 | **21.5** |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය | **1,060.0** | **706.7** | **260.9** | **-445.8** |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

### 1.2 රජයේ ආදායම

රජයේ සමස්ත ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 906.4 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 942.5 ක් දක්වා සියයට 4.0 කින් මධ්‍යස්ථ ලෙස වැඩි විය. රජයේ ආදායම වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, 2021 වසරේ පළමු මස අට තුළ බදු ආදායම සියයට 6.5 කින්, එනම් රු. බිලියන 51.7 කින් ඉහළ යාම වන අතර, මෙම ඉහළ යාමට:

i. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම රු. බිලියන 158.1 ක් දක්වා සියයට 16.1 කින් ද;


ii. එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 199.6 ක් දක්වා සියයට 44.8 කින් ද;

iii. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම රු. බිලියන 92.0 ක් දක්වා සියයට 28.2 කින් ද;

iv. සෙස් බදු ආදායම රු. බිලියන 51.2 ක් දක්වා සියයට 63.8 කින් ද;


v. සුරා බදු ආදායම රු. බිලියන 89.3 ක් දක්වා සියයට 23.2 කින් ද සැළකිය යුතු ලෙස වර්ධනය වීම හේතු විය.

රූපසටහන 1.1 : මුළු ආදායම් සංයුතිය 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා




*මූලාශ්‍රය* : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රූපසටහන 1.2 : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා




*මූලාශ්‍රය* : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 1.3 : රාජ්‍ය ආදායම් කාර්ය සාධනයේ සංක්ෂිප්තය

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. | | |
|---|---|---|---|
| | **2020** | **2021(අ)** | වෙනස (%) |
| බදු ආදායම | **801,340** | **853,063** | **6.5** |
| ආදායම් බදු | **167,440** | **175,157** | **4.6** |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | **223,200** | **268,698** | **20.4** |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 87,148 | 119,374 | 37.0 |
| නිෂ්පාදන බද්ද | 134,297 | 149,056 | 11.0 |
| ආනයන මත පදනම් වූ බදු | **362,610** | **371,259** | **2.4** |
| රේගු ආනයන බද්ද | 73,171 | 60,892 | -16.8 |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 50,644 | 80,179 | 58.3 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 71,769 | 92,033 | 28.2 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 55,141 | 37,835 | -31.4 |
| නිෂ්පාදන බද්ද | 80,486 | 49,071 | -39.0 |
| සෙස් බද්ද | 31,286 | 51,234 | 63.8 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | **48,090** | **37,949** | **-21.1** |
| බදුනොවන ආදායම | **105,020** | **89,428** | **-14.8** |
| මුළු බදු ආදායම | **906,359** | **942,491** | **4.0** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

එය 2021 වසරේ ඇස්තමේන්තුගත මුළු රාජ්‍ය ආදායම වන රු. බිලියන 1,951 න් සියයට 48.3 ක් ළඟා කර ගැනීමකි.

කෙසේ වුවද, 2021 වසරේ පළමු මාස අට තුළ බදු නොවන ආදායම රු. බිලියන 89.4 දක්වා සියයට 14.8 කින් පහත වැටුණි. 2021 වසරේ පළමු මාස අට තුළ කුලී ලැබීම් රු. බිලියන 3.0 ක් දක්වා සියයට 69.6 කින් ද, දඩ ගාස්තු හා අයකිරීම් රු. බිලියන 15.9 ක් දක්වා සියයට 53.7 කින් ද, මහ බැංකු ලාභ පැවරුම් රු. බිලියන 15.0 ක් දක්වා සියයට 37.5 කින් සහ පොලී ආදායම රු. බිලියන 3.8 දක්වා සියයට 19.0 කින් අඩු වීම මෙලෙස ආදායම් පහත වැටීමට හේතු විය. එසේ වුවද, 2021 වසරේ පළමු මාස අට තුළ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද ආදායම රු. බිලියන 22.6 දක්වා සියයට 8.9 කින් ඉහළ ගිය අතර, රජය සතු ව්‍යවසායයන්හි ලාභ සහ ලාභාංශ වලින් ලද ආදායම රු. බිලියන 14.2 දක්වා සියයට 81.6 කින් ඉහළ යන ලදී. බදු නොවන ආදායම සඳහා 2021 වසරේ වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 227.0 න් සියයට 39.4 ක් ලඟා කර ගත හැකි විය.

### ආදායම් බද්ද

සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු සහ පොලී මත වූ බදු වලින් සමන්විත වන ආදායම් බදු වලින් ලද සමස්ත ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 167.4 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 175.2 දක්වා සියයට 4.6 කින් වැඩි විය. 2021 වසරේ පළමු මාස අට තුළ ආර්ථික කටයුතු සීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම රු. බිලියන 158.3 දක්වා සියයට 16.1 කින් වැඩි විය. එමෙන්ම, 2020 වසරේ මුල් මාස අට තුළ දී ප්‍රාග්ධන ඉපැයීම් බද්දෙන් ලැබූ රු. මිලියන 144.0 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. මිලියන 239 දක්වා සියයට 66.6 කින් වර්ධනය විය.

කෙසේ වුවද, 2021 පළමු මාස අට තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 9.4 දක්වා සියයට 5.0 කින් අඩු වී ඇති අතර, පොලිය මත රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම ද රු. බිලියන 6.8 දක්වා සියයට 8.0 කින් අඩු වී ඇත. 2020 ජනවාරි මස 01 වන දින සිට අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හා පොලී මත රඳවා ගැනීමේ බද්ද වාසික තැනැත්තන්ට අනිවාර්යය නොවේ.

### එකතු කළ අගය මත බද්ද

වසංගත තත්ත්වය මනා ලෙස කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයන සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ඉක්මණින් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2020 වර්ෂයේ පළමු මාස අට තුළ රු. බිලියන 137.8 ක් වූ එකතු කළ අගය මත බදු ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 199.6 ක් දක්වා සියයට 44.8 කින් වර්ධනය වී ඇත. එම හේතුවෙන්, 2021 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 64.4 ක් සාක්ෂාත් කර ගනිමින් මෙම කාල සීමාව තුළ රජයේ බදු ආදායමට වැඩිම දායකත්වය ලබා දී ඇත්තේ එකතු කළ අගය මත බදු ආදායමයි. ආනයන සඳහා එකතු කළ අගය මත බදු ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ ලත් රු. බිලියන 50.6 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 80.2 දක්වා සියයට 58.3 කින් වර්ධනය වීම මෙයට මූලික වශයෙන් හේතු විය. 2021 වසරේ පළමු මාස අට තුළ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා එකතු කළ අගය මත බදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී එකතු වූ රු. බිලියන 87.1 සිට රු. බිලියන 119.4 ක් දක්වා සියයට 37.0 කින් වර්ධනය විය.

**වගුව 1.4 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජන. - අගෝ. 2020 | 2021[අ] | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 87,394 | 119,379 | 36.6 |
| ආනයන | 51,626 | 80,199 | 55.3 |
| **දළ ආදායම** | **139,019** | **199,577** | **43.6** |
| ආපසු ගෙවුම් | 1,226 | 24 | - |
| **ශුද්ධ ආදායම** | **137,793** | **199,553** | **44.8** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.88 | 0.01 | |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

### නිෂ්පාදන/සුරා බද්ද

2021 වසරේ පළමු මාස අට තුළ දී නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 214.8 ට සාපේක්ෂව රු. බිලියන 198.1 ක් දක්වා සියයට 7.8 කින් පහළ ගොස් ඇති අතර, මෝටර් වාහන, දුම්වැටි හා ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම අඩුවීම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලය තුළ දී නිෂ්පාදන බදු ආදායම සමස්ත බදු ආදායමෙන් සියයට 23.2 ක් වන අතර, එය 2021 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 41.7 ක ළඟා කර ගැනීමකි.

**වගුව 1.5 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය**


රු.මිලියන

| බදු ආදායම | ජන. - අගෝ. | | |
|---|---|---|---|
| | **2020** | **2021[අ]** | **වර්ධනය (%)** |
| මත්පැන් | 72,503 | 89,342 | 23.2 |
| දුම්වැටි/දුම්කොළ | 58,949 | 55,196 | -6.4 |
| මෝටර් වාහන | 43,151 | 11,585 | -73.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 37,335 | 37,486 | 0.4 |
| අනෙකුත් | 2,846 | 4,517 | 58.7 |
| **එකතුව** | **214,783** | **198,126** | **-7.8** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

**රූපසටහන 1.3 : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය 2021 ජනවාරි සිට අගෝස්තු**




*මූලාශ්‍රය* : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2021 වසරේ පළමු මාස අට තුළ එකතු වූ සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාල පරිච්ඡේදයේ ලැබූ රු. බිලියන 72.5 ක ආදායමට සාපේක්ෂව රු. බිලියන 89.3 දක්වා සියයට 23.2 කින් වැඩි විය. උත්සව සමය තුළ සංචරණ සීමා ලිහිල් කිරීම හා ඉල්ලුම අධික වීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2021 වසරේ පළමු මාස අට තුළ සැර මත්පැන් වලින් ලද සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාල පරිච්ඡේදයේ රැස් කළ රු. බිලියන 51.6 ක ආදායම හා සැසඳීමේ දී රු. බිලියන 62.2 ක් දක්වා සියයට 20.6 කින් වර්ධනය විය. ඒ හා සමානව, 2021 වසරේ පළමු මාස අට තුළ ධාන්‍ය මත්පැන් වලින් ලද සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ රැස් කළ රු. බිලියන 20.3 ක ආදායම හා සැසඳීමේ දී රු. බිලියන 25.9 ක් දක්වා සියයට 27.4 කින් වර්ධනය විය.

2021 වසරේ පළමු මාස අට තුළ මෝටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම 2020 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 43.2 ට සාපේක්ෂව රු. බිලියන 11.6 ක් දක්වා සියයට 73.2 කින් සැලකිය යුතු ලෙස අඩු විය. මෝටර් වාහන ආනයන සීමා පැනවීම සමඟින් මෝටර් වාහන ආනයනය සියයට 72.1 කින් අඩු වීම මෙම ආදායම් අඩු වීමට ප්‍රධාන හේතුව විය.

දුම්වැටි මත නිෂ්පාදන බදු ආදායම 2021 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 55.2 ක් වූ අතර, එය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 58.9 ක ආදායම සමඟ සැසඳීමේ දී සියයට 6.4 ක අඩු වීමකි. කෙසේ වුවද, දුම් පානය කරන්නන් මිල අඩු කාණ්ඩවලට යොමු වීම හේතුවෙන්, 2021 වසරේ පළමු මාස අට තුළ දී දුම්වැටි අලෙවිය 2020 වසරේ සමාන කාල පරිච්ඡේදයේ වූ දුම්වැටි මිලියන 1,469 ට සාපේක්ෂව, දුම්වැටි මිලියන 1,521 දක්වා සියයට 3.5 කින් වර්ධනය වී ඇත.

මේ අතර, 2021 වසරේ පළමු මාස අට තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම, 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 37.3 ට සාපේක්ෂව රු. බිලියන 37.5 ක් දක්වා සියයට 0.4 කින් ආන්තිකව වැඩි විය. කෙසේ වුවද, පැණි රස අඩංගු බීම වර්ග, පාම් තෙල්, මේද අම්ල සහ ශීතකරණ ඇතුළුව අනෙකුත් භාණ්ඩ මත නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2021 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 4.5 ක් වූ අතර එය 2020 වසරේ වූ රු. බිලියන 2.8 ට සාපේක්ෂව සියයට 58.7 ක සැළකිය යුතු වර්ධනයකි.

වගුව 1.6 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම

| අයිතමය | ආනයන ජන. - අගෝ. | | | | නව ලියාපදිංචි කිරීම ජන. - අගෝ. | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | (සංඛ්‍යාව) වෙනස | % | 2020 | 2021 | (සංඛ්‍යාව) වෙනස | % |
| මෝටර් රථ | 9,684 | 72 | -9,612 | -99 | 19,007 | 2,626 | -16,381 | -86 |
| බස් රථ | 215 | 4 | -211 | -98 | 743 | 246 | -497 | -67 |
| ත්‍රීරෝද රථ | 4,774 | 2,002 | -2,772 | -58 | 6,610 | 2,062 | -4,548 | -69 |
| යතුරු පැදි | 70,181 | 1,110 | -69,071 | -98 | 135,270 | 5,662 | -129,608 | -96 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 5,827 | 1,744 | -4,083 | -70 | 2,650 | 2,737 | 87 | 3 |
| ඉඩම් වාහන | 1,268 | 12,877 | 11,609 | 916 | 4,595 | 8,846 | 4,251 | 93 |
| අනෙකුත් (ආ) | 7,088 | 9,144 | 2,056 | 29 | 9,054 | 600 | -8,454 | -93 |
| **එකතුව** | **99,037** | **26,953** | **-72,084** | **-73** | **177,929** | **22,779** | **-155,150** | **-87** |

මූලාශ්‍ර : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂ අරමුණු සහිත වාහන
(ආ) ද්විත්ව කාර්ය වාහන ඇතුලත් වේ.

**රේගු ආනයන බද්ද**

රේගු ආනයන බද්දෙන් උපයාගත් ආදායම 2020 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 73.2 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 60.9 ක් දක්වා සියයට 16.8 කින් අඩු විය. 2021 අයවැයට අනුකූලව ක්‍රියාත්මක කරන ලද තීරුබදු ව්‍යුහය සංශෝධනය කිරීම, පෙට්‍රල්, ඩීසල්, තිරිඟු ධාන්‍ය සහ කිරිපිටි ආනයනය මත වන සාමාන්‍ය තීරු බදු සහන සහ නිදහස් කිරීම් ලබාදීම සහ ව්‍යාපෘති ආශ්‍රිත අයිතම ආනයනය රේගු ආනයන බද්දෙන් නිදහස් කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

වගුව 1.7 : නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්

| නිදහස් වෙළෙඳ ගිවිසුම | ජන. - සැප්. 2021 තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛතව | ආනයන වටිනාකම (CIF / රු. මිලියන) | අපනයන වටිනාකම (FOB/ රු. මිලියන) |
|---|---|---|---|
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 5,145 | 31,257 | 76,417 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 5,987 | 1,995 | 10,900 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | 6,027 | 1,341 | 14,124 |
| ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | 781 | 4,592 | 39,350 |
| **එකතුව** | **17,940** | **39,185** | **140,791** |

මූලාශ්‍රය : වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද**

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද අදායම 2021 පළමු මාස අට තුළ රු. බිලියන 37.8 ක් දක්වා සියයට 31.4 කින් සැළකිය යුතු ලෙස අඩු වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පළතුරු, ටින් මාළු, කරවල, උම්බලකඩ, මුං ඇට, කඩල සහ කුරක්කන් සඳහා ලබා දී ඇති තීරුබදු දිගුවත්, සීනි, ලොකු ළූණු, පොල් තෙල් සහ පරිප්පු වැනි භාණ්ඩ සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත දැමීමත් ය.

**අනෙකුත් බදු**

*වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද:* වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ලද සමස්ත ආදායම 2020 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 71.8 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 92.0 දක්වා සියයට 28.2 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ඛනිජ තෙල් නිෂ්පාදන, සිමෙන්ති, වාහනේ, අමුද්‍රව්‍ය සහ අනෙකුත් පරිභෝජන භාණ්ඩවල ගෝලීය මිල ගණන් ඉහළ

යාමට සමාගාමීව ආනයනය කරන ලද වටිනාකම හා ප්‍රමාණය ද ඉහළ යාමයි.

***විදුලි සංදේශ බද්ද:*** දේශීය දුරකතන ඇමතුම් කාලය ඉහළයාම හේතුවෙන්, විදුලි සංදේශ බද්දෙන් ඉපැයූ සමස්ත ආදායම 2020 පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 8.8 සිට රු. බිලියන 9.5 ක් දක්වා සියයට 8.8 කින් ඉහළ යන ලදි.

***සෙස් බද්ද:*** 2021 අයවැය මගින් සෙස් බදු අනුපාත සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස, සෙස් බද්දෙන් ලද ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 31.3 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 51.2 දක්වා සියයට 63.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ආනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 30.1 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 49.5 දක්වා සියයට 64.6 කින් වර්ධනය විය. අපනයන මත සෙස් බදු ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 1.2 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1.8 දක්වා සියයට 43.6 කින් වර්ධනය විය.

**වගුව 1.8 : ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම**

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2020 | ජන. - අගෝ. 2021 |
|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **1,224** | **1,757** |
| තේ - (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 272 | 340 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 4 | 6 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරී පනත යටතේ | 129 | 122 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 819 | 1,289 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **30,062** | **49,477** |
| **එකතුව** | **31,286** | **51,234** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**වගුව 1.9 : මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තුවල කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2020 ජන. - අගෝ. | | | 2021 ජන. - අගෝ. | | | % වෙනස 2020/2021 ජන. - අගෝ. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව |
| මුද්දර බදු* | – | 4,374 | **4,374** | – | 3,145 | **3,145** | – | -28.1 | -28.1 |
| මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු** | 372 | 869 | **1,241** | 168 | 392 | **224** | -54.9 | -54.9 | -82.0 |
| **එකතුව** | **372** | **5,243** | **5,615** | **168** | **3,537** | **3,369** | -54.9 | -32.5 | -40.0 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
*2011 වසරේ සිට මුද්දර බදු ආදායම මඟින් ඉපයූ සම්පූර්ණ ආදායම මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත මාරු කරනු ලැබේ.
**මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් මධ්‍යම රජය විසින් ඉපයූ ආදායමෙන් පළාත් සභාවලට මාරු කරන ලද සියයට 70ට අදාල සංඛ්‍යා දැක්වේ.

**බදු නොවන ආදායම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම්, විකුණුම් සහ ගාස්තු, පොලී ආදායම සහ බදු කුලී ආදායමෙන් ලැබූ ආදායම් අඩු වීම හේතුවෙන් බදු නොවන ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 105.0 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 89.4 දක්වා සියයට 14.8 කින් පහත වැටී ඇත. බදු කුලී ආදායමෙන් ලැබූ ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 9.8 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3.0 දක්වා සියයට 69.6 කින් පහත වැටී ඇත. මහ බැංකුවේ ලාභ පැවරුම් 2020 පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 24.0 ක සිට රු. බිලියන 15.0 දක්වා සියයට 37.5 කින් පහත වැටුණි. මේ අතර, දඩ, අයකිරීම් හා ගාස්තු සියයට 53.7 කින් රු. බිලියන 15.9 ක් දක්වා ද, පොලී ආදායම සියයට 19.0 කින් රු. බිලියන 3.8 දක්වා ද පහත වැටුණි.

කෙසේ වුවද, රාජ්‍ය ව්‍යවසායයන්හි ලාභ හා ලාභාංශ පැවරුම් වලින් එකතු වූ ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 7.8 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 14.2 ක් දක්වා සියයට 81.6 කින් සැලකිය යුතු ලෙස වැඩි වීමට මූලික වශයෙන් මූල්‍ය අංශයේ ලාභ සහ ලාභාංශවල සැළකිය යුතු ඉහළ යාම හේතු විය. තවද, සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබූ ආදායම ද 2021 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 22.6 දක්වා සියයට 8.9 කින් වැඩි විය.

වගුව 1.10 : **රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය (ජනවාරි - අගෝස්තු 2021)**

| අයිතමය | රු. බිලියන | | | හේතු |
|---|---|---|---|---|
| | **2020** (ජන.- අගෝ.) | **2021** ඇස්තමේන්තුව | **2021** (ජන.- අගෝ.) (තාවකාලික) | |
| ආදායම් බදු | 167.4 | 371.0 | 175.2 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 47.2 ක් ලඟාකරගනිමින්, 2020 වර්ෂයේ අදාල කාලය හා සැසඳීමේදී, 2021 වර්ෂයේ මුල් මාස අට තුළදී ආදායම් බදු ආදායම රු. බිලියන 175.2 දක්වා වර්ධනය වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ හොඳින් කළමනාකරණය වූ වසංගතය සමඟ ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත්වීමයි. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු රු. බිලියන. 158.3 දක්වා වැඩි වී ඇත. එමෙන්ම ප්‍රාග්ධන ලාභ බද්ද රු. බිලියන 239 ක් දක්වා වැඩි වී ඇත. කෙසේ වුවද, උපයන විට ගෙවීම් හා පොලිය මත රඳවාගැනීමේ බද්ද යටතේ රැස්කල ආදායම් පිළිවෙලින් රු. බිලියන 9.4 කින් හා රු. බිලියන 6.8 දක්වා පහත වැටී ඇත. |
| එකතු කළ අගය මත බදු | 137.8 | 310.0 | 199.6 | 2021 වර්ෂයේ මුල් මාස අට තුළ දී එකතුකළ අගය මත බදු ආදායම රු. බිලියන 199.6 ක් දක්වා 2021 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 64.4 ක ලඟාකර ගනිමින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. දේශීය වශයෙන් වූ වෙළඳ ක්‍රියාකාරකම් හා ආනයන ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. දේශීය ක්‍රියාකාරකම් මත සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මත අය කරනු ලබන එකතු කළ අගය මත බද්දෙන් ආදායම් පිළිවෙළින් රු. බිලියන 119.4 ක් දක්වා සියයට 37.0 කින් සහ රු. බිලියන 80.2 ක් දක්වා සියයට 58.3 කින් ඉහළ ගොස් ඇත. |
| නිෂ්පාදන බදු | 214.8 | 475.0 | 198.1 | 2021 වර්ෂයේ මුල් මාස අට තුළ නිෂ්පාදන බදු මගින් උපයන ලද ආදායම 2021 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 41.7 ක ලඟාකර ගනිමින් රු.බිලියන 198.1 දක්වා සියයට 7.8 කින් පහත වැටී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් 2020 මාර්තු මස සිට ක්‍රියාත්මක කල මෝටර් රථවාහන ආනයනය සීමා කිරීම හේතු වී ඇත. දුම්වැටි මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 55.2 දක්වා සියයට 6.4 කින් පහළ බැස ඇත. සමාලෝචන කාලසීමාව සඳහා මුළු දුම්වැටි අලෙවිය 3.5% කින් වැඩි වී තිබියදීත්, 2020 මැද භාගයේදී හඳුන්වාදෙන ලද අඩුමිල දුම්වැටි අලෙවිය ඉහළ මට්ටමේ කාණ්ඩවල සිට අඩු මිල කාණ්ඩයකට මාරුවීම සිගරට් ආදායම් උත්පාදනයට අහිතකර ලෙස බලපෑවේය. තවද, සලකා බලනු ලබන කාලය තුළ වැඩි වූ පෙට්‍රල් හා ඩීසල් ආනයනය, ඛණිජතෙල් නිෂ්පාදන මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 37.5 දක්වා සියයට 0.4 කින් ආන්තික ලෙස ඉහළ යෑම සඳහා හේතු වී ඇත. කෙසේ වුවද, මත්පැන් මත එකතුකරනු ලබන බදු ආදායම රු. බිලියන 89.3 දක්වා සියයට 23.2 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම අනෙකුත් නිෂ්පාදන මගින් උපයන ලද ආදායම රු. බිලි. 4.5 දක්වා සියයට 58. 7 කින් වර්ධනය වෙමින් නිෂ්පාදන බදු ආදායම ශක්තිමත් කිරීම කෙරෙහි ධනාත්මකව දායක වී ඇත. |

| අයිතමය | රු. බිලියන | | | හේතු |
|---|---|---|---|---|
| | **2020** (ජන.- අගෝ.) | **2021** ඇස්තමේන්තුව | **2021** (ජන.- අගෝ.) (තාවකාලික) | |
| ආනයන බදු | 73.2 | 180.0 | 60.9 | 2021 වර්ෂයේ ඇස්තමේන්තුවෙන් සියයට 33.8 ක් ලඟාකරග නිමින් 2021 වර්ෂයේ මුල් මාස අට තුළදී ආනයන බදු මගින් උපයන ලද ආදායම රු. බිලියන 60.9 දක්වා සැලකියයුතු ලෙස පහළ බැස ඇත. මෙම මන්දගාමී කාර්යසාධනය සඳහා දේශීය වෙළඳපොළ තුල පාරිභෝගිකයින් මත ඇතිවන පීඩනය අඩුකිරීමේ අරමුණින් පෙට්‍රල් , ඩීසල් සහ කිරි පිටි ආදී තෝරාගත් භාණ්ඩ සඳහා වූ බදු අනුපාතයන් සංශෝධනය කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| වරාය හා ගුවන්-තොටුපොළ සංවර්ධන බදු | 71.8 | 170.0 | 92.0 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 54.1 ක් රැස්කරමින්, වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ආදායම රු.බිලියන 92.0 දක්වා සියයට 28.2 කින් වැඩි වී ඇත. මේ සඳහා සලකා බලනු ලබන කාලය තුළ ඇ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සහ ආනයන සියයට 30.7 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් දායක වී ඇත. |
| විශේෂ භාණ්ඩ හා සේවා බදු | 55.1 | 110.0 | 37.8 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 34.4ක් ලඟාකරමින්, පසුගිය වර්ෂයේ අදාළ කාලය හා සැසඳීමේදී 2021 වර්ෂයේ මුල් මාස අට තුළ විශේෂ භාණ්ඩ හා සේවා බද්ද මගින් උපයන ලද ආදායම රු.බිලියන 37.8 දක්වා සියයට 31.4 කින් සැලකියයුතු ලෙස පහත බැස ඇත. සීනි, ලොකු ළූණු, පොල්තෙල් සහ පරිප්පු වැනි තෝරාගත් භාණ්ඩවල සිල්ලර මිල ඉහළයාම වැළැක්වීම සඳහා වූ බදු අනුපාතයන් සංශෝධනය කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. |
| වෙනත් බදු | 81.2 | 108.0 | 89.5 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 82.8 ක් රැස්කරමින්, 2021 වර්ෂයේ මුල් මාස අට තුළ අනෙකුත් බදු මගින් ලද ආදායම රු.බිලියන 89.5 ක් දක්වා සියයට 10.1 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. 2021 වර්ෂයේ අයවැයට සමගාමීව සෙස් බදු අනුපාතයන් ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් ලෙස රු.බිලියන 51.2 ක් දක්වා සියයට 63.8 කින් ඉහළගිය සෙස් බදු ආදායම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. දේශීය වශයෙන් ලැබෙන හා ලබා ගන්නා දුරකථන ඇමතුම් ප්‍රමාණය ඉහළයාම සහ මාර්ගගත අධ්‍යාපනික කටයුතු හා ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා දත්ත ඉල්ලුම ඉහළයාම හේතුවෙන් විදුලි සංදේශ බද්ද රු.බිලියන 9.5 දක්වා සියයට 8.8 කින් ඉහළ ගොස් ඇත. |
| බදු නොවන ආදායම | 105.0 | 227.0 | 89.4 | 2021 වර්ෂයේ මුල් මාස අට තුළ බදු නොවන ආදායම 2021 වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමින් සියයට 39.4 ක් ලඟාකර ගනිමින් රු. බිලියන 89.4 දක්වා සියයට 14.8 කින් සැලකිය යුතු ලෙස පහළ බැස ඇත. කොවිඩ් -19 වසංගතයේ බලපෑම හේතුවෙන් කුලී සහ පොලී ආදායම, මහ බැංකු ලාභ, ගාස්තු හා අයකිරීම් අඩුවීම මෙයට හේතුවිය. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසාය වලින් ලැබෙන ලාභ සහ ලාභාංශ වලින් වැඩි වූ ආදායම් ලැබීම් රු. බිලියන 14.2, සමාජ ආරක්ෂණ දායකත්වය රු. බිලියන 22.6 ක් සහ අනෙකුත් බදු නොවන ආදායම රු.බිලි. 15.0 ක් බදු නොවන ආදායමට ධනාත්මක ලෙස දායක විය. |
| එකතුව | **906.4** | **1,951.0** | **942.5** | |

මූලාශ්‍රයඃ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සිදුකරන ලද සංශෝධන** | |
| **2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| **ආදායම් බදු නිදහස් කිරීම්** | |
| 2021.04.01 | – කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබාදී ඇති ශ්‍රී ලංකා දේපළ ආයෝජන භාරයකට යම් තැනැත්තෙකු ඉඩම් හෝ ගොඩනැගිලි විකිණීම, හුවමාරු කිරීම හෝ පැවරීම මගින් උපලබ්ධිවන ලැබීම්.<br><br>– ඕනෑම ශ්‍රී ලංකා දේපළ ආයෝජන භාරයකින්, කොටස් කරුවෙකු විසින් ලාභාංශ සහ ඒකක උපලබ්ධිවීම මත ලාභ ලැබීම් හෝ ව්‍යාපාරයක හෝ ආයෝජනයක ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීම මඟින් වන ලැබීම්.<br><br>– ඕනෑම සුභසාධක සංගමයක් (සාමාජිකයින්ගේ ප්‍රවර්ධනය කරනු ලබන යහසාධක අරමුදල් ඇතුළුව) මගින් උපයාගන්නා ලද හෝ උපචිත වන පොළිය.<br><br>– අදාළ තක්සේරු වර්ෂය සඳහා එහි ආනයන වියදම ආවරණය කර ගැනීම සඳහා පවත්වා ගෙන යාම සඳහා විවෘත කළ සහ ඕනෑම දේශීය බැංකුවක විදේශ මුදලින් පවත්වා ගෙන යන තැන්පතු මගින් බහුජාතික සමාගමක් විසින් උපයනු ලබන හෝ උපචිත වන පොළිය.<br><br>– ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර සුරැකුම්පත් මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කර ඇති ඕනෑම සමෘද්ධි ප්‍රජා-පාදක බැංකුවක් විසින් උපයනු ලබන හෝ උපචිත වන පොළිය හෝ වට්ටම්.<br><br>– 2021 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකා රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ඇ. ඩො. මිලියන 100 කට නොඅඩු සමුච්චිත ආයෝජනයක් සිදුකළ වාණිජ බැංකුවකට හෝ බලයලත් ගනුදෙනුකරුවෙකුට එම බැඳුම්කර උපලබ්ධිවීම හෝ උපචිත වීම මඟින් වන ලැබීම්.<br><br>– විදේශ මුදලින් උපයනු ලබන ලැබීම් හා ලාභ ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා ප්‍රේෂණය වන අවස්ථාවක දී, රත්‍රන්, මැණික්, හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමේ ඕනෑම ව්‍යාපාරයක් මගින් හෝ ශ්‍රී ලංකාවට මැණික් ගෙන්වා කපා ඔප මට්ටම් කිරීමෙන් පසු එසේ කපා ඔප මට්ටම් කළ මැණික් අපනයනය කිරීමේ ව්‍යාපාරයන්වල නියැලීම මඟින් ඕනෑම තැනැත්තෙකු ඉපයූ හෝ උපයන ලද ලැබීම්.<br><br>– TVET සංකල්පය (තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව) යටතේ ප්‍රමිතිගත සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය වන ඕනෑම තෘතීය අධ්‍යාපන ආයතනයක්, එකී තක්සේරු වර්ෂයට පෙර තක්සේරු වර්ෂය හා සාපේක්ෂව සිසුන් බඳවාගැනීම දෙගුණයක් කර ඇත්නම්, එකී ආයතනය විසින් උපයන ලද හෝ ඉපයූ ලැබීම් සහ ලාභ. අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා මෙම නිදහස් කිරීම අදාළ වේ.<br><br>– ශ්‍රී ලංකාවේ ස්ථාවර ආයතනයක් හරහා ශ්‍රී ලංකාවේ ලාභ සහ ආදායම උපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සහ තම ව්‍යාපාරය පුළුල් කිරීමට හෝ කොටස් හෝ කොළඹ කොටස් වෙළඳපොළෙන් යම් සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ යම් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීමට, එලෙස උපයා ගත් ලාභ අවම වශයෙන් වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සිදු කළ නිර්වාසික සමාගමක් විසින් ප්‍රේෂණ බදු වලින් (ප්‍රේෂණ ලාභ මත සියයට 14 ක අනුප්‍රමාණයෙන්) නිදහස් කෙරේ. මෙම බදු නිදහස් කිරීම වසර තුනක කාල පරිච්ඡේදයක් සඳහා අදාළ වේ. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **බදු විරාම** | |
| 2021.04.01 | පහත සඳහන් නව ව්‍යාපාරවලින් උපයා ගන්නා ලද හෝ උපචිත වන ලැබීම් හා ලාභ (ප්‍රාග්ධන ලාභ හැර) සඳහා බදු විරාම ලබා දී ඇත. වසර දෙකක ක්‍රියාත්මක කිරීමේ කාලයක් සලකා බලනු ලැබේ.<br>– ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිතා කරන ලද ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපිත වෙනම තෝරාගත් වැඩබිමක ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය විකුණනු ලබන ව්‍යාපාරයක් සඳහා දස වර්ෂයකට බදු නිදහස් කිරීම.<br>– TVET සංකල්පය යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරන ඕනෑම ආයතනයක් මගින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව නිම කිරීමෙන් පසු, 2021 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසු යම් පුද්ගලයෙකු විසින් ආරම්භ කරන ලද ඕනෑම ව්‍යාපාරයක් පස්-අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>– වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද බෝට්ටු හෝ නැව් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයකින් එවැනි බෝට්ටු හෝ නැව් සැපයීම මගින් ලැබූ හෝ උපයන ලද ඕනෑම ලැබීම් හෝ ලාභ සඳහා සත්-අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>– මෙගා වොට් සියයකට නොඅඩු ධාරිතාවයකින් බලශක්තිය නිපදවීමට හැකි ලෙස ඕනෑම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සමඟින් ස්ථාපනය කර ඇති සූර්ය හෝ සුළං බලශක්ති ව්‍යාපෘතියක්, එකී බලශක්තිය ජාතික විදුලිබල පද්ධතියට සැපයෙන අවස්ථාවකදී සත්-අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>– 2021 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසුව ඕනෑම වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමිකයන් සහ අමුද්‍රව්‍ය භාවිතා කරමින් සන්නිවේදන කුළුණු සහ ඒ හා සම්බන්ධ උපකරණ ඉදිකරන සහ සවිකරන හෝ එවැනි ඉදිකිරීම් සහ සවිකිරීම් සඳහා අවැසි තාක්ෂණ සේවා සපයන ඕනෑම ව්‍යාපාරයක් සඳහා පස්-අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම. |
| **සහනදායී බදු අනුපාත** | |
| 2021.04.01 | – මැණික් හා ස්වර්ණාභරණ විකිණීම මත පුද්ගලයන් සඳහා සියයට 14 ක උපරිම බදු අනුපාතය සහ සමාගම් සඳහා සියයට 14 ක සමවර්ත බදු අනුපාතය අදාළ වේ.<br>– පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතා කර ජනනය කරන ලද විදුලිය ජාතික පද්ධතියට සැපයීමෙන් ලබන ආදායම මත පුද්ගලයන් සඳහා සියයට 14 ක උපරිම බදු අනුපාතය සහ සමාගම් සඳහා සියයට 14 ක සමවර්ත බදු අනුපාතය අදාළ වේ.<br>– 2021 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසුව, එනමුදු 2021 දෙසැම්බර් 31 වන දිනට පෙර එහි කොටස්, කොළඹ කොටස් වෙළෙඳපොලෙහි ලැයිස්තුගත කර ඇති ඕනෑම සමාගමක් 2022 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ තුනක් (2022/2023 සිට 2024/2025 දක්වා) සඳහා සියයට 14 ක බදු අනුපාතය අදාළ වේ. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග | |
|---|---|---|
| **ආදායම් බදු බැඳියාව අඩු කිරීම** | | |
| | **ආදායම** | **බදු අඩු කිරීම** |
| 2021.04.01 | 2021 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසුව, එනමුදු 2021 දෙසැම්බර් 31 වන දිනට පෙර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදී ඇති, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ස්වකීය කොටස් ලැයිස්තුගත කර ඇති ඕනෑම සමාගමක් විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් ද ඇතුළුව නමුත් ආයෝජන වත්කම් උපලබ්ධි වීම මගින් වන ලැබීම් මත හැර) 2021/2022 තක්සේරු වර්ෂය සඳහා | 50% |
| | බහු ජාතික සමාගමක් විසින් ලාභාංශ ලැබීම් හා ලාභ මත ගෙවිය යුතු ආදායම් බදු | |
| | (i) 2020/2021 වර්ෂය හා සැසඳීමේ දී 2021/2022 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 30% කින් වැඩි වී ඇත්නම් | 25% |
| | (ii) 2021/2022 වර්ෂය හා සැසඳීමේ දී 2022/2023 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 50% කින් වැඩි වී ඇත්නම් | 50% |
| | (iii) 2020/2021 වර්ෂය හා සැසඳීමේ දී 2023/2024 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 50% කින් වැඩි වී ඇත්නම් හෝ ඉහත (ii) හි සඳහන් තත්ත්වයම 2023/2024 සඳහා ද පවත්වාගෙන ගොස් ඇත්නම් | 50% |
| | යම් තැනැත්තෙකු විසින් කෘෂි වගා කටයුතුවලින් ලබාගත් කෘෂි නිෂ්පාදන, එම පුද්ගලයාම විසින් පිරිසැකසුම් හෝ නිෂ්පාදන කටයුත්තක් සඳහා යොදා ගනු ලබන්නේ නම්, ඒ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීම සඳහා ගෙවිය යුතු බදු කොටස | 25% |
| **තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී ඉඩදෙනු ලබන අඩුකිරීම්** | | |
| 2021.04.01 | - ප්‍රාග්ධන ස්වභාවය ද, එසේ නොවේද යන්න නොසළකා වෙළෙඳපොළ පර්යේෂණ, අලෙවිකරණය, වෙළෙඳ ප්‍රචාරණය සහ සන්නිවේදන වැඩසටහන් සැලසුම් කිරීම සහ නිෂ්පාදනය, ප්‍රධාන පෙළේ මාධ්‍යවල හෝ සමාජ මාධ්‍යවල ප්‍රචාරණය, නිෂ්පාදන දියත් කිරීම් හෝ ප්‍රචාරණ වැඩසටහන් සක්‍රීය කිරීම සහ විකුණුම් ස්ථාන ද්‍රව්‍ය සංවර්ධන හා මුද්‍රණය සඳහා වන අලෙවිකරණ හා සන්නිවේදන වියදම්, ව්‍යාපාරයේ ලැබීම් හා ලාභ ගණනය කිරීමේ දී අඩු කිරීමට ඉඩලබා දී ඇත.<br>– වෘත්තීය පුහුණුවකින් පසුව තරුණ පුරුෂයෙකු හෝ කාන්තාවක් විසින් ආරම්භ කරන (පස් අවුරුදු බදු විරාම සඳහා සුදුසුකම් ලබන) ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය සඳහා මූල්‍ය ආයතන විසින් සපයා ඇති ණය අරමුදල්වල පිරිවැය එම මූල්‍ය ආයතන සඳහා අඩු කල හැකි වියදමක් ලෙස සැලකේ. | |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **නව සුදුසුකම් ලබන ගෙවීම්** | |
| 2021.04.01 | – වාසික පුද්ගලයෙකු විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා සනාථ කිරීම පරිදි සමෘද්ධි ප්‍රතිලාභ පවුලක කාන්තාවකට අලෙවි සැලක් ස්ථාපනය කිරීමට මුදල් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද දායකත්වය.<br>– එක් එක් අවස්ථාව මත පදනම් වූ සියළු කරුණු සැලකිල්ලට ගැනීමෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සනාථ කර ඇති පරිදි, ඕනෑම මූල්‍ය ආයතනයක් විසින් වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක් අත්පත් කර ගැනීමට හෝ එකතු කර ගැනීමට පිරිවැයක් ලෙස දරන ලද යම් වියදමක් සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සැළකේ. අඩු කළ හැකි මුළු වියදම තක්සේරු වර්ෂ තුනක කාලයක් තුළ සමාන ප්‍රමාණයන්ට බෙදිය යුතු අතර, එකී වියදම දරන ලද තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන එවැනි එක් එක් තක්සේරු වර්ෂයන්හි දී එකී මූල්‍ය ආයතනයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ යුතුය.<br>– රු. මිලියන 5 කට නොඅඩු පිරිවැයක් දරමින් (චිත්‍රපටය ප්‍රවර්ධනය කිරීමේ වියදම ද ඇතුළුව) චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමේ දී, හෝ රු. මිලියන 25 කට නොවැඩි පිරිවැයක් දරමින් චිත්‍රපට ශාලාවක් ඉදි කිරීම හා එයට උපකරණ මිලදී ගැනීම හෝ රු. මිලියන 10 කට නොවැඩි පිරිවැයක් දරමින් චිත්‍රපට ශාලාවක් නවීකරණය කිරීමේ දී දරනු ලබන වියදම. එසේ අඩු කිරීම, වර්ෂයේ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට සීමා වන අතර, ඊළඟ වසර දක්වා ඉදිරියට ගෙන යා හැකිය. |
| **"නිශ්චිත ව්‍යාපාර" ලෙස සැලකීම** | |
| 2021.04.01 | සියයට 14 ක බදු අනුපාතය අදාළ වන නිශ්චිත ව්‍යාපාර යන්නට පහත සඳහන් ව්‍යාපාර ඇතුළත් වේ.<br>– නිශ්චිතව දක්වන වරාය පරිශ්‍රයක් තුළ, දේශීය තෙල් සැපයුම්කරුවන් වෙත සමුද්‍රීය ඉන්ධන සැපයීම ද ඇතුළුව සමුද්‍රීය ඉන්ධන සැපයීම හා සම්බන්ධ ඉන්ධන සැපයුම් සේවා<br>– 1978 අංක 4 දරන ශ්‍රී ලංකා අයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති අපනයන අභිමුඛ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ -<br>අ) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ බදු විරාමයක් භුක්ති විඳින සමාගමක් ද ඇතුළුව, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්ව තිබෙන සහ එවැනි ගිවිසුමක ප්‍රතිපාදන යටතේ තීරු බදු රහිත පදනම යටතේ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර තිබෙන සමාගමකට හෝ<br>ආ) යම් රජයේ ආයතනයක් යටතේ තීරු බදු රහිත පදනම මත නිශ්චිත භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම්ලත් යම් තැනැත්තෙකුට 2021 අප්‍රේල් 1 දින සිට ආරම්භ වන වසර 3 ක කාල පරිච්ඡේදයක් තුළ ආනයන ප්‍රතිස්ථාපන ලෙස ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර ඇති ප්‍රමාණයක් දක්වා,<br>විකිණීම. |
| **බදු දිරිගැන්වීම් සහ තාවකාලික සහන වල වෙනස්වීම්** | |
| 2021.04.01 | – 2021 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තක්සේරු වර්ෂ තුනක් සඳහා රු. මිලියන 500 ක උපරිම සීමාවකට යටත්ව සියයට 100 ක අමතර අඩු කිරීමකට ඉඩ ලබා දී ඇත. කෙසේ වුවද, එම වියදම් සියයට 65 ක දේශීයව අගය එකතු කිරීමක් සහිතව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් 2021/2022 සිට 2023/2024 දක්වා වර්ෂ 3ක් තුළ දී විය යුතුය.<br>– දේශීය ආදායම් පනතේ 6 වන උපලේඛනය යටතේ අමතර ප්‍රාග්ධන දීමනා සඳහා ලබා දෙන ලද කාලය තවත් වසර තුනකින් දීර්ඝ කිරීම.<br>– පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා සියයට 100 ක් සමාන වන අතිරේක අඩු කිරීමක් 2021/2022 සිට 2022/2023 දක්වා තක්සේරු වර්ෂ තුළ අඩු කළ හැක. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **වාසික පුද්ගලයින් සඳහා බදු සහන** | |
| 2021.04.01 | – වර්ෂයක් සඳහා රු. 600,000 උපරිම අඩු කිරීමක් දක්වා සූර්ය පලක සඳහා ආයෝජනය කරන පුද්ගලයින්ට සහනයක් ලබා දී ඇත. ලබාදෙනු ලබන සහනය බැංකු ණයක් හරහා මුදල් යෙදවීමෙන් ආයෝජනය කළ හැකි අතර, එවැනි අවස්ථාවලදී සහන කටයුතු සඳහා ණය ආපසු ගෙවීම සළකා බලනු ලබයි. |
| **බදු පරිපාලන විධිවිධාන වල වෙනස්වීම්** | |
| 2021.04.01 | – ලිත් මාසයකදී සියලුම ප්‍රාග්ධන ලාභ ගනුදෙනු සඳහා තනි වාර්තාවක් ඉදිරිපත් කිරීමට සහ උපලබ්ධි කිරීම සිදු වූ අදාළ ලිත් මාසයෙන් පසුව දින තිහක් ඇතුළත නියමිත ගෙවීමට ඉඩ දීම.<br>– තැනැත්තෙකු විසින් අදායම් වාර්තාවක් ගොනු කරන්නේ නම්, එය අදාළ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ස්වයං තක්සේරුව ලෙස සළකනු ලබන අතර, තැනැත්තෙකු විසින් ප්‍රාග්ධන ලාභ බදු ගොනු කිරීම ස්වයං තක්සේරුවක් ලෙස සළකනු නොලැබේ.<br>– බදු හා සම්බන්ධ සියළුම මූලාශ්‍ර ලියකියවිලි වල හෝ පාදකවන අනෙකුත් ලියකියවිලි වල බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) භාවිතා කිරීම අනිවාර්යය කිරීම.<br>– වාසික හෝ වාසික නොවන වග නොසලකා හැර, පරිගණක හෝ දුරකථන උපාංග භාවිතා කර රාජ්‍ය සංස්ථා ද ඇතුළුව සියලුම සීමා සහිත සමාගම් විසින් ඔවුන්ගේ බදු වාර්තා (වාර්ෂික වාර්තා ඇතුළුව) විද්‍යුත් ගොනු කිරීම (e-filing) අනිවාර්යය කිරීම. |
| 2020.04.01 | 2021.03.02 දිනැති අංක 2217/7 දරන ගැසට් නිවේදනය<br>– පැවරුම් මිල සම්බන්ධයෙන් නියෝග නිකුත් කිරීම |
| 2020.04.01 | 2021.06.29 දිනැති අංක 2234/6 දරන ගැසට් නිවේදනය<br>- ආදායම් බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණ සේවා සහ සළල සේවා නියම කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත** | |
| 2021.01.01 | 2021 අංක 9 දරන එකතු කල අගය මත (සංශෝධන) බදු පනත<br><br>– අපනයන අභිමුඛ ආයෝජන මණ්ඩල (BOI) සමාගම් විසින් ඇතැම් නිමි ඇඳුම් දේශීයව විකිණීමේදී අදාළ වන ඒකක පදනම මත එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය රු.100/- සිට 25/- දක්වා අඩුකිරීම. |
| 2021.04.01 | 2021.05.20 දිනැති අංක 2228/33 දරන ගැසට් නිවේදනය<br><br>– එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින් අපනයනයන් සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමේ අවශ්‍යතා නියම කිරීමට වාර්තා තබා ගැනීමේ නියෝග සංශෝධනය කිරීම. |
| 2021.04.01 | 2021.06.29 දිනැති අංක 2234/7 දරන ගැසට් නිවේදනය<br><br>– එකතුකල අගය මත බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණ සේවා සහ සළල සේවා නියම කිරීම. |
| **නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනත** | |
| 2021.04.05 | 2021.04.05 දිනැති අංක 2222/2 දරන ගැසට් නිවේදනය,<br><br>– ශ්‍රී ලංකා පොලිසියට ත්‍රිරෝද රථ 2,000 ක් මිලදී ගැනීම සඳහා අදාල වන බදු නිදහස් කිරීම. |
| 2021.04.06 | 2021.04.05 දිනැති අංක 2222/3 දරන ගැසට් නිවේදනය,<br><br>- වාහන නිෂ්පාදනය එකලස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව නිෂ්පාදනය කරන ලද/ එකලස් කරන ලද මෝටර් වාහන හා යතුරු පැදි සඳහා නව බදු ව්‍යුහයක් හඳුන්වා දීම. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.04.23 | 2021.04.22 දිනැති අංක 2224/24 දරන ගැසට් නිවේදනය,<br><br>- ජංගම වැඩපළ මෝටර් රථ සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම. |
| 2021.08.03 | 2021.08.03 දිනැති අංක 2239/16 දරන ගැසට් නිවේදනය,<br><br>- අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු සඳහා වතුර බවුසර් පනස් දෙකක් (52) සහ ඩබල් කැබ් රථ හැට දෙකක් (62) ආනයනය කිරීම සඳහා අදාල වන බදු ගෙවීමෙන් නිදහස් කිරීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2021.01.01 | සුරාබදු නිවේදන අංක 01/2021 (2021.01.01 දිනැති අංක 2208/34 දරන ගැසට් නිවේදනය)<br><br>– බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කරන දිනය 2021 ජූනි 30 දක්වා දීර්ඝ කිරීම. |
| 2021.01.01 | සුරාබදු නිවේදන අංක 02/2021 (2021.01.01 දිනැති අංක 2208/35 දරනගැසට් නිවේදනය)<br><br>– ර.බී.7, ර.බී.8, ර.බී.11, ර.බී.12 සහ ර.බී.22B බලපත්‍ර සඳහා 2021 වසර සඳහා වූ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තුව නිදහස් කිරීම. |
| 2021.01.08 | සුරාබදු නිවේදන අංක 03/2021 (2021.01.07 දිනැති අංක 2209/42 දරන ගැසට් නිවේදනය)<br><br>– ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් වන බද්ද රු. 50 සිට රු. 25 දක්වා අඩු කිරීම.<br>– සුරාබදු නිවේදන අංක 993 (2016.12.20 දිනැති අංක 1998/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය) මෙයින් අවලංගු වේ. |
| 2021.01.07 | සුරාබදු නිවේදන අංක 04/2021 (2021.01.07 දිනැති අංක 2209/44 දරනගැසට් නිවේදනය)<br><br>– සුරාබදු නිවේදන අංක 03/2018 දැක්වෙන රා තැබෑරුම් විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් දීර්ඝ කිරීම.<br>– සුරාබදු නිවේදන අංක 11/2018 (2020.06.13 දිනැති අංක 2075/24 දරන අති විශේෂ ගැසට් නිවේදනය) මෙයින් අවලංගු වේ. |
| 2021.01.07 | සුරාබදු නිවේදන අංක 05/2021 (2021.01.07 දිනැති අංක 2209/43 දරන ගැසට් නිවේදනය)<br><br>– රා සිල්ලරට විකුණනු ලබන සීමාව හා ප්‍රවාහනය කළහැකි ප්‍රමාණය මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි ලීටර් 1.5 සිට 3 දක්වා වැඩි කිරීම.<br>– 1985.08.14 දිනැති සුරාබදු නිවේදන අංක 745 මෙයින් අවලංගු වේ. |
| 2021.01.11 | සුරාබදු නිවේදන අංක 06/2021 (2021.01.11 දිනැති අංක 2210/2 දරන ගැසට් නිවේදනය)<br><br>– තරු 03 හා තරු 04 හෝටල් සහ තරු 05 හා ඊට ඉහල ගණයේ හෝටල්/ බුටික් හෝටල්/ බුටික් විලා පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මධ්‍යසාර භාවිතයට අය කරනු ලබන ගාස්තුව 2021 වර්ෂය සඳහා ගෙවීමෙන් නිදහස් කිරීම. |
| 2021.02.25 | සුරාබදු නිවේදන අංක 07/2021 (2021.02.25 දිනැති අංක 2216/16 දරන ගැසට් නිවේදනය)<br><br>– බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා අදාළ වන්නා වූ ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධති රීති නියම කිරීම. |
| 2021.06.30 | සුරාබදු නිවේදන අංක 08/2021 (2021.06.30 දිනැති අංක 2234/23 දරන ගැසට් නිවේදනය)<br><br>– බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධති රීති ක්‍රියාත්මක කරන දිනය 2021 අගෝස්තු 15 දක්වා දීර්ඝ කිරීම මගින් සුරාබදු නිවේදන අංක 07/2021 සංශෝධනය කිරීම. |

**සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.07.29 | 2021.07.29 දිනැති අංක 2238/28 දරන ගැසට් නිවේදනය හා 2021.07.29 දිනැති අංක 2238/29 දරන ගැසට් නිවේදනය<br><br>– නීතිමය අවශ්‍යතාවය පූර්ණ කිරීම උදෙසා සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 32 වන වගන්තිය යටතේ සුරාබදු නිවේදන අංක 01/2021 හා සුරාබදු නිවේදන අංක 02/2021, අප්‍රේල් 20, 2021 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව දැනුම් දීම. |
| 2021.07.29 | 2021.07.29 දිනැති අංක 2238/30 දරන ගැසට් නිවේදනය හා 2021.07.29 දිනැති අංක 2238/31 දරන ගැසට් නිවේදනය<br><br>– නීතිමය අවශ්‍යතාවය පූර්ණ කිරීම උදෙසා සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 32 වන වගන්තිය යටතේ සුරාබදු නිවේදන අංක 04/2021 හා සුරාබදු නිවේදන අංක 06/2021, මැයි 04, 2021 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව දැනුම් දීම. |
| 2021.08.16 | සුරාබදු නිවේදන අංක 09/2021 (2021.08.16 දිනැති අංක 2241/3 දරන ගැසට් නිවේදනය)<br><br>– බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධති රීති ක්‍රියාත්මක කරන දිනය 2021 ඔක්තෝබර් 15 දක්වා දීර්ඝ කිරීම මගින් සුරාබදු නිවේදන අංක 07/2021 සංශෝධනය කිරීම. |
| 2021.10.16 | සුරාබදු නිවේදන අංක 10/2021 (2021.10.16 දිනැති අංක 2249/50 දරන ගැසට් නිවේදනය)<br><br>– බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධති රීති ක්‍රියාත්මක කරන දිනය 2022 ජනවාරි 03 දක්වා දීර්ඝ කිරීම මගින් සුරාබදු නිවේදන අංක 07/2021 සංශෝධනය කිරීම. |
| **වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත** | |
| 2021.01.05 | 2021.01.05 දිනැති අංක 2209/17 දරන ගැසට් නිවේදනය<br><br>– සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත පැවරී තිබූ මුහුණු ආවරණ නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය සහ ඖෂධ නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍රෝපකරණ මත පැනවී ඇති වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු නිදහස් කිරීම සඳහා නිර්දේශ කිරීමේ අධිකාරි බලය ඖෂධ නියාමන, සැපයුම් හා නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත පැවරීම. |
| 2021.02.23 | 2021.02.22 දිනැති අංක 2216/3 දරන ගැසට් නිවේදනය<br><br>– කිරිපිටි ආනයනය මත 2.5% සහනදායී අනුපාතය ප්‍රදානය කිරීම. |
| 2021.03.09 | 2021.03.09 දිනැති අංක 2218/51 දරන ගැසට් නිවේදනය<br><br>– යම් ව්‍යවසායක් ඇ.ඩො. මිලියන 50 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ආයෝජනයක් අදියර වශයෙන් යොදා ගනිමින් එහි වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර එය ක්‍රියාත්මක කිරීමේ දි හෝ ඉදිකිරීමේ දි එම ව්‍යාපෘතිය අදාල බද්දෙන් නිදහස් කෙරේ. |
| 2021.03.20 | 2021.03.19 දිනැති අංක 2219/68 දරන ගැසට් නිවේදනය<br><br>– ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිම් තාර නිෂ්පාදනය සඳහා විශේෂිතව ආනයනය කරනු ලබන දැවි තෙල් මත වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු සහන ලබාදීම. |
| 2021.04.20 | 2021.04.19 දිනැති අංක 2224/8 දරන ගැසට් නිවේදනය<br><br>– ආනයනික ජාත්‍යන්තර ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මිල මෙට්‍රික් ටොන් එකකට ඇ.ඩො. 325 ට ලගාවන තුරු 7.5% සහනදායී අනුපාතයක් හෝ මෙට්‍රික් ටොන් එකකට රු. 2,000 යන දෙකෙන් වඩා අඩු බදු සහනය ලබාදීම. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.06.12 | 2021.06.11 දිනැති අංක 2231/19 දරන ගැසට් නිවේදනය<br><br>– සම්පූර්ණ හෝ කැඩුන ශුද්ධ නොකළ කොකෝවා ඇට ආනයනය මත 5.0% සහනදායී බදු අනුපාතය ප්‍රදානය කිරීම. |
| 2021.08.12 | 2021.08.11 දිනැති අංක 2240/21 දරන ගැසට් නිවේදනය<br><br>– කිරි පිටි ආනයනය මත වන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු නිදහස් කිරීම. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2021.01.13 | 2021.01.12 දිනැති අංක 2210/9 දරන ගැසට් නිවේදනය<br><br>– ආනයනික අමු ද්‍රව්‍ය යොදා ගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන පහත කොන්දේසි සපුරන ව්‍යවසායයක් විසින් එම අපනයන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියෙන් සහ අළුත්වැඩියා/ නඩත්තු ක්‍රියාවලිය තුළින් ජනිත වන සුන්බුන් හෝ ඉවත ලන දෑ අපනයනය කිරීමේ දී සෙස් බද්ද අදාළ නොවේ :<br>:ස* ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ලියාපදිංචි වී තිබීම.<br>:සස* රේගු බන්ධිත ගුදම් තුල වන නිෂ්පාදන (Customs Manufacture – In – Bond) වැඩපිළිවෙළ හෝ අපනයන සඳහා තාවකාලික ආනයන (TIEP) වැඩපිළිවෙළ යටතේ ලියාපදිංචි වී තිබීම. |
| 2021.03.18 | 2021.03.17 දිනැති අංක 2219/36 දරන ගැසට් නිවේදනය<br><br>– 2019 මාර්තු 06 හෝ එදිනට පසුව ව්‍යාපෘතියක ඇ. ඩො. මිලියන 50 ක් හෝ ඊට වැඩි ආයෝජනයක් එක් එක් අදියර තුළ සිදු කරන ඕනෑම ව්‍යවසායයක් සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් මගින්, එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ හෝ ව්‍යාපෘතිය ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක බද්දෙන් නිදහස් කිරීම. |
| 2021.03.16 | 2021.03.15 දිනැති අංක 2219/15 දරන ගැසට් නිවේදනය<br><br>– පිගන් ගඩොල් සහ සනීපාරක්ෂක උපාංග ආනයනය මත බදු අනුපාත සංශෝධනය කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2021.04.23 | ආදායම් සංරක්ෂණ ආඥ අංක 01/2021 (2020.11.17 දිනැති අංක 2224/25 දරන ගැසට් නිවේදනය)<br><br>– රාජ්‍ය ගිණුම් කාරක සභාවේ මගපෙන්වීම පරිදි ජංගම වැඩපල වාහන සඳහා නව ජාතික උපබෙදුම් සංයෝජිත සංකේතාංක ඇති කිරිම. |
| 2021.05.18 | ආදායම් සංරක්ෂණ ආඥ අංක 02/2021 (2021.05.17 දිනැති අංක 2228/2 දරන ගැසට් නිවේදනය)<br><br>- මුහුණු ආවරණ සඳහා සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම හේතුවෙන් සිදුවන ආදායම් අහිමිවීම වැලැක්වීම සඳහා නව සංයෝජිත සංකේතාංකයක් ඒ වෙනුවෙන්ම ඇතිකිරීම. |
| **රේගු අධිභාරය - රේගු ආඥපනත (232 වැනි අධිකාරය)** | |
| 2021.02.02 | 2021.02.01 දිනැති අංක 2213/7 දරන ගැසට් නිවේදනය.<br><br>- පෙට්‍රල් (ඔක්ටේන් 95) සහ අනෙකුත් පෙට්‍රල් මත වන ලීටරයකට රු. 20 ක සහ සුපිරි ඩීසල් මත වන ලීටරයකට රු. 30 ක සහ ඔටෝ ඩීසල් සඳහා ලීටරයකට රු. 12 ක රේගු අධිකාරිය ඉවත් කිරීම. |
| **රේගු ආනයන බදු නිදහස් කිරීම - රේගු ආඥපනත (232 වැනි අධිකාරය)** | |
| 2021.01.01 | – පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 7 සිට රු. 18 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 6 සිට රු. 16 දක්වා වැඩි කිරීම.<br>– සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 15 ක රේගු තීරු බදු නිදහස් කිරීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 20 දක්වා වැඩි කිරීම. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.02.02 | – පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 18 සිට රු. 29 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 16 සිට රු. 8 දක්වා අඩු කිරීම.<br>– සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 15 ක රේගු තීරු බදු නිදහස් කිරීම ඉවත් කිරීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 20 සිට රු. 14 දක්වා අඩු කිරීම. |
| 2021.03.25 | – පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 29 සිට රු. 45 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 8 සිට රු. 24 දක්වා වැඩි කිරීම.<br>– සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 10 ක රේගු තීරු බදු නිදහස් කිරීම හඳුන්වා දීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 14 සිට රු. 25 දක්වා වැඩි කිරීම. |
| 2021.08.12 | – කිරි පිටි ආනයනය මත පැනවී ඇති රේගු ආනයන බදු කිලෝග්‍රෑම් 1 ට රු. 210 සිට රු. 225 දක්වා හෝ සියයට 20 දක්වා වැඩි කිරීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2021.01.14 | 2021.01.13 දිනැති අංක 2210/16 දරන ගැසට් නිවේදනය.<br>– සීනි, බොම්බයි ළූණු සහ පරිප්පු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.01.19 | 2021.01.18 දිනැති අංක 2211/8 දරන ගැසට් නිවේදනය.<br>– චීස්, කොත්තමල්ලි, කහ සහ උඳු පිටි ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.02.12 | 2021.02.11 දිනැති අංක 2214/58 දරන ගැසට් නිවේදනය.<br>– කරවල වර්ග සඳහා අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එම අගයෙහිම පවත්වා ගැනීම සහ එළවළු මිල පාලනය කිරීම සඳහා අර්තාපල් මත වන බද්ද මාස 06 ක කාලයක් සඳහා රු. 15 දක්වා අඩු කිරීම. |
| 2021.03.04 | 2021.03.03 දිනැති අංක 2217/23 දරන ගැසට් නිවේදනය.<br>– මැකරල් මාළු, උඳු, කව්පි, කුරක්කන් සහ මිලට් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.14 | 2021.04.13 දිනැති අංක 2223/2 දරන ගැසට් නිවේදනය.<br>– සීනි, බොම්බයි ළූණු සහ පරිප්පු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.27 | 2021.04.26 දිනැති අංක 2225/1 දරන ගැසට් නිවේදනය.<br>– මාළු, උම්බලකඩ, මුංඇට, මැංගුස්ටීන් සහ කිවි ෆෲට් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.28 | 2021.04.27 දිනැති අංක 2225/8 දරන ගැසට් නිවේදනය.<br>– දිසිදි පොල් (අනෙකුත්) ආනයනය මත කි.ග්‍රෑමයට රු. 300 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 03 ක කාලයක් සඳහා පැනවීම සහ බී. සී. සී ලංකා ආයතනය බද්දෙන් නිදහස් කිරීම. |
| 2021.04.27 | 2021.04.27 දිනැති අංක 2225/13 දරන ගැසට් නිවේදනය.<br>– අර්තාපල් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50ක් දක්වා වැඩිකිරීම. |
| 2021.05.18 | 2021.05.17 දිනැති අංක 2228/3 දරන ගැසට් නිවේදනය.<br>– අයිතම 22 ක් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.06.15 | 2021.06.14 දිනැති අංක 2232/03 දරන ගැසට් නිවේදනය.<br>– ක්ලෙමන්ටයින් අළුත් / වියළි ඇතුළු අනෙකුත් අයිතම 17ක් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.07.19 | 2021.07.18 දිනැති අංක 2236/66 දරන ගැසට් නිවේදනය.<br>– වීස්, කොත්තමල්ලි, කහ සහ උඳු පිටි ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.08.12 | 2021.08.11 දිනැති අංක 2240/20 දරන ගැසට් නිවේදනය.<br>– හාල්මැස්සන්, කරවල, බටර්, උළුහාල්, කුරක්කන් පිටි, අබ සහ ලුණු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.09.08 | 2021.09.07 දිනැති අංක 2244/8 දරන ගැසට් නිවේදනය.<br>බොම්බයි ළූණු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 40 ක් දක්වා වැඩිකිරීම. |
| **ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි** | |
| 2021.01.05 | 2021 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.01.05 දිනැති අංක 2209/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි වශයෙන් ආනයන රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කරන ලද හඳුනාගත් ආනයනික ටයර් භාණ්ඩ ලැයිස්තුව සංශෝධනය කිරීම. |
| 2021.02.11 | 2021 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.02.11 දිනැති අංක 2214/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි වශයෙන් ආනයන රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කරන ලද හඳුනාගත් ආනයනික සෙරමික් භාණ්ඩ සහ සාරි ලැයිස්තුව සංශෝධනය කිරීම. |
| 2021.04.07 | 2021 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.06 දිනැති අංක 2222/31 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– පාම් තෙල් ආනයනයට අදාල නියෝග පැනවීම. |
| 2021.04.23 | 2021 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.23 දිනැති අංක 2224/43 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– ජංගම වැඩපළවල් සඳහා ආනයන පාලන බලපත්‍ර පැනවීම. |
| 2021.04.23 | 2021 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.23 දිනැති අංක 2224/44 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– විශේෂ කාර්යය මෝටර් වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවීම. |
| 2021.05.06 | 2021 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.05.06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– රසායනික පොහොර, කෘමිනාශක සහ පළිබෝධ නාශක ආනයනය පාලනය කිරීම. |
| 2021.06.11 | 2021 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.06.11 දිනැති අංක 2231/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– මුහුණු ආවරණ, රත්‍රං, ලෝහ වර්ග යනාදිය සඳහා ආනයන පාලන බලපත්‍ර පැනවීම. |
| 2021.06.11 | 2021 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.06.11 දිනැති අංක 2231/17 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– ඔක්සිජන් ඇතුළු / උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ අපනයනය සඳහා ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශය බලගැන්වීම. |

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා (*සම්බන්ධිතයි*)

<table>
<tr><th>ක්‍රියාත්මක වන දිනය</th><th>ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>2021.06.11</td><td>2021 අංක 10 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.06.11 දිනැති අංක 2231/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි යටතේ ආනයනය සීමා කර ඇති I උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම.</td></tr>
<tr><td>2021.07.31</td><td>2021 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.07.31 දිනැති අංක 2238/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>– ඛණිජමය හෝ රසායනික පොහොර ආනයන පාලන බලපත්‍ර පැනවීම.</td></tr>
<tr><td colspan="2">2018 අංක 35 දරන මුදල් පනත</td></tr>
<tr><td colspan="2">මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද</td></tr>
<tr><td>2021.01.05</td><td>2021.01.05 දිනැති අංක 2209/23 දරන ගැසට් නිවේදනය<br>– පාර්ලිමේන්තු කටයුතු විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ 8 වන පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ආනයනය කරන ලද මෝටර් රථයක්, සුඛෝපභෝගී භාණ්ඩ බද්දෙන් නිදහස් කිරීම.</td></tr>
<tr><td colspan="2">2006 අංක 11 දරන මුදල් පනත</td></tr>
<tr><td colspan="2">ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද</td></tr>
<tr><td>2021.02.09</td><td>2021.02.09 දිනැති අංක 2214/25 දරන ගැසට් නිවේදනය<br>– විදේශීය ටෙලිනාට්‍ය සහ චිත්‍රපට විකාශනය මත පනවනු ලබන ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද නැවත පැනවීම.</td></tr>
<tr><td>2021.05.11</td><td>2021.05.10 දිනැති අංක 2227/2 දරන ගැසට් නිවේදනය<br>– මාසයක කාලයක් සඳහා විදේශීය වාණිජ වැඩසටහන් විකාශනය වෙනුවෙන් නිෂ්කාශන සහතිකයක් ලබාගැනීමේ විධි විධානයක් හඳුන්වා දීම.</td></tr>
<tr><td colspan="2">2009 අංක 11 දරන මුදල් පනත</td></tr>
<tr><td colspan="2">ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද</td></tr>
<tr><td>2021.01.01</td><td>2021.01.01 දිනැති අංක 2208/59 දරන ගැසට් නිවේදනය<br>– 2021.01.01 දින සිට ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද එම අනුපාත යටතේම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.</td></tr>
<tr><td colspan="2">2021 අංක 18 දරන මුදල් පනත</td></tr>
<tr><td>2021.09.15</td><td>– 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර නියම කොට දක්වා ඇති නීතිවල විධිවිධාන යටතේ හෙළිදරව් කළ යුතුව තිබූ, එනමුත් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම්, වත්කම් නියම කර දක්වා ඇති ආකාරයට ආයෝජනය කිරීමෙන් හෝ තැන්පත් කිරීමෙන් සහ එම ආයෝජනයෙන් හෝ තැන්පත් කිරීමෙන් සියයට එකක් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද වශයෙන් ගෙවීමෙන් පසු ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන තැනැත්තන්ට බදු සමාවක් ලබාදීම.<br>– ඇතැම් නීති යටතේ හිඟ බදු මුදල් කපා හැරීම සඳහා විධිවිධාන සැලසීම.</td></tr>
<tr><td colspan="2">2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත</td></tr>
<tr><td>2021.01.05</td><td>2021.01.05 දිනැති අංක 2209/22 දරන ගැසට් නිවේදනය<br>– හම්බන්තොට ආරබොක්ක ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ කලාපයක් පිහිටුවීම.</td></tr>
</table>

සටහන 1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වාර් (*සම්බන්ධිතයි*)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.03.05 | 2021.03.05 දිනැති අංක 2217/40 දරන ගැසට් නිවේදනය<br><br>– ''සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්'' ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගැනීමට අදාල වන්නා වූ බදු නිදහස් කිරීම් සහ කොන්දේසි නිවේදනය කිරීම. |
| 2021.03.23 | 2021.03.23 දිනැති අංක 2220/30 දරන ගැසට් නිවේදනය<br><br>– කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දැනටමත් පළ කර ඇති 3(4) වගන්තිය යටතේ වනගැසට් නිවේදනයේ සඳහන් වගන්තියක් සංශෝධනය කිරීම. |
| 2021.04.19 | 2021.04.19 දිනැති අංක 2224/2 දරන ගැසට් නිවේදනය<br><br>– ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ විශේෂිත කලාපය තුල ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කිරීම. |
| 2021.04.20 | 2021.04.20 දිනැති අංක 2224/9 දරන ගැසට් නිවේදනය<br><br>– රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ විශේෂිත කලාපය තුල ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කිරීම. |
| 2021.05.24 | 2021.05.24 දිනැති අංක 2229/2 දරන ගැසට් නිවේදනය<br><br>– "වෙල්කම් හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාලසීමාව 2022 ජනවාරි මස 01 දින සිට තවදුරටත් මාස දහඅටක (18) කින් දීර්ඝ කිරීම. |
| 2021.05.24 | 2021.05.24 දිනැති අංක 2229/3 දරන ගැසට් නිවේදනය<br><br>– "ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාලසීමාව 2020 මාර්තු මස 25 වන දින සිට තවදුරටත් මාස දහනවයක (19) කින් දීර්ඝ කිරීම. |
| 2021.07.30 | 2021.07.30 දිනැති අංක 2238/39 දරන ගැසට් නිවේදනය<br><br>– කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය-1 (WCT- 1) ප්‍රවර්ධනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගැනීමට අදාල වන්නා වූ බදු නිදහස් කිරීම් සහ කොන්දේසි නිවේදනය කිරීම. |
| 2021.07.30 | 2021.07.30 දිනැති අංක 2238/40 දරන ගැසට් නිවේදනය<br><br>– රෙදිපිළි නිෂ්පාදනය සඳහාම වෙන් කළ කලාපය තුළ ඇති එක් එක් ව්‍යවසායයන් සඳහා දෙනු ලබන බදු නිදහස් කිරීම් සහ සහන නිවේදනය කිරීම. |
| **රාජ්‍ය මූල්‍ය නියමයන් සඳහා වන සංශෝධන** | |
| **2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත** | |
| | - දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි) සියයට 60 වන ණය ඉලක්කය 2020 වසරේ සිට 2030 වසර දක්වා දීර්ඝ කිරීමට; සහ<br>- ඇපකර සීමාව සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීමට |

### 1.3 රජයේ වියදම

2021 වසරේ පළමු මාස අට තුළ රජයේ වියදම රු. බිලියන 2,062.4 ක් වූ අතර එයින් රු. බිලියන 1,801.5 ක් පුනරාවර්තන වියදම් ද රු. බිලියන 260.9 ක් මූලධන වියදම් සහ ශුද්ධ ණයදීම් සඳහා ද විය.

**වගුව 1.11 : රාජ්‍ය වියදම් කාර්යසාධනය**

රු. මිලියන

| | ජන. - අගෝ. 2020 | 2021[අ] |
|---|---|---|
| **පුනරාවර්තන** | **1,670,356** | **1,801,521** |
| වැටුප් | 516,354 | 564,151 |
| විශ්‍රාම | 160,058 | 176,131 |
| පොලී ගෙවීම | 653,498 | 700,538 |
| වෙනත් | 340,446 | 360,701 |
| **මූලධන වියදම සහ ශුද්ධ ණය ගෙවීම** | **213,350** | **260,879** |
| **මුළු වියදම** | **1,883,706** | **2,062,400** |

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

#### පුද්ගල පඩිනඩි සහ විශ්‍රාම වැටුප්

2021 වසරේ පළමු මාස අට තුළ පළාත් රාජ්‍ය සේවකයින් ද ඇතුළුව රාජ්‍ය සේවකයින්ගේ පුද්ගල පඩිනඩි සඳහා වන සමස්ත වියදම රු. බිලියන 564.2 ක් වූ අතර, එය 2020 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදම වූ රු. බිලියන 516.4 ට සාපේක්ෂව සියයට 9.3 ක වැඩිවීමකි. 2020 වසරේ අවසාන භාගයේදී සහ 2021 වර්ෂයේ මුල් භාගයේදී උපාධිධාරී අභ්‍යාසලාභීන් 53,000 ක් බඳවාගැනීම, 2019 වසරේ දී බඳවාගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් 14,500 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදීම සමඟ 2020 වසරේ අග භාගයේදී රැකියා 100,000 වැඩසටහන යටතේ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය සඳහා පුද්ගලයින් 30,000 ක් බඳවාගැනීම් මේ සඳහා හේතු වී ඇත. 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 153.8 ක් වූ පළාත් සභා වැටුප් සඳහා වූ මධ්‍යම රජයේ දායකත්වය, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 172.6 ක් දක්වා වැඩිවිය. 2020 වසරේ අග භාගයේ දී සහ 2021 වසරේ මුල් භාගයේ දී රාජ්‍ය සේවක ව්‍යුහයේ වෙනස්වීම් සමඟ 2021 වසරේ දී සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා කොවිඩ්-19 ආශ්‍රිත ගෙවීම් ඉහළයාම මෙම වැඩිවීමට හේතුවිය. විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 160.1 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 176.1 ක් දක්වා සියයට 10 කින් වැඩිවිය. විශ්‍රාමිකයින් සංඛ්‍යාව වැඩිවීම සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව නව විශ්‍රාමිකයින් සඳහා ඉහළ මූලික වැටුපක් හිමිවීම මෙම වැඩිවීමට හේතු විය.

#### පොලී ගෙවීම

2020 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 653.5 ක් වූ දේශීය සහ විදේශීය ණය මත පොලී ගෙවීම, 2021 වසරේ එම කාල සීමාව තුළ රු. බිලියන 700.5 ක් දක්වා සියයට 7.2 කින් වැඩිවිය. මෙය ප්‍රධාන වශයෙන් දේශීය ණය මත වූ පොලී ගෙවීම සියයට 12.4 කින් වැඩි වීම පිළිඹිබු කිරීමකි. කෙසේ වෙතත්, 2021 වසරේ පළමු මාස අට තුළ විදේශීය ණය මත වූ පොලී ගෙවීම සියයට 7.4 කින් සැලකිය යුතු ලෙස අඩු විය. රු. බිලියන 700.5 ක් වූ සමස්ත පොලී ගෙවීමෙන් රු. බිලියන 541.5 ක් දේශීය ණය මත පොලී ගෙවීම් සඳහා වූ අතර රු. බිලියන 159.0 ක් විදේශීය ණය මත පොලී ගෙවීම් සඳහා විය.

**වගුව 1.12 : රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම (%) 2020 සිට 2021 දක්වා**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු./ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින **91** | දින **182** | දින **364** | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2020 | ජන | 7.51 | 8.15 | 8.59 | – | 9.39 | – | 9.27 | 181.4 |
| | පෙබ | 7.42 | 8.06 | 8.58 | – | – | – | – | 181.6 |
| | මාර්තු | 7.00 | 7.25 | 7.50 | – | 9.33 | 9.81 | – | 185.1 |
| | අප්‍රේ | 6.75 | 6.80 | 7.00 | – | 8.14 | 8.70 | 8.75 | 193.1 |
| | මැයි | 6.69 | 6.82 | 6.93 | – | 8.05 | – | – | 187.9 |
| | ජූනි | 5.50 | 5.53 | 5.66 | 5.86 | – | – | 8.59 | 186.0 |
| | ජූලි | 4.59 | 4.68 | 4.86 | 5.73 | – | – | 6.50 | 185.8 |
| | අගෝ | 4.56 | 4.68 | 4.89 | – | – | – | – | 184.9 |
| | සැප් | 4.51 | 4.64 | 4.89 | 5.65 | 5.72 | – | 6.59 | 185.0 |
| | ඔක් | 4.57 | 4.69 | 4.96 | – | – | – | – | 184.4 |
| | නොවැ | 4.64 | 4.76 | 5.00 | – | – | 6.32 | – | 184.8 |
| | දෙසැ | 4.69 | 4.80 | 5.05 | – | 5.99 | – | 6.79 | 187.2 |
| 2021 | ජන | 4.69 | 4.75 | 4.98 | – | – | 6.34 | 6.72 | 190.5 |
| | පෙබ | 4.90 | 4.99 | 5.09 | – | 6.70 | – | 7.07 | 194.1 |
| | මාර්තු | 5.05 | 5.10 | 5.11 | 6.19 | 6.30 | – | 7.05 | 197.0 |
| | අප්‍රේ | 5.11 | 5.14 | 5.18 | 6.50 | – | – | 7.25 | 197.4 |
| | මැයි | 5.13 | 5.14 | 5.18 | – | – | 7.04 | – | 199.6 |
| | ජූනි | 5.18 | 5.19 | 5.23 | 6.35 | – | 7.30 | 7.31 | 199.8 |
| | ජූලි | 5.22 | 5.23 | 5.25 | 6.36 | 6.87 | 7.47 | – | 200.0 |
| | අගෝ | 5.87 | 5.90 | 5.93 | 6.75 | – | 8.55 | – | 200.5 |
| | සැප් | 6.70 | 6.99 | 7.01 | 8.12 | 8.10 | – | – | 202.0 |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

### සුබසාධන වියදම

සුබසාධන වැඩසටහන් මත වූ රජයේ වියදම සඳහා සෞඛ්‍ය හා පෝෂණය, අධ්‍යාපනය, ජීවනෝපාය ආධාර සහ සමාජ සුබසාධන හා ආරක්ෂක ජාල වැඩසටහන් මත වූ වියදම් ඇතුළත් වේ. එවැනි වියදම් සඳහා 2021 වසරේ පළමු මාස අට තුළ දී වියදම රු. බිලියන 161 ක් විය. වසංගතයේ බලපෑමෙන් අවදානමට ලක්වූ, විශේෂයෙන් ජීවනෝපාය අහිමි වූ පුද්ගලයන්ගේ සමාජ සුබසාධන වැඩසටහන් සඳහා වූ රාජ්‍ය ආයෝජන අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

වගුව 1.13 : සුභසාධන වියදම්

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2020 | ජන. - අගෝ. 2021(අ) |
|---|---|---|
| **සෞඛ්‍ය හා පෝෂණ** | **44,089** | **71,617** |
| සැමට නොමිලේ ඖෂධ | 40,133 | 67,732 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 728 | 411 |
| පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය | 65 | 66 |
| පෝෂණ මල්ල | 3,163 | 3,408 |
| **අධ්‍යාපන** | **10,523** | **11,848** |
| නොමිලේ පෙළපොත් | 1,958 | 816 |
| නොමිලේ පාසැල් නිල ඇඳුම් | 2,080 | 1,665 |
| නොමිලේ වාර ප්‍රවේශපත්‍ර | 2,900 | 5,300 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර | 1,541 | 1,237 |
| දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ට පාවහන් | 491 | 898 |
| 5 වසර ශිෂ්‍යත්ව | 321 | 299 |
| මහපොළ ශිෂ්‍යත්ව | 698 | 700 |
| ශිෂ්‍යාධාර | 427 | 500 |
| දහම් පාසල් පෙළපොත් | 30 | 2 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 3 | 2 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර | 74 | 429 |
| **ජීවනෝපාය සහායයන්** | **105,157** | **49,079** |
| පොහොර සහනාධාරය | 21,349 | 9,482 |
| සමෘද්ධි සහනාධාරය | 35,087 | 38,844 |
| නැවත වගා කිරීම සඳහා සහනාධාරය (තේ/රබර්) | 740 | 619 |
| අපනයන බෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 281 | 134 |
| කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ පුද්ගලයන්ට ජීවනෝපාය සහායයන් | 47,700 | 12,397 |
| **සමාජ සුභසාධනය සහ ආරක්ෂණ ජාලය** | **14,258** | **15,613** |
| විශේෂ හැකියා ඇති පුද්ගලයින් හා වකුගඩු රෝගීන් සඳහා ආධාර | 1,460 | 4,411 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා ආධාර | 6,575 | 6,589 |
| රණවිරු මාපිය සමාජ සත්කාර | 1,571 | 1,519 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 52 | 194 |
| ආර්ථික වශයෙන් වාසිදායක නොවන මාර්ගවල බස් සේවා | 4,600 | 2,900 |
| **එකතුව** | **174,027** | **148,157** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

වගුව 1.14 : කොවිඩ් - 19 වසංගතය මැඩලීම සඳහා වූ රජයේ වියදම (2021.08.31 දිනට)

රු. මිලියන

| විස්තරය | ජන. - අගෝ. 2020 | ජන. - අගෝ. 2021 |
|---|---|---|
| කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත්වූ ජනතාව සඳහා රු. 5000/- දීමනාව ලබා දීම | 50,020 | 18,590 |
| නිරෝධායන කටයුතු සෞඛ්‍ය යටිතල පහසුකම්, ඖෂධ හා සැපයුම් සේවා යනාදිය | 28,663 | 111,768 |
| කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත්වූ ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සලසන ලද පහසුකම් | 307 | 12,397 |
| **එකතුව** | **78,990** | **142,755** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**රාජ්‍ය ආයෝජන**

මහාමාර්ග, ජල සම්පාදන, වාරිමාර්ග, ප්‍රවාහන, කෘෂිකර්ම සහ අධ්‍යාපන යන ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ආවරණය කරමින් යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් 2021 වසරේ පළමු මාස අටක කාලය තුළ පහත ප්‍රධාන ක්ෂේත්‍රයන්ද ඇතුළත්ව රු. බිලියන 154 ක පමණ වියදමක් දරා ඇත.

- විකල්ප මාර්ග, ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග ඇතුලත් කි.මී. 100,000 ක මාර්ග සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 82,970
- සැමට ප්‍රමාණවත් සහ සුරක්ෂිත පානීය ජලය ලබාදීම සහතික කිරීම වෙනුවෙන් රු. මිලියන 10,552
- ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂමතාවය, ධාරිතාවය සහ සබඳතාවය ඉහළ නැංවීම වෙනුවෙන් රු. මිලියන 9,204
- නවීන තාක්ෂණය හඳුන්වාදීම මගින් කෘෂිකාර්මික අගය දාමයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා රු. මිලියන 13,282
- බහුකාර්ය වාරිමාර්ග යෝජනා ක්‍රම සහ ඇළ මාර්ග ඉදිකිරීම මගින් කෘෂිකර්මය සඳහා ජලය ලබාදීම සහතික කිරීම වෙනුවෙන් රු. මිලියන 20,413
- අධ්‍යාපන පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රු. මිලියන 17,891

### 1.4 භාණ්ඩාගාර මෙහෙයුම්

**භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය**

2021 වසරේ පළමු මාස අට තුළ ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රු. බිලියන 909.1 ක් වූ අතර එය රු. බිලියන 1,185.9 ක ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 76.7 කි. මෙය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ රු. බිලියන 880.9 ට සාපේක්ෂව සියයට 3.2 ක වැඩිවීමකි. මේ අතර, 2021 වසරේ මුල් මාස අට තුළ පුනරාවර්තන වියදම් හා රාජ්‍ය ආයෝජන යන දෙකම සඳහා මුදල් ගලායාම් රු. බිලියන 2,095.8 ක් වූ අතර, එය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ රු. බිලියන 1,941.0 ට සාපේක්ෂව සියයට 8.0 වැඩිවීමකි.

2021 අගෝස්තු 31 දිනට ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 1,186.7 ක් වූ අතර එය 2020 වසරේ අගෝස්තු 31 දිනට පැවති රු. බිලියන 1,060.1 ට සාපේක්ෂව සියයට 11.9 වැඩිවීමකි. මෙහෙයුම් වියදම් සහ රාජ්‍ය ආයෝජන පිළිවෙළින් සියයට 7.8 කින් සහ සියයට 8.9 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහි ප්‍රතිඵලය වූයේ 2020 වසරේ අගෝස්තු 31 දිනට රු. බිලියන 541.5 ක්ව පැවති සමස්ත මුදල් ශේෂ හිඟය 2021 වසරේ අගෝස්තු 31 දිනට රු. බිලියන 895.1 ක් දක්වා වැඩිවීමයි.

**වගුව 1.15 : රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - අගෝස්තු | | |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -274.3 | -488.2 | -488.2 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 880.9 | 1,185.9 | 909.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යැම් | -1,626.7 | -1,723.8 | -1753.6 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්* | -314.3 | -546.6 | -342.2 |
| ශුද්ධ මුදල් අතිරික්තය /(හිඟය) | -1,060.1 | -1,084.5 | -1186.7 |
| දළ ණය ගැනීම්* | 1,406.2 | 2,013.5 | 1754.1 |
| ණය ආපසු ගෙවීම් | -673.8 | -1,001.2 | -992.5 |
| ශුද්ධ ණය ගැනීම් | 732.4 | 1,012.3 | 761.6 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | | 0.0 | 0.0 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ශුද්ධ තැන්පතු යනාදිය) | 51.4<br>9.1 | 0.0 | 18.2 |
| **අවසාන මුදල් ශේෂය** | **-541.5** | **-560.4** | **-895.1** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව


* 2021.08.31 දක්වා රජයට ලැබුණු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුලත්වේ.

### රාජ්‍ය ණය කළමනාකරණය

2021 වසරේ පාර්ලිමේන්තුව මගින් අනුමත කරන ලද මුළු ණය ගැනීමේ සීමාව රු. බිලියන 2,997.0 ක් වන අතර, 2021 වසරේ ජනවාරි 01 වනදා සිට අගෝස්තු මස 31 වනදා දක්වා කාලය තුළ රජයේ ණය භාවිතය (පොත් අගය) රු. බිලියන 1,754.1 කි. එම කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහ මෙහෙයුම් කටයුතු සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මුදල් යෙදවීම පිණිස දේශීය හා විදේශීය ණය වලින් සමන්විත මුළු ණය ගැනීම් පිළිවෙළින් රු. බිලියන 1,471.8 ක් සහ රු. බිලියන 282.3 ක් විය. 2021 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ මුළු ණය ගැනීම් වලින් දේශීය ණය ගැනීම් සියයට 83.9 ක් පමණ වේ. භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ මහ බැංකු අත්තිකාරම් දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුව, 2021 පළමු මාස අට තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 55 ක් පමණ භාණ්ඩාගාර බැඳුම්කර මගින් ද, සියයට 29 ක් භාණ්ඩාගාර බිල්පත් මගින් ද, තවත් සියයට 16 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් මගින් ද ලබාගෙන ඇත. තවද, 2021 පළමු කාර්තුවේ දී නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කර ණය මගින් ලැබුන මුදල විදේශ ණය සේවා ගෙවීම් සඳහා යොදාගන්නා ලදී. 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට ශුද්ධ ණය ගැනීම රු. බිලියන 761.6 ක් විය.

2021 ජනවාරි සිට අගෝස්තු දක්වා රජයේ දළ දේශීය ණයගැනීම් සාරාංශය පහත පරිදි වේ.

**රූපසටහන 1.4 : මූලාශ්‍ර අනුව දළ දේශීය ණය 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා**




මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙළිදරව් කිරීම

2021 අගෝස්තු මස 31 වන දිනට නිකුත්කල භාණ්ඩාගාර ඇපකර වල වටිනාකම රු. බිලියන 1,484.1 ක් වන අතර එය 2016 අංක 13 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් (සංශෝධන) පනතේ දෙවන වගන්තිය අනුව අදාළ සීමාව තුළ වේ. 2021 අගෝස්තු මස 31 වන දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව ඇමුණුම 01 හි දක්වා ඇත.

**වගුව 1.16 : දළ දේශීය ණය මූලාශ්‍ර අනුව**

රු. බිලියන

| මූලාශ්‍ර | ජන. - අගෝ. 2021 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 831.2 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 444.5 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 197.4 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 45.1 |
| **එකතුව** | **1,518.2** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය ආපසු ගෙවීම් | -46.4 |
| **දේශීය ණය භාවිතය** | **1,471.8** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 1.5 විදේශ මූල්‍යයනය

### විදේශ මූල්‍යයන එකඟතා

විදේශ අරමුදල් සම්පාදනයේ දී විදේශ ණය සඳහා නිරාවරණය වීම අවම කරමින් ණය නොවන මූල්‍යයන ව්‍යාපෘති නිර්මාණය කරමින් 2020 ආරම්භයේ සිට ඉහළ ප්‍රමුඛතා සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය කිරීමට රජය ක්‍රියා කර ඇත. ඒ අනුව, රජය 2021 වසරේ පළමු මාස අට තුළ ලබාගෙන ඇති විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,710 කි. මීට අමතරව, වෙළඳපොළ මිල ගණන් වලට සාපේක්ෂව ඉතා තරඟකාරී කොන්දේසි යටතේ චීන සංවර්ධන බැංකුව වෙතින් ඇ. ඩො. මිලියන 500 ක් සහ තවත් රෙන්මින්බි යුආන් 2,000 ක් විදේශ මුදල් කාලීන මූල්‍ය පහසුකමක් ලෙස ලබා ගන්නා ලදී. නිල සංවර්ධන ආධාර යටතේ ලබාගත් එකඟතාවලින් ඇ.ඩො. මිලියන 28.6 ක් ප්‍රදාන වශයෙන් සිදු කළ අතර ඉතිරි මුදල එනම්, ඇ.ඩො. මිලියන 723.4 ක් ණය වශයෙන් ලබාගෙන ඇත.

වගුව 1.17 : **2021** ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාල මූල්‍ය කොන්දේසි සමඟ

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය හෝ වැඩසටහන | එකඟතා ප්‍රමාණය (මිලියන )* | | | | මූල්‍ය කොන්දේසි | | | වෙනත් කොන්දේසි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොළිය වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය /උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| **ද්විපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| හංගේරියාව | ණය | 4/1/2021 | කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීම | යුරෝ | 52.0 | 12,143.6 | 60.9 | පොලී නොමැත | අදාල නොවේ | අදාළ නොවේ | 0 | 9 | 27 |
| ඉන්දියාව | ණය | 16/06/2021 | සූර්ය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම සඳහා ඩොලර් ණයවර ගිවිසුම | එ.ජ. ඩොලර් | 100.0 | 19,972.4 | 100.0 | ස්ථාවර | 1.75 | අදාළ නොවේ | බැඳීම් ගාස්තු 0.5%, කළමනාකරණ ගාස්තු 0.5% | 5 | 20 |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව | ණය | 13/05/2021 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති ඇති කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අමතර මූල්‍යකරණය | එ.ජ. ඩොලර් | 54.0 | 10,773.0 | 54.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | පැතිරුණු විචල්‍යය ** | බැඳීම් ගාස්තු 0.25%, මූලික ගෙවීම් 0.25% | 5 | 18 |
| | ණය | 1/1/2021 | දේශගුණික ඔරොත්තුදීමේ බහුකාර්යය වැඩසටහන | එ.ජ. ඩොලර් | 92.0 | 17,055.9 | 92.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | පැතිරුණු විචල්‍යය ** | බැඳීම් ගාස්තු 0.25%, මූලික ගෙවීම් 0.25% | 6 | 30 |

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය හෝ වැඩසටහන | එකඟතා ප්‍රමාණය (මිලියන )* | | | | මූල්‍ය කොන්දේසි | | | වෙනත් කොන්දේසි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොළිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය /උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 22/04/2021 | ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය - සහනදායී ණය | වි.ගැ.හි | 31.4 | 8,851.6 | 46.1 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු0.75% බැඳීම් ගාස්තු 0.25% | 5 | 29 |
| | ණය | 22/04/2021 | ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය - සහනදායී නොවන ණය | එ.ජ. ඩොලර් | 26.7 | 5,126.4 | 26.7 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | පැතිරුණු විචල්‍යය ** | බැඳීම් ගාස්තු 0.25%, මූලික ගෙවීම් 0.25% | 5 | 29 |
| | ණය | 13/05/2021 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති ඇති කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අමතර මූල්‍යකරණය | වි.ගැ.හි | 18.7 | 5,361.8 | 26.9 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75% බැඳීම් ගාස්තු 0.5% | 5 | 30 |
| | ණය | 22/04/2021 | මහනුවර බහුමාදිලි ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදාය ණය | වි.ගැ.හි | 47.1 | 13,286.4 | 69.3 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75% | 4 | 29 |
| | ණය | 22/04/2021 | මහනුවර බහුමාදිලි ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදායී නොවන ණය | එ.ජ. ඩොලර් | 5.0 | 960.0 | 5.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 0 | මූලික ගෙවීම 0.25% | 4 | 9 |
| | ණය | 13/05/2021 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති ඇති කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අමතර මූල්‍යකරණය | වි.ගැ.හි | 18.7 | 5,361.8 | 26.9 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75% බැඳීම් ගාස්තු 0.5% | 5 | 30 |
| | ණය | 22/04/2021 | මහනුවර බහුමාදිලි ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදාය ණය | වි.ගැ.හි | 47.1 | 13,286.4 | 69.3 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75% | 4 | 29 |

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය හෝ වැඩසටහන | එකඟතා ප්‍රමාණය (මිලියන )* | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොළිය වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය /උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | ණය | 22/04/2021 | මහනුවර බහුමාදිලි ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදායී නොවන ණය | එ.ජ. ඩොලර් | 5.0 | 960.0 | 5.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 0 | මූලික ගෙවීම 0.25% | 4 | 9 |
| | ප්‍රදාන * | 28/01/2021 | දේශීය ආධාරක සංවර්ධන ව්‍යාපෘතිය | යුරෝ | 20.0 | 4,762.2 | 24.3 | අදාළ නොවේ | | | | | 1 |
| | ප්‍රදාන * | 17/05/2021 | කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය | යුරෝ | 2.7 | 653.4 | 3.3 | අදාළ නොවේ | | | | | 1 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | ණය | 10/6/2021 | කුඩා කෘෂි ව්‍යාපාර හිමියන් නගා සිටුවීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 41.7 | 8,326.5 | 41.7 | ස්ථාවර | 1.75 | අදාළ නොවේ | 0 | 11 | 27 |
| | ප්‍රදාන | 10/6/2021 | කුඩා කෘෂි ව්‍යාපාර හිමියන් නගා සිටුවීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් | 1.0 | 199.6 | 1.0 | අදාළ නොවේ | | | | | 1 |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 28/05/2021 | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - 3 කොටස | එ.ජ. ඩොලර් | 200.0 | 39,912.6 | 200.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 0.7 | බැඳීම් ගාස්තු 0.15% | 9 | 29 |
| | ණය | 09/07/2021 | ප්‍රතිදානය සඳහා වූ ප්‍රතිචාරාත්මක කොවිඩ් 19 එන්නත් වැඩසටහන (ක්ෂණික ප්‍රතිචාර සංරචකය) | එ.ජ. ඩොලර් | 84.0 | 16,791.6 | 84.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 0.7 | බැඳීම් ගාස්තු 0.15% | 3 | 10 |
| | ණය | 9/7/2021 | ප්‍රතිදානය සඳහා වූ ප්‍රතිචාරාත්මක කොවිඩ් 19 එන්නත් වැඩසටහන (ව්‍යාපෘති ආයෝජන සංරචකය) | එ.ජ. ඩොලර් | 66.0 | 13,193.4 | 66.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 0.7 | බැඳීම් ගාස්තු 0.15% | 8 | 29 |

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය හෝ වැඩසටහන | එකඟතා ප්‍රමාණය (මිලියන )* | | | | මූල්‍ය කොන්දේසි | | | වෙනත් කොන්දේසි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොළිය වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය /උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| **වෙළෙඳපොළ ණය** | | | | | | | | | | | | | |
| චීන සංවර්ධන බැංකුව | ණය | 12/4/2021 | විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් | එ.ජ. ඩොලර් | 500.0 | 99,955.0 | 500.0 | විචල්‍ය | ඇ.ඩො. සඳහා LIBOR | 2.51 | මූලික ගෙවීම 1.25% | 3 | 10 |
| | ණය | 17/08/2021 | විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් | චීන යුවාන් | 2,000.0 | 61,723.1 | 308.7 | විචල්‍ය | LPR 5Y | 0.2 | මූලික ගෙවීම 1.25% | 3 | 10 |
| **එකතුව** | | | | | | **339,048.5** | **1,709.9** | | | | | | |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන් :

*LIBOR* = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය

*LPR 5Y* = චීන මහජන බැංකුවේ අනුමැතිය යටතේ ජාතික අන්තර් බැංකු අරමුදල් මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද පස් අවුරුදු වෙළෙඳපොළ ණය පොලී අනුපාතය

වි.ගැ.හි. = විශේෂ ගැණුම් හිමිකම්

* මෙම ප්‍රදාන දෙකෙහි උපයෝජන යුරෝපා සංගමය මගින් සිදු කරන අතර පරිපාලනය ලෝක බැංකුව මගින් සිදුවේ.

* * පැතිරුණු විචල්‍යය : අනුපාතය අදාල වේ. ගිවිසුම් අත්සන් කරන විට එය 0.72 % ක් වූ අතර සෑම ගෙවීම් කාල පරිච්ඡේදයක් සඳහාම මෙම ආන්තිකය සංශෝධනය කෙරේ. එක් එක් ගිවිසුම් දිනට පවතින සාමාන්‍ය විනිමය අනුපාතයන්ට අනුව විවිධ විනිමයෙන් සිදු කෙරෙන මූල්‍ය වටිනාකම ඇ.ඩොලර් හා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්ථනය කෙරේ.

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි සහ උපයෝජනය

අගුළු ලැම් ඇතුළු නොයෙකුත් බාධාකාරී තත්ත්වයන් හමුවේ වුව ද, විදේශ මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජය විසින් 2021 වසරේ පළමු මාස අට තුළ දී විදේශ අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කරන ලදී. 2020 වසරේ පළමු මාස අටට සාපේක්ෂව මුළු විදේශ මූල්‍යනයේ ප්‍රතිලබ්ධිය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1601.7 ක් දක්වා සියයට 16 කින් වැඩි වූ අතර, එය ණය ලෙස ඇ.ඩො. මිලියන 1,592.3 කින් ද ප්‍රදාන ලෙස ඇ.ඩො. මිලියන 9.4 කින් ද සමන්විත වේ.

2021 වසරේ පළමු මාස අට තුළ සිදු කළ ප්‍රතිලබ්ධි වලින් ඉහළම ප්‍රමාණය බහු පාර්ශවික නියෝජිත ආයතන සමඟ ඇතිකරගත් ණය ගිවිසුම් හරහා සිදුවූ අතර, එම උපලබ්ධීන්ගෙන් සියයට 56 ක් ලෝක බැංකුව මඟින් ද, සියයට 40 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් ද වේ. උපලබ්ධීන්ගෙන් සියයට 16 ක් පමණ ද්විපාර්ශවික නිළ සංවර්ධන අධාර යටතේ ලබාගෙන ඇති අතර, ජපානය සියයට 30 කින්ද, චීනය සියයට 25 කින්ද ඒ සඳහා දායක වී ඇත. අයවැය ක්‍රියාකාරකම් සඳහා සහාය දීමට ඇ. ඩො. මිලියන 500 ක් සහ තවත් රෙන්මින්බි යුආන් 2,000 ක විදේශ මුදල් කාලීන මූල්‍ය පහසුකම් ලබාගෙන ඇත. ප්‍රතිලබ්ධි වලින් බහුතරය, එනම් සියයට 14 ක් පමණ මාර්ග හා පාලම් අංශයේ ව්‍යාපෘති වලට උපයෝජනය පිණිස යොදවා ඇති අතර, සියයට 9 ක් සෞඛ්‍ය හා සමාජ සුබසාධනයට ද, සියයට 7 ක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාවට ද, සියයට 3 ක් නිවාස හා නාගරික සංවර්ධනය යන අංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලටද උපයෝජනය කර ඇත.

**වගුව 1.18 : විදේශ ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා**


| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (ඇ.ඩො. මිලියන)[අ] | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වීය** | **256.3** | **0.04** | **256.3** |
| චීනය | 69.7 | - | 69.7 |
| ජපානය | 74.9 | - | 74.9 |
| නෙද(ර්)ලන්තය | 23.1 | - | 23.1 |
| ඉන්දියාව | 19.2 | - | 19.2 |
| ප්‍රංශය | 15.1 | - | 15.1 |
| හංගේරියාව | 11.8 | - | 11.8 |
| ඔස්ට්‍රියාව | 11.2 | - | 11.2 |
| එක්සත් රාජධානිය | 9.7 | - | 9.7 |
| කුවේටය | 7.0 | - | 7.0 |
| සෞදි අරාබිය | 7.6 | - | 7.6 |
| කොරියාව | 4.0 | - | 4.0 |
| ස්පාඤ්ඤය | 2.8 | - | 2.8 |
| ඩෙන්මා(ර්)කය | 0.2 | - | 0.2 |
| **බහුපාර්ශ්වීය** | **536.0** | **9.4** | **545.4** |
| ලෝක බැංකුව | 301.8 | 0.6 | 302.4 |
| ආසියානු සංවර්ධන බැංකුව | 212.1 | 4.6 | 216.7 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 10.9 | - | 10.9 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 9.0 | - | 9.0 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | 2.2 | - | 2.2 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | - | 3.0 | 3.0 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | - | 1.2 | 1.2 |
| **වාණිජ ණය** | **800.0** | **-** | **800.0** |
| චීන සංවර්ධන බැංකුව | 800.0 | - | 800.0 |
| **එකතුව** | **1,592.3** | **9.4** | **1,601.7** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී 2021 අගෝස්තු 31 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත


(අ) තාවකාලික

**රූපසටහන 1.5 : එක් එක් අංශය වෙනුවෙන් 2021 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

**රූපසටහන 1.6 : පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව 2021 අගෝස්තු 31 දිනට (ඇ.ඩො. මිලියන)**





*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

### එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය*

දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 ත් අතර කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2021 වසරේ අගෝස්තු මස 31 දින වන විට ඇ.ඩො. මිලියන 7,939 ක් විය. එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් ඉහළම ප්‍රමාණය චීනය විසින් ද, අනතුරුව පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව, ජපානය සහ ලෝක බැංකුව විසින් ද ලබා දීමට නියමිතය.

මෙයින් සියයට 21 ක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 18 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 14 ක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**රූපසටහන 1.7 : 2021 අගෝස්තු 31 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (ඇ.ඩො. මිලියන)**





*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

### විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2021 වසරේ අගෝස්තු මස 31 දින වන විට, මධ්‍යම රජය ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 33.9[1] කි. තවද, 2021 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 2,767 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 1,978 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 789 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත. 2021 ජූලි මාසයේ දී පියවන ලද ඇ. ඩො. මිලියන 1,000 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වටිනාකමද මීට ඇතුලත්ය.

**රූපසටහන 1.8 : 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා ණය සේවාකරණ ගෙවීම් සහ 2021 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ පුරෝකථන**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

---

[1]භාණ්ඩාගාර බිල්පත් හී අනේවාසික ආයෝජන හා රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.

[2]මුළු ණය සේවාකරණය = පොලී ගෙවීම් + වාරික ආපසු ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාරයන්හී ණය සේවාකරණය අඩංගු නොවේ.

# ආර්ථික උපනතීන් | 02


## 2.1 සමාලෝචනය

මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාව වන විට ලෝකය (කොවිඩ්-19 වසංගතය සමග) අඛණ්ඩව දෙවන වසරටත් අරගලයක යෙදී සිටී. වේගවත් එන්නත්කරණය සහ වසංගතයේ මූලික ආරක්ෂණ පියවරයන් වන සමාජ දුරස්ථභාවය රැකගැනීම හා මුහුණු ආවරණයන් පැළඳීම වැනි අනෙකුත් ඖෂධීය නොවන ක්‍රියාමාර්ග තුළින් වසංගතය කළමනාකරණය කිරීමේ දී ශ්‍රී ලංකාව බහුවිධ ප්‍රවේශයකට එළඹ ඇත. 2021 හා 2022 වසරවල් තුළ ගෝලීය ආර්ථික වර්ධනය මීට පෙර පුරෝකථනය කර තිබූ ඇස්තමේන්තුවලට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ "ලෝක ආර්ථික ඉදිරි දැක්ම" (World Economic Outlook) මගින් 2021 වසරේ අප්‍රේල් මස අපේක්ෂා කළ ඉහළ ගෝලීය ආර්ථික වර්ධනය, ඔක්තෝබර් මස නිකුත් කළ ඉදිරි දැක්ම වාර්තාව මගින් 2021 වසර සඳහා සියයට 5.9 ක් හා 2022 වසර සඳහා සියයට 4.9 ක් ලෙස පහත දමා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2020 වසරේ සියයට 3.6 ක ආර්ථික සංකෝචනයේ සිට "V - හැඩැති" යථා තත්ත්වයට පත්වීමක් පිළිබිඹු කරමින් 2021 වසරේ පළමු භාගයේ දී සියයට 8.0 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. 2020 වසරේ තුන්වන සහ සිව්වන කාර්තුවේ සිට ආර්ථිකය යථාතත්වයට පත්වීම දක්නට ලැබුණු අතර එය 2021 වසරේ පළමු භාගයේ දී තවදුරටත් ශක්තිමත් වෙමින් පළමු කාර්තුව තුළ සියයට 4.3 ක වර්ධනයක් සහ දෙවන කාර්තුවේ දී සියයට 12.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

2021 වසරේ පළමු කාර්තුවේ පැවති සියයට 5.7 ක් වූ සේවා වියුක්ති අනුපාතය, 2021 වසරේ දෙවන කාර්තුව වන විට සියයට 5.1 ක් දක්වා පහත වැටුණි. වේගවත් එන්නත්කරණ වැඩසටහන හා සංචරණ සීමා ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාරකම් යළි ආරම්භ කිරීමත් සමග 2020 වසරේ දී වාර්තා වූ රැකියා අහිමිවීම් 2021 වසරේ දී යථා තත්ත්වයට පත්විය. මේ අතරම, ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩවල ඉහළ මිල ගණන් සමග ඉහළ යන ලද ප්‍රවාහන වියදම් ඉහළ යාම හේතු කොට ගෙන 2021 වසරේ දී උද්ධමනයේ ඉහළ යාමක් වාර්තා කරන ලදී. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 5.7 සිට 2021 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී සියයට 7.6 දක්වා වර්ධනය විය. වාර්ෂික පදනම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය ද, 2021 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී සියයට 6.3 දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද උද්ධමන ඉලක්කය වූ සියයට 4-6 අගයෙන් අපගමනය වීමට 2021 වසරේ උද්ධමනය මත ඇතිවූ පීඩනය හේතු වී ඇත. කෙසේ වුවද, 2022 වසරේ දී එය ස්ථාවර වෙතැයි අපේක්ෂා කෙරේ.

**රූපසටහන 2.1 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ප්‍රතිපත්ති පොලී අනුපාත සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාත (SRR) පහත හෙළීම මගින් අඩු පොලී අනුපාත තන්ත්‍රයක් නිර්මාණය කරමින් වෙළෙඳපොළට ද්‍රවශීලතාවය එක් කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලෝකයේ අනෙකුත් මහ බැංකු සහ මූල්‍ය මණ්ඩල මෙන් 2020 සහ 2021 වසරේ වැඩි කාලයක් තුල ලිහිල් මුදල් ප්‍රතිපත්තියකට අනුගත වන ලදී. කෙසේ වුවද, ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්වීමත් සමගම උද්ධමන පීඩන කළමනාකරණය කිරීම සඳහා 2021 වසරේ අගෝස්තු සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයකට යොමු වී ඇත. 2021 වසරේ පළමු මාස අට තුළ පුද්ගලික සහ රාජ්‍ය අංශය සඳහා වූ ණය වැඩිවීමත් සමග ආර්ථිකය යථාතත්වයට පත්වීම තවදුරටත් පිළිඹිබු විය. ඒ අනුව, පුළුල් මුදල් වර්ධනය මෙම කාලපරිච්ඡේදය තුළ ඉහළ යමින් පැවතුනි.

2021 වසරේ අගෝස්තු මාසයේ දී ප්‍රධාන ගෝලීය වෙළෙඳපොළ අතර ඉහළම ලාභයක් වාර්තා කරමින්, 2021 වසරේ පළමු මාස අට තුළ කොටස් වෙළෙඳපොළ ඉහළ වර්ධනයක් පවත්වාගෙන යන ලදී. සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) හා S&P SL20 දර්ශකය වර්ධනය විය. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට වාර්තා වූ රු. බිලියන 2,596 ට සාපේක්ෂව වෙළඳපොල ප්‍රාග්ධනීකරණය ඉහළම අගයක් වාර්තා කිරීමෙන් 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 4,216 ක් දක්වා ඉහළ යන ලදී. මේ අතර, 2010 වසරේ සිට ඉහළම සාමාන්‍ය පිරිවැටුම වූ රු. බිලියන 793 2021 වසරේ සැප්තැම්බර් මස දී වාර්තා කරන ලදී.

සැපයුම් දාම වලට බාධා පමුණුවමින් වරාය හා ගුවන් තොටුපල වසා දැමීම සඳහා හේතු වූ අගුළු ලා දැමීම හේතුවෙන් විදේශ අංශය වෙත අඛණ්ඩව අභියෝග එල්ල වුවද, විදේශ අංශය 2021 වසරේ ජූනි මස සිට අඛණ්ඩව මාස තුනක් අපනයන ආදායම ඇ.ඩො. මිලියන 1,000 ඉක්මවා වාර්තා කරමින් 2021 වසරේ පළමු මාස අට තුළ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 7,903 වාර්තා කරගෙන ඇත.

ජාත්‍යන්තර භාණ්ඩවල මිල ඉහළ යාමත් සමග වෙළෙඳ හිඟය පුළුල් වීම හේතුවෙන් 2021 වසරේ පළමු මාස අට තුළ 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන වියදම ඉහළ යන ලදී. සංචාරක ව්‍යාපාරය සහ සේවක ප්‍රේෂණ යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2021 වසරේ අගෝස්තු මස අවසන් වන විට ඇ.ඩො. බිලියන 3.5 ක දළ නිල සංචිත ප්‍රමාණයක් පැවතුණි.


## 2.2 ආර්ථික වර්ධනය

කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා අංශවල වර්ධනය මෙන්ම පදනම් වර්ෂයේ ආර්ථික පසුබෑමේ බලපෑමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 9.1 ක ආර්ථික සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 8.0 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ධාන්‍ය, රබර්, තේ, වී, තෙල් සහිත පළතුරු බෝග වගාවන්හි සහ සත්ත්ව නිෂ්පාදනයේ සිදුවූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශයේ යලි පිබිදීමක් 2021 වසරේ පළමු භාගයේ දී ඇති වූ අතර, 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පැවති සියයට 7.3 ක පසුබෑමට සාපේක්ෂව සියයට 7.1 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2020 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත අංශයේ පැවති සියයට 14.6 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 12.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන සහ මලාපවහන, අපද්‍රව්‍ය, පිරිසිදු කිරීම සහ බැහැර කිරීමේ ක්‍රියාකාරකම් හැර කර්මාන්ත අංශයේ අනෙකුත් සියළුම උප අංශයන්හි පුළුල් වීම මෙම ධනාත්මක වර්ධනය සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන් පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්, ගබඩා පහසුකම් සැපයීම සහ භාණ්ඩ හා මගී ප්‍රවාහනය, විදුලි සංදේශ, මූල්‍ය සහ රක්ෂණ සේවාවන්හි සිදු වූ වර්ධනය හේතුවෙන් 2020 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 5.2 ක පසුබෑමට සාපේක්ෂව සේවා අංශය ද 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 5.1 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. 2021 වසරේ පළමු භාගය තුළ දී බදු සහ සහනාධාර අතර වෙනසේ එකතු කළ අගය සියයට 22.0 කින් වැඩි විය.

### කෘෂිකර්මය

ද.දේ.නි.යට සියයට 7.2 ක දායක වන කෘෂිකාර්මික අංශය, 2020 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 7.3 ක පහත වැටීමට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 7.1 කින් වර්ධනය විය. සත්ත්ව නිෂ්පාදනය, ශාක ව්‍යාප්තිය, ධාන්‍ය වගාව, රබර්, තෙල් සහිත පළතුරු බෝග සහ තේ වගාව වැනි අංශයන්හි සිදු වූ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, වී, වෙනත්

රූපසටහන **2.2 :** දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය 2021 පළමු භාගය




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වගුව 2.1 : ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය

රු. මිලියන

| | අංශය | 2018 | 2019 | 2020(ආ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2020(ආ) | 2021(අ) | 2020 | 2021 |
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **679,702** | **686,412** | **669,802** | **306,122** | **327,846** | **-7.3** | **7.1** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 11,829 | 10,582 | 14,957 | 6,873 | 8,316 | 22.1 | 21.0 |
| 2 | වී වගාව | 70,380 | 74,169 | 78,417 | 27,925 | 26,371 | 16.0 | -5.6 |
| 3 | එළවළු වගාව | 55,230 | 53,248 | 58,606 | 28,078 | 29,248 | 8.4 | 4.2 |
| 4 | උක් වගාව,දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 1,820 | 2,000 | 2,339 | 1,224 | 1,259 | 21.1 | 2.8 |
| 5 | පළතුරු වගාව | 55,654 | 60,399 | 64,156 | 30,274 | 32,304 | 5.6 | 6.7 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 57,577 | 67,742 | 60,804 | 29,444 | 32,461 | -14.7 | 10.2 |
| 7 | තේ වගාව | 67,170 | 66,329 | 61,621 | 28,829 | 35,610 | -17.9 | 23.5 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 1,592 | 1,181 | 1,437 | 718 | 708 | 20.4 | -1.5 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 66,914 | 66,223 | 68,437 | 33,583 | 35,188 | -0.6 | 4.8 |
| 10 | රබර් වගාව | 25,158 | 22,779 | 23,831 | 11,445 | 13,257 | -10.1 | 15.8 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 16,303 | 16,380 | 16,681 | 8,139 | 8,009 | -1.0 | -1.6 |

රු. මිලියන


| | අංශය | 2018 | 2019 | 2020[(ආ)] | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2020[(ආ)] | 2021[(අ)] | 2020 | 2021 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 63,418 | 64,744 | 61,566 | 27,536 | 30,602 | -9.7 | 11.1 |
| 13 | පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 9,258 | 8,404 | 8,363 | 4,123 | 4,602 | -1.4 | 11.6 |
| 14 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 58,920 | 58,846 | 54,066 | 22,401 | 23,489 | -20.6 | 4.9 |
| 15 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 102,175 | 96,589 | 75,593 | 37,937 | 37,611 | -23.4 | -0.9 |
| 16 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව | 16,304 | 16,797 | 18,930 | 7,590 | 8,810 | -1.7 | 16.1 |
| | **කර්මාන්ත** | **2,541,186** | **2,608,211** | **2,427,844** | **1,126,428** | **1,262,468** | **-14.6** | **12.1** |
| 17 | පතල් හා කැණීම් කර්මාන්තය | 225,505 | 231,893 | 202,873 | 90,981 | 99,995 | -23.1 | 9.9 |
| 18 | ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 559,356 | 574,888 | 599,902 | 290,844 | 307,491 | 2.0 | 5.7 |
| 19 | රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 324,565 | 326,803 | 287,844 | 135,957 | 165,915 | -22.7 | 22.0 |
| 20 | ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 34,233 | 31,178 | 28,725 | 12,855 | 14,820 | -6.6 | 15.3 |
| 21 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 32,884 | 30,803 | 30,094 | 15,369 | 17,989 | -10.1 | 17.0 |
| 22 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 27,312 | 33,694 | 30,026 | 15,471 | 10,988 | -21.0 | -29.0 |
| 23 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 97,851 | 100,511 | 101,312 | 46,317 | 53,848 | -10.5 | 16.3 |
| 24 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 85,933 | 83,009 | 68,334 | 24,556 | 35,424 | -33.6 | 44.3 |
| 25 | ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන | 81,764 | 85,341 | 81,844 | 36,576 | 46,312 | -14.1 | 26.6 |
| 26 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 48,491 | 46,328 | 45,017 | 21,180 | 25,245 | -1.2 | 19.2 |
| 27 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 51,697 | 52,578 | 51,285 | 20,361 | 24,441 | -11.7 | 20.0 |
| 28 | ගෘහ භාණ්ඩ  නිෂ්පාදන | 92,997 | 100,797 | 87,299 | 44,788 | 55,957 | -22.4 | 24.9 |
| 29 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම | 76,589 | 75,040 | 69,623 | 31,726 | 35,289 | -13.3 | 11.2 |
| 30 | විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 100,382 | 104,437 | 102,758 | 49,985 | 53,719 | -4.3 | 7.5 |
| 31 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 14,351 | 15,139 | 15,866 | 7,867 | 8,132 | 4.2 | 3.4 |
| 32 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 30,207 | 32,403 | 32,078 | 16,142 | 15,225 | -0.7 | -5.7 |
| 33 | ඉදිකිරීම් කර්මාන්තය | 657,070 | 683,371 | 592,963 | 265,453 | 291,677 | -22.6 | 9.9 |
| | **සේවාවන්** | **5,555,325** | **5,678,485** | **5,595,469** | **2,583,781** | **2,715,766** | **-5.2** | **5.1** |
| 34 | තොග හා සිල්ලර වෙළඳාම | 1,040,360 | 1,071,847 | 1,086,937 | 567,332 | 580,605 | 1.2 | 2.3 |
| 35 | මගීන්  හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,034,755 | 1,048,825 | 978,455 | 367,400 | 397,172 | -17.1 | 8.1 |
| 36 | තැපැල් හා කුරියර් සේවාවන් | 4,485 | 4,752 | 4,975 | 2,328 | 2,422 | 3.6 | 4.0 |
| 37 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 154,794 | 147,671 | 89,452 | 50,186 | 43,438 | -32.9 | -13.4 |
| 38 | ගුවන්විදුලි සහ රූපවාහිනී  විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 2,519 | 2,639 | 2,702 | 1,338 | 1,384 | 0.1 | 3.5 |
| 39 | විදුලි සංදේශ සේවාවන් | 45,830 | 53,695 | 61,990 | 30,829 | 36,788 | 16.0 | 19.3 |
| 40 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 15,072 | 17,044 | 18,752 | 8,892 | 10,659 | 7.0 | 19.9 |
| 41 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 687,918 | 701,891 | 778,258 | 379,021 | 431,359 | 7.8 | 13.8 |

| | අංශය | 2018 | 2019 | 2020(ආ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2020(ආ) | 2021(අ) | 2020 | 2021 |
| 42 | රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 112,515 | 117,446 | 118,134 | 39,871 | 45,016 | -3.5 | 12.9 |
| 43 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 566,078 | 579,601 | 572,799 | 270,350 | 282,797 | -6.0 | 4.6 |
| 44 | වෘත්තීයමය සේවාවන් | 165,550 | 169,523 | 164,949 | 77,784 | 80,286 | -6.8 | 3.2 |
| 45 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 428,022 | 437,065 | 443,960 | 202,661 | 205,119 | 0.8 | 1.2 |
| 46 | අධ්‍යාපනය | 179,524 | 185,116 | 186,712 | 91,435 | 92,262 | 3.8 | 0.9 |
| 47 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 179,356 | 182,777 | 190,706 | 85,331 | 88,404 | 3.2 | 3.6 |
| 48 | වෙනත් පෞද්ගලික සේවාවන් | 938,547 | 958,592 | 896,688 | 409,024 | 418,056 | -13.5 | 2.2 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **8,776,212** | **8,973,108** | **8,693,114** | **4,016,331** | **4,306,080** | **-8.2** | **7.2** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු(-) සහනාධාර** | **889,166** | **910,242** | **837,491** | **211,420** | **257,894** | **-23.0** | **22.0** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළෙඳපොළ මිල** | **9,665,379** | **9,883,350** | **9,530,606** | **4,227,751** | **4,563,974** | **-9.1** | **8.0** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
(අ) තාවකාලික
(ආ) සංශෝධිත

පානීය භෝග, අනෙකුත් බහු වාර්ෂික බෝග වගාවන් සහ කරදිය ධීවර කර්මාන්තය ඍණාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

**රූපසටහන 2.3 : කෘෂිකාර්මික අංශයේ සංයුතිය 2021 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### වී

වී වගාවේ එකතු කළ අගය 2020 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 16.0 ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 5.6 කින් සංකෝචනය වී ඇත. සමස්ත වී නිෂ්පාදනය 2020 වසරේ පැවති මෙට්‍රික් ටොන් මිලියන 5.1 ට සාපේක්ෂව 2021 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 5.2 ක් දක්වා ඉහළ යනු ඇත. 2020/21 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.1 ක් වූ අතර, 2021 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.1 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2019/20 මහ කන්නයේ අස්වද්දන ලද හෙක්ටයාර් 752,248 ක භූමි ප්‍රමාණයට සාපේක්ෂව 2020/21 මහ කන්නයේ අස්වද්දන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර් 770,240 ක් දක්වා වැඩි වී ඇත.

### තේ, රබර් සහ පොල්

2020 වසරේ පළමු භාගයට සාපේක්ෂව තේ, රබර් සහ තෙල් සහිත පළතුරු බෝග යන උප අංශයන්හි එකතු කළ අගය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පිළිවෙළින් සියයට 23.5, සියයට 15.8 සහ සියයට 10.2 කින් වැඩි විය. 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 179.4 ක තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 211.7 ක් දක්වා සියයට 18.0 කින් වැඩි විය. රට අගුළු ලා තිබියදී පවා කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට රජය ලබා දුන් සහයෝගය මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, 2021 වසරේ පළමු මාස අට තුළ දී කොළඹ තේ වෙන්දේසියේ දී තේ කිලෝග්‍රෑමයක මාසික සාමාන්‍ය මිල රු. 591.70 ක් දක්වා සියයට 8.1 කින් පහළ ගියේය. එසේම, රබර් සඳහා ඉල්ලුම ඉහළයාම නිසා ඇතිවූ ආකර්ෂණීය මිල ගණන් හේතුවෙන් 2021 වසරේ පළමු මාස අට තුළ දී රබර් නිෂ්පාදනය 2020 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 56.3 ක් දක්වා සියයට 12.1 කින් වැඩි විය. කොළඹ රබර් වෙන්දේසියේ 2020 වසර අවසානය වන විට රු. 450 ක් ව පැවති ක්‍රේප් රබර්

(IX) කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 680 ක් දක්වා සියයට 51.1 ක සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2021 වසරේ පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් පොල් නිෂ්පාදනය ද, 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ ගෙඩි මිලියන 1,848.3 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගෙඩි මිලියන 2,034.6 ක් දක්වා සියයට 10.1 කින් වැඩි වී ඇත. අපනයන වෙළෙඳපොළ අවශ්‍යතා සැළකිල්ලට ගෙන පොල් සඳහා වන අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා 2021 වසරේ ජූලි මාසයේ දී පොල් පැල 100,000 ක් රට පුරා පැල කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවා ඇත.

**ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ බෝග**

ආහාර සුරක්ෂිතතාවය ළඟාකර ගැනීම වෙනුවෙන් ධාන්‍ය වැනි කෘෂිකාර්මික භෝගයන්හි දේශීය නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ ලබමින්, පළමු භාගය තුළ දී අගය එකතු කළ වටිනාකම මත සියයට 21.0 ක වර්ධනයක් වාර්තා කරමින් ධාන්‍ය නිෂ්පාදනය කෘෂිකාර්මික අංශයේ සමස්ත වර්ධනයට ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. 2021 වසරේ පළමු භාගය තුළ දී අගය එකතු කළ වටිනාකම මත එළවළු නිෂ්පාදනය සියයට 4.2 කින් සහ පළතුරු නිෂ්පාදනය සියයට 6.7 කින් ඉහළ ගියේය. 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ සියයට 0.6 ක පසුබෑමට සාපේක්ෂව අගය එකතු කළ වටිනාකම මත කුළුබඩු, සුවඳ දෙන බෝග, ඖෂධ සහ ඖෂධ නිෂ්පාදන 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.8 කින් වර්ධනය විය.

**ධීවර හා පශු සම්පත්**


කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීවී වගා උප අංශය අගය එකතු කළ වටිනාකම මත 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 23.4 ක පහත වැටීමට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.9 කින් පහළ ගියේය. එනමුත්, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගා උප අංශය 2020 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 1.7 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 16.1 කින් වර්ධනය විය.

මත්ස්‍ය නිෂ්පාදනය, 2020 වසරේ මුල් මාස අටක කාලපරිච්ඡේදයේ වාර්තා කළ මෙට්‍රික් ටොන් 283.5 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මෙට්‍රික්ටොන් 282.8 ක් දක්වා සියයට 0.2 කින් සුළු වශයෙන් අඩු වී ඇත. 2020 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 9.7 ක පසුබැස්මට සාපේක්ෂව සත්ත්ව නිෂ්පාදන උප අංශය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී අගය එකතු කළ වටිනාකම මත සියයට 11.1 කින් වර්ධනය විය.

**කර්මාන්ත හා නිෂ්පාදන**

කර්මාන්ත අංශය, 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 14.6 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 12.1 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය (සියයට 44.3), රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය (සියයට 22.0), ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය (සියයට 5.7), ඉදිකිරීම් (සියයට 9.9), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 24.9) යන අංශවල පුළුල් වීම හේතුවිය. පතල් හා කැණීම් (සියයට 9.9), රසායනික නිෂ්පාදන සහ මූලික ඖෂධමය නිෂ්පාදන (සියයට 16.3), මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන (සියයට 19.2), වෙනත් නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම හා සවිකිරීම (සියයට 11.2) වැනි අංශ ද.දේ.නි.යට ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. එසේම 2021 වසරේ පළමු භාගය තුළ දී කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය, මුද්‍රණ කටයුතු සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි නැවත නිෂ්පාදනය (සියයට 17.0), අනෙකුත් ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන (සියයට 26.6), යන්ත්‍රෝපකරණ නිෂ්පාදන (සියයට 20.0), ගෘහභාණ්ඩ හැර දව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 15.3), ජලය එක්රැස්කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම (සියයට 3.4) යන අංශ ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. එනමුත්, 2021 වසරේ පළමු භාගය තුළ දී අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදනය සහ මලාපවහන කටයුතු, කසල කළමණාකරණය සහ ප්‍රතිචක්‍රීයකරණය ක්‍රියාකාරකම් පිළිවෙළින් සියයට 29.0 කින් සහ සියයට 5.7 කින් පහත වැටුණි.

**රූපසටහන 2.4 : කර්මාන්ත අංශයේ සංයුතිය 2021 පළමු භාගය**





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

2021 වසරේ පළමු භාගයේ දී විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයුමේ අගය එකතු කළ වටිනාකම සියයට 7.5 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සමස්ත බලශක්ති උත්පාදනය 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ ගිගාවොට් පැය 7,632 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය

තුළ ගිගාවොට් පැය 8,120 ක් දක්වා සියයට 6.4 කින් ඉහළ ගියේය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල වර්ධනය නිරූපණය කරමින් 2020 වසරේ පළමු භාගයට සාපේක්ෂව කර්මාන්ත අංශය සඳහා 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අලෙවි කළ විදුලිය ඒකක ප්‍රමාණය ගිගාවොට් පැය 2,343 ක් දක්වා සියයට 24.7 කින් වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළ පැවති අධික වර්ෂාවේ ප්‍රතිඵලයක් ලෙස ජල, තාප (ඉන්ධන), තාප (ගල් අඟුරු) හා සුළං ඇතුළු සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති වශයෙන් වන උත්පාදන අනුපාතය 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ 20:29:41:10 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 26:21:40:13 දක්වා වාසිදායක ලෙස වෙනස් විය.

**රූපසටහන 2.5 : නිෂ්පාදන අංශයේ සංයුතිය 2021 පළමු භාගය**





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**සේවා අංශය**

සේවා අංශය, 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 5.2 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.1 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (සියයට 8.1), පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා ඊ සම්බන්ධ කාර්යයන් (සියයට 19.9), විදුලි සංදේශ (සියයට 19.3), මූල්‍ය සේවා හා අතිරේක මූල්‍ය සේවා (සියයට 13.8) සහ රක්ෂණ, ප්‍රතිරක්ෂණ හා විශ්‍රාම අරමුදල් (සියයට 12.9) යන අංශවල පුළුල් වීම හේතු වී ඇත. තොග සහ සිල්ලර වෙළඳාම (සියයට 2.3), තැපැල් සහ කුරියර් සේවා (සියයට 4.0), ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය හා විකාශනය (සියයට 3.5), නිවාස අයිතිය හා දේපල වෙළඳාම් කටයුතු (සියයට 4.6) වැනි අංශ ද.දේ.නි. යට ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. එසේම, 2021 වසරේ පළමු භාගය තුළ දී වෘත්තීයමය සේවාවන් (සියයට 3.2), රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක (සියයට 1.2), අධ්‍යාපන (සියයට 0.9), සෞඛ්‍ය සේවාවන් (සියයට 3.6) සහ අනෙකුත් පෞද්ගලික සේවාවන්හි (සියයට 2.2) අගය එකතු කළ වටිනාකමේ ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. එසේ වුවද, සංචාරක අංශයේ පසුබැස්ම සහ පළාත් අතර සංචරණ සීමා පැනවීම හේතුවෙන් නවාතැන් හා ආහාර පාන සැපයීමේ සේවාවන් 2021 වසරේ පළමු භාගයේදී සියයට 13.4 කින් පහත බැස ඇත.

**රූපසටහන 2.6 : සේවා අංශයේ සංයුතිය 2021 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**තොග සහ සිල්ලර වෙළෙඳාම, භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා පහසුකම් හා මගී සේවා**

තොග සහ සිල්ලර වෙළෙඳාම් කටයුතු 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.3 කින් වර්ධනය විය. ප්‍රවාහන අංශය, 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 17.1 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 8.1 කින් වර්ධනය විය. 2020 වසරේ පළමු මාස නවය තුළ දී ලියාපදිංචි කළ නව වාහන සංඛ්‍යාව 180,886 ක් වූ අතර එය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 24,909 දක්වා විශාල වශයෙන් පහත වැටී ඇත. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විදේශ අංශයේ අභියෝග කළමනාකරණය සඳහා වන ක්‍රමෝපායේ කොටසක් ලෙස රජය විසින් වාහන මත පනවන ලද ආනයන සීමාවන්ය.

2021 වසරේ පළමු මාස නවය තුළ දී මෝටර් කාර් ලියාපදිංචි කිරීම සියයට 85.5 කින් පහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී බස් රථ, ත්‍රීරෝද රථ සහ යතුරුපැදි ලියාපදිංචි කිරීම පිළිවෙළින් සියයට 53.3 කින්, සියයට 70.5 කින් සහ සියයට 95.8 කින් අඩු විය. එසේ වුවද, 2021 වසරේ පළමු මාස නවය තුළ දී භාණ්ඩ ප්‍රවාහන රථ සහ ගොඩබිම් වාහන ලියාපදිංචිය පිළිවෙළින් සියයට 4.5 කින් සහ සියයට 79.9 කින් වැඩි වී ඇත.

2020 වසරේ පළමු මාස අට තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක

2.2 වගුව : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්

| දර්ශකය | 2017 | 2018 | 2019 | 2020(අ) | 2020(අ) | 2021(අ) |
|---|---|---|---|---|---|---|
| වරාය සේවා | | | | | ජන. - අගෝ. | ජන. - අගෝ. |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,879 | 4,874 | 4,707 | 4,337 | 2,925 | 2,823 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. '000) | 93,857 | 104,934 | 106,979 | 102,908 | 67,103 | 73,765 |
| මෙහෙයවන ලද මුළු බහාළුම් ( TEU' 000) | 6,209 | 7,047 | 7,228 | 6,855 | 4,545 | 4,797 |
| ප්‍රතිනැව්ගත කිරීම (ආ) | 4,826 | 5,704 | 5,955 | 5,765 | 3,843 | 3,987 |
| විදුලි සංදේශ අංශය | | | | | ජූනි අවසානය | ජූනි අවසානය |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000) | 2,603 | 2.485 | 2,300 | 2,613 | 2.328 | 2,870 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 28,199 | 32,528 | 32,884 | 28,739 | 27,679 | 29,049 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,405 | 1,269 | 1,055 | 1,367 | 1,074 | 1,618 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000) | 6,747 | 10,563 | 13,408 | 17,524 | 13,295 | 20,629 |
| සෞඛ්‍ය අංශය | | | | | ජූනි අවසානය | ජූනි අවසානය |
| පෞද්ගලික රෝහල් | 181 | 191 | 207 | 217 | 209 | 227 |
| රජයේ රෝහල් | 612 | 612 | 603 | 609 | 605 | 609 |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 76,569 | 76,824 | 77,964 | 77,121 | 78,526 | 77,121 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 20,349 | 19,692 | 18,130 | 19,615 | 18,041 | 18,992 |
| හෙදියන් සංඛ්‍යාව (රජයේ) | 34,221 | 34,714 | 38,276 | 37,634 | 38,569 | 38,743 |
| මූල්‍ය අංශය | | | | | ජන. - ජූනි | ජන. - ජූනි |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 6,213 | 6,882 | 7,387 | 3,619 | 3,615 | 3,620 |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,486,545 | 1,710,671 | 1,854,103 | 1,984,525 | 1,903,091 | 2,045,716 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් | 45 | 43 | 42 | 40 | 41 | 39 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 6 | 5 | 4 | 3 | 3 | 3 |
| සංචාරක අංශය | | | | | ජන. - සැප්. | ජන. - සැප්. |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 2,116,407 | 2,333,796 | 1,913,702 | 507,704 | 507,311 | 37,924 |
| සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | 3,925 | 4,381 | 3,607 | 682 | 682 | 51 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 73.3 | 72.8 | ලැ.නො | 15 | - | – |
| ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම) | | | | | ජන. - සැප්. | ජන. - සැප්. |
| බස් රථ | 3,331 | 2,957 | 1,613 | 578 | 507 | 237 |
| මෝටර් කාර් | 39,182 | 80,776 | 38,232 | 21,021 | 20,048 | 2,905 |
| ලොරි(ඇ) | 16,742 | 16,931 | 3,738 | 3,941 | 3,102 | 3,241 |
| යතුරු පැදි | 344,380 | 339,763 | 284,301 | 151,634 | 144,399 | 6,031 |
| ත්‍රිරෝද රථ | 23,537 | 20,063 | 15,490 | 7,150 | 7,040 | 2,080 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් (ඈ) | 13,049 | 10,282 | 7,666 | 8,302 | 5,790 | 10,415 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික
(ආ) නැවත (ඇසිරීම්) ඇතුළත් වේ.
(ඇ) විශේෂ කාර්ය වාහන, මෝටර් ලොරි සහ ලොරි අනෙකුත්
(ඈ) රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ.

(TEUs) මිලියන 4.5 ක් වූ අතර, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම සංඛ්‍යාව මිලියන 4.8 ක් දක්වා සියයට 5.5 කින් වැඩි විය. දේශීයව, ප්‍රතිනැව්ගත කිරීම් සඳහා සහ නැවත ගබඩාකිරීම් සඳහා 2021 වසරේ පළමු මාස අට තුළ දී මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව පිළිවෙළින් සියයට 15.2 කින්, සියයට 3.7 කින් සහ සියයට 39.9 කින් වැඩි විය. සමස්ත භාණ්ඩ මෙහෙයවීම් 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 67.1 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ

**වගුව 2.3 : සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපැයීම (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020[b] | 2021[a] | 2017 | 2018 | 2019 | 2020 [ආ] | 2021 [අ] |
| ජනවාරි | 219,360 | 238,924 | 244,239 | 228,434 | 1,682 | 407.0 | 448.5 | 460.3 | 307.0 | 2.3 |
| පෙබරවාරි | 197,517 | 235,618 | 252,033 | 207,507 | 3,366 | 366.3 | 442.3 | 475.0 | 278.9 | 4.5 |
| මාර්තු | 188,076 | 233,382 | 244,328 | 71,370 | 4,581 | 348.8 | 438.1 | 460.5 | 95.9 | 6.2 |
| අප්‍රේල් | 160,249 | 180,429 | 166,975 | - | 4,168 | 297.2 | 338.7 | 314.7 | - | 5.6 |
| මැයි | 121,891 | 129,466 | 37,802 | - | 1,497 | 226.1 | 243.0 | 71.2 | - | 2.0 |
| ජූනි | 123,351 | 146,828 | 63,072 | - | 1,614 | 228.8 | 275.6 | 118.9 | - | 2.2 |
| ජූලි | 205,482 | 217,829 | 115,701 | - | 2,429 | 381.1 | 408.9 | 218.1 | - | 3.3 |
| අගෝස්තු | 190,928 | 200,359 | 143,587 | - | 5,040 | 354.0 | 376.1 | 270.6 | - | 6.8 |
| සැප්තැම්බර් | 145,077 | 149,087 | 108,575 | - | 13,547 | 269.0 | 279.8 | 204.6 | - | 18.2 |
| ඔක්තෝබර් | 152,429 | 153,123 | 118,743 | - | – | 283.0 | 287.4 | 223.8 | - | – |
| නොවැම්බර් | 167,511 | 195,582 | 176,984 | - | – | 311.0 | 367.1 | 333.6 | - | – |
| දෙසැම්බර් | 244,536 | 253,169 | 241,663 | 393 | – | 453.0 | 475.2 | 455.5 | 0.5 | – |
| **එකතුව** | **2,116,407** | **2,333,796** | **1,913,702** | **507,704** | **37,924** | **3,925.3** | **4,380.7** | **3,606.8** | **682.3** | **51.0** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය
(අ) තාවකාලික
(ආ) සංශෝධිත

දී මෙට්‍රික් ටොන් මිලියන 73.8 දක්වා සියයට 9.9 කින් වැඩි විය. 2021 වසරේ දී ගෝලීය සැපයුම් දාමයන් 2020 වසරට සාපේක්ෂව යථා තත්ත්වයට පැමිණීම මෙම මධ්‍යස්ථ වර්ධනයට හේතු විය.

**නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා**

නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ අගය එකතු කළ වටිනාකම 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 32.9 ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 13.4 කින් පසුබෑමට ලක් විය. සංචාරකයින්ගේ පැමිණීම, 2020 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ 507,311 ක සංචාරකයින්ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ

දී 37,924 ක් දක්ව ා සියයට 92.5 කින් පහත බැස ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ පළමු මාස නවය තුළ දී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 51.1 ක් දක්වා සියයට 92.5 කින් සැලකිය යුතු ලෙස අඩු විය.

**විදුලි සංදේශ, පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය, තැපැල් සේවා**

සංචරණ සීමා පැනවීම සහ "නිවසේ සිට වැඩකිරීම" සංකල්පය හඳුන්වා දීම තුළ පරිශීලකයින්ගෙන් ඒ සඳහා උපයෝගී වන සේවාවන් සඳහා ඇති ඉල්ලුම ඉහළයාමෙන් විදුලි සංදේශ සේවා උප අංශය එහි අගය එකතු කළ වටිනාකම තවදුරටත් වැඩිකර ගනිමින් 2021 වසරේ පළමු භාගය තුළ දී සියයට 19.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ව්‍යාපාර ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම සඳහා ඇති ඉහළ ඉල්ලුමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ පළමු භාගය තුළ දී පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 19.9 කින් පුළුල් විය. මේ අතර, තැපැල් හා කුරියර් සේවාවන් 2020 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.0 කින් වර්ධනය විය.

**මූල්‍ය සේවා, රක්ෂණ හා දේපල වෙළෙඳාම් සහ වෙනත් සේවා**

මූල්‍ය හා සහායක මූල්‍ය සේවා අංශයේ අගය එකතු කළ වටිනාකම 2020 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 7.8 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 13.8 කින් වැඩි විය. මේ අතර, 2021 වසරේ පළමු භාගයේදී රක්ෂණ උප අංශය ද සියයට 12.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් වටිනාකම 2020 ජූනි මස අවසානයට පැවති රු. බිලියන 755.2 සිට 2021 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 814.6 ක් දක්වා සියයට 7.9 කින් වර්ධනය විය.

2020 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 6.0 ක පහත වැටීමට සාපේක්ෂව නිවාස අයිතිය සහ දේපල වෙළඳාම් කටයුතු 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය

**වගුව 2.4 : ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)**

| අංශය | 2016 | 2017 | 2018 | 2019 | 2020(ආ) | පළමු භාගය 2020(ආ) | පළමු භාගය 2021(අ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය** | **4.7** | **-3.7** | **-0.4** | **6.5** | **-2.4** | **-7.3** | **7.1** |
| තේ වගාව | -2.5 | -11.2 | 4.5 | 0.4 | -7.1 | -17.9 | 23.5 |
| වී වගාව | 25.0 | -31.3 | -7.1 | 44.7 | 5.7 | 16.0 | -5.6 |
| රබර් වගාව | -10.1 | -10.7 | 4.9 | -0.3 | 4.6 | -10.1 | 15.8 |
| ධාන්‍ය වගාව | 14.3 | -1.9 | 1.0 | -10.5 | 41.3 | 22.1 | 21.0 |
| එළවළු වගාව | 2.7 | 2.9 | -5.3 | 4.0 | 10.1 | 8.4 | 4.2 |
| සත්ව නිෂ්පාදන | 8.1 | 7.3 | 5.6 | 8.0 | -4.9 | -9.7 | 11.1 |
| වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 1.9 | 8.5 | 19.2 | -0.8 | -8.1 | -20.6 | 4.9 |
| ධීවර කර්මාන්තය | -2.5 | 1.6 | -0.5 | 0.2 | -16.6 | -20.4 | 2.0 |
| **කර්මාන්ත** | **4.1** | **1.2** | **3.0** | **6.7** | **-6.9** | **-14.6** | **12.1** |
| පතල් හා කැණීම් | -5.2 | 13.8 | -0.3 | -5.2 | -12.5 | -23.1 | 9.9 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 2.3 | 2.9 | 4.7 | 1.8 | -3.9 | -10.9 | 14.0 |
| අනෙකුත් කර්මාන්ත | 2.9 | 10.1 | 4.4 | 6.0 | -0.8 | -2.7 | 4.7 |
| ඉදිකිරීම් | -2.5 | 8.3 | 4.4 | -2.5 | -13.2 | -22.6 | 9.9 |
| **සේවා** | **3.8** | **6.5** | **5.3** | **4.2** | **-1.5** | **-5.2** | **5.1** |
| තොග හා සිල්ලර වෙළඳාම | 1.3 | 3.8 | 4.7 | 2.5 | 1.4 | 1.2 | 2.3 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 5.4 | 4.5 | 5.5 | 4.1 | -6.7 | -17.1 | 8.1 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | -5.8 | 4.0 | -1.3 | 4.0 | -39.4 | -32.9 | -13.4 |
| තොරතුරු හා සන්නිවේදනය | 7.7 | 11.4 | 12.5 | 8.0 | 14.1 | 13.9 | 19.4 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 5.3 | 14.6 | 14.8 | 11.8 | 9.4 | 13.7 | 6.6 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | 12.8 | 6.4 | 9.6 | 4.2 | -1.2 | -6.0 | 4.6 |
| වෘත්තීයමය සේවා | 4.0 | 2.8 | -7.1 | -3.1 | -2.7 | -6.8 | 3.2 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජයීය ක්‍රියාකාරකම් | -10.8 | 5.7 | -1.6 | 4.5 | 2.0 | 2.1 | 1.7 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | -0.8 | 5.2 | 6.9 | 5.2 | 1.6 | 0.8 | 1.2 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 10.0 | 8.6 | 2.9 | 1.3 | -6.5 | -13.5 | 2.2 |
| **ද.දේ.නි.** | **3.4** | **4.5** | **4.8** | **4.2** | **-3.6** | **-9.1** | **8.0** |


මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික
(ආ) සංශෝධිත

තුළ දී සියයට 4.6 කින් පුළුල් විය. රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක, අධ්‍යාපන, වෘත්තීයමය සේවාවන් සහ සෞඛ්‍ය හා සමාජ සේවාවන් යන උප අංශයන් 2021 වසරේ පළමු භාගය තුළදී පිළිවෙළින්, සියයට 1.2 කින්, සියයට 0.9 කින්, සියයට 3.2 කින් සහ සියයට 3.6 කින් වර්ධනය විය.

### සේවා වියුක්තිය

2021 වසරේ පළමු භාගයේ දී "නව සාමාන්‍යකරණය" තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2021 වසරේ දෙවන කාර්තුවේ සියයට 5.7 ක් ව පැවති සේවා වියුක්ති අනුපාතය 2021 වසරේ දෙවන කාර්තුව තුළ සියයට 5.1 ක් දක්වා පහළ යන

**රූපසටහන 2.7 : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය**





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ලදී. 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 50.2 ක් වූ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2021 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 49.8 ක් දක්වා පහත වැටී ඇති අතර, සේවා නියුක්ති අනුපාතය සියයට 94.3 සිට සියයට 94.9 දක්වා ඉහළ ගොස් ඇත.


### 2.3 මුදල් අංශයේ වර්ධනයන්

2020 වසරේ මාර්තු මස දී කොවිඩ්-19 වසංගතයෙන් ඇතිවූ අභියෝග වලට මුහුණ දීමට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. පුද්ගලික අංශය සඳහා ණය ලබාදීම උත්ප්‍රේරණය කිරීම හරහා ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසර අවසානයේ වාර්තා කළ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් සියයට 7.0 සහ සියයට 8.0 සිට 2020 වසරේ ජූලි මස වන විට සියයට 4.5 ක් දක්වා පදනම් අංක 250 කින් ද, සියයට 5.5 ක් දක්වා පදනම් අංක 250 කින් ද සැලකිය යුතු ලෙස අඩුකරන ලදී. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සහනදායී පොලී අනුපාතික යටතේ නව ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම ද ඇතුළත්ව පොලී අනුපාතික පහත දැමීමට සහ පුද්ගලික අංශයට ලබා

රූපසටහන **2.8 :** පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

දෙන ණය වර්ධනය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාත්මක කර ඇත. මෙම කඩිනම් ප්‍රතිපත්ති සහාය මගින් 2020 අගෝස්තු මසට සාපේක්ෂව 2021 අගෝස්තු මස අවසානය වන විට පෞද්ගලික අංශයට ලබාදුන් ණය ප්‍රමාණය රු. බිලියන 6,796 ක් දක්වා සියයට 15.1 කින් ඉහළ ගොස් ඇත.

කෙසේ වුව ද, මූර්ත අංශය මත ඇති වූ පීඩනයන් සමග වාර්තා වූ ආර්ථික වර්ධනයේ ඉහළ යාම සැලකිල්ලට ගෙන, ප්‍රතිපත්තිමය පොලී අනුපාතයන් වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය 2021 වසරේ අගෝස්තු මාසයේ දී පදනම් අංක 50 බැගින් පිළිවෙළින් සියයට 5.00 සහ සියයට 6.00 දක්වා ඉහළ දමන ලද අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) 2021 වසරේ සැප්තැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශතාංක 2.00 කින් සියයට 4.00 දක්වා ඉහළ නංවන

2021 වසරේ ජනවාරි මස අග දී සියයට 10.17 ක්ව පැවති බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) 2021 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 9.50 ක් දක්වා අඩු වූ අතර, 2021 වසරේ අගෝස්තු මස අවසානයේ දී එම අනුපාතිකය සියයට 9.38 ක් දක්වා තවදුරටත් පහත වැටී ඇත. මේ අතරතුර බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) 2021 වසරේ ජනවාරි මස අවසානයේ වාර්තා කළ සියයට 5.58 සිට 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 4.75 ක් දක්වා පහත වැටී ඇත. එසේම පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2021 වසරේ ජනවාරි මස අවසානයේ සිට 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 9,533 සිට රු. බිලියන 10,514 දක්වා සියයට 10.3 කින් වර්ධනය වූ අතර පුද්ගලික අංශය වෙත ලබාදුන් ණය 2021 වසරේ ජනවාරි මස අවසානයේ සිට 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 6,197 සිට රු. බිලියන 6,796 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

### උද්ධමනය


කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, පදනම් වර්ෂය 2013 = 100) මගින් මනිනු ලබන වාර්ෂික පදනම මත මතුපිට උද්ධමනය, වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් 2021 වසරේ ජනවාරි මස වාර්තා වූ සියයට 3.0 සිට 2021 වසරේ අගෝස්තු වන විට සියයට 6.0 දක්වා වර්ධනය වන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. කාලගුණය ආශ්‍රිත ගැටළු සමග සැපයුම් අංශයට සිදුවූ බාධා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල මත, විශේෂයෙන්ම සහල්, කිරිපිටි, පොල්, නැවුම් මාළු සහ ගෑස් වැනි ආහාර නොවන අයිතම මතද සැලකිය යුතු උද්ධමන පීඩනයක් ඇතිකරන ලදී.

**වගුව 2.5 : මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය 2013=100)**

| මාසය | මතුපිට උද්ධමනය (%) | | | | මූලික උද්ධමනය (%) | | | | ආහාර උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** |
| ජනවාරි | 5.7 | 3.0 | 4.5 | 4.3 | 3.0 | 2.7 | 5.3 | 3.1 | 12.4 | 6.8 | 2.0 | 10.9 |
| පෙබරවාරි | 6.2 | 3.3 | 4.6 | 4.1 | 3.2 | 2.6 | 5.1 | 3.0 | 14.7 | 7.9 | 3.3 | 10.3 |
| මාර්තු | 5.4 | 4.1 | 4.7 | 4.0 | 2.9 | 3.1 | 4.9 | 3.0 | 12.8 | 9.6 | 4.4 | 10.1 |
| අප්‍රේල් | 5.2 | 3.9 | 4.8 | 3.9 | 3.1 | 3.0 | 4.7 | 3.0 | 13.2 | 9.0 | 5.5 | 9.7 |
| මැයි | 4.0 | 4.5 | 4.7 | 3.9 | 2.9 | 3.2 | 4.4 | 3.0 | 9.9 | 9.9 | 6.3 | 9.7 |
| ජූනි | 3.9 | 5.2 | 4.7 | 4.1 | 3.1 | 3.2 | 4.2 | 3.0 | 10.0 | 11.3 | 7.2 | 9.9 |
| ජූලි | 4.2 | 5.7 | 4.8 | 4.2 | 3.2 | 3.7 | 4.0 | 3.1 | 10.9 | 11.0 | 8.4 | 9.9 |
| අගෝස්තු | 4.1 | 6.0 | 4.8 | 4.3 | 3.2 | 4.1 | 3.8 | 3.2 | 12.3 | 11.5 | 9.7 | 9.8 |
| සැප්තැම්බර් | 4.0 | 5.7 | 4.7 | 4.5 | 2.9 | 5.0 | 3.6 | 3.3 | 11.5 | 10.0 | 10.4 | 9.7 |
| ඔක්තෝබර් | 4.0 | - | 4.6 | – | 3.0 | – | 3.4 | – | 10.0 | – | 10.7 | – |
| නොවැම්බර් | 4.1 | - | 4.6 | – | 3.0 | – | 3.2 | – | 10.3 | – | 11.2 | – |
| දෙසැම්බර් | 4.2 | - | 4.6 | – | 3.5 | – | 3.1 | – | 9.2 | – | 11.4 | – |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**රූපසටහන 2.9 : මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා (පදනම : 2013 = 100)**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 2.4 කොටස් වෙළෙඳපොළ

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් හුවමාරුව විසින් අනුගමනය කරන ලද වේගවත් ඩිජිටල්කරණ උපායමාර්ගික ක්‍රමවේදයන් හේතුවෙන් රටෙහි ආයෝජන අවස්ථාවන්හි පරිවර්තනයක් පිළිඹිබු කරමින්, 2021 වසරේ පළමු මාස නවය තුළ කොටස් වෙළෙඳපොළ සැලකියයුතු ලෙස වර්ධනය විය. සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ S&P SL 20 දර්ශකය 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට 2020 වසරේ එම කාල සීමාව හා සසඳන විට පිළිවෙළින් සියයට 58.1 කින් සහ සියයට 43.5 කින් වර්ධනය විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2020 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී පැවති රු. බිලියන 2,595.8 ට සාපේක්ෂව 2021 වසරේ සැප්තැම්බර් මස අවසානයේ සියයට 62.4 කින් රු. බිලියන 4,215.6 ක් දක්වා වැඩි වී ඇත. සාමාන්‍ය දෛනික පිරිවැටුම 2020 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. මිලියන 1,481.6 ට සාපේක්ෂව, 2021 සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 200.7 කින් රු. මිලියන 4,455.0 ක් දක්වා ඉහළ ගොස් ඇත. විදේශීය විකුණුම් 2020 වසරේ පළමු මාස නවයක කාල සීමාව තුළ පැවති රු. බිලියන 87.0 ට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස නවය රු. බිලියන 73.6 ක් විය.

පාර්ශවකරුවන්ට අඛණ්ඩව ප්‍රවේශය ලබා දීම, ආයෝජකයින්ගේ සහභාගීත්වය වැඩි කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කොළඹ කොටස් හුවමාරුව, සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී කොටස් වෙළෙඳපොළේ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම ආරම්භ කරන ලදී. දෙවන අදියර 2021 වසරේ ජූලි මාසයේ දී අවසන් කරන ලද අතර, තෙවන අදියර 2021 වසරේ 4 වන කාර්තුවේ දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. කොළඹ කොටස් හුවමාරුව විසින් වෙළෙඳපොළ ඩිජිටල්කරණයේ පළමු අදියර දියත් කිරීමෙන් පසු නව ගිණුම් 21,110 ක් විවෘත කර ඇත. එමෙන්ම මෙම ඩිජිටල්කරණ වැඩපිළිවෙළත් සමඟ දෛනික නව ගිණුම් ප්‍රමාණය දෙගුණයකින් වැඩි වී ඇති අතර තරුණ ආයෝජකයින් කොටස් වෙළෙඳපොළ වෙත ආකර්ෂණය වී ඇත.

## 2.5 විදේශ අංශයේ වර්ධනයන්

2021 පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකාවේ විදේශ අංශය, වසංගතයෙන් යථා තත්ත්වයට පත්වීමේ ධනාත්මක ලකුණු පෙන්නුම් කර ඇත. කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන ඇතුළු සියලුම අපනයන බාණ්ඩ පිළිවෙලින් ඇ. ඩො. මිලියන 6,093.2 දක්වා සියයට 24.2 කින් ද, ඇ. ඩො. මිලියන 1,765.5 දක්වා සියයට 16.5 කින් ද, ඇ.ඩො. මිලියන 30.7 දක්වා සියයට 115.3

**වගුව 2.6 : ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම්**


| දර්ශකය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | සැප්තැම්බර් අවසානයට 2020 | සැප්තැම්බර් අවසානයට 2021[(a)] |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,895 | 6,228 | 6,369 | 6,052 | 8,120 | 6,774 | 5,985 | 9,460 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය | 3,626 | 3,496 | 3,672 | 3,135 | 3,062 | 2,638 | 2,463 | 3,535 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලි.) | 2,938 | 2,745 | 2,899 | 2,840 | 3,599 | 2,961 | 2,596 | 4,216 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 294 | 295 | 296 | 297 | 289 | 283 | 285 | 287 |
| වාර්ෂික පිරිවැටුම (රු. බිලි.) | 253 | 176 | 221 | 200 | 171 | 397 | 218 | 793 |
| විදේශ විකුණුම් (රු. මිලි.) | 89,793 | 74,275 | 94,627 | 100,315 | 68,272 | 104,245 | 87,027 | 73,577 |
| විදේශ ගැනුම් (රු. මිලි.) | 84,421 | 74,625 | 112,285 | 77,067 | 56,537 | 52,889 | 46,905 | 28,715 |
| ශුද්ධ ගැනුම් (රු. මිලි.) | -5,372 | 350 | 17,658 | -23,248 | -11,735 | -51,356 | -40,122 | -44,862 |


මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

කින් ද වර්ධනය විය. ආනයන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 10,257.4 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 13,411.5 දක්වා සියයට 30.7 කින් ඉහළ ගොස් ඇත. අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඇ. ඩො. මිලියන 7,942.4 දක්වා සියයට 39.5 කින් ද, ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඇ. ඩො. මිලියන 2,882.3 දක්වා සියයට 27.9 කින් ද, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ. ඩො. මිලියන 2,579.3 දක්වා සියයට 12.1 කින් ද වර්ධනය විය. විශේෂයෙන්ම එන්නත් ඇතුළුව වෛද්‍ය උපකරණ සහ ඖෂධ, ගෘහ උපකරණ සහ විදුලි සංදේශ උපාංග සඳහා ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම 2021 වසරේ පළමු මාස අට තුළ ඇ. ඩො. මිලියන 1,427.3 දක්වා සියයට 11.8 කින් වැඩි විය.

සමස්ත ගෙවුම් ශේෂය 2020 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 722 ක හිඟයට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 2,423 ක හිඟයක් වාර්තා කර ඇත. ඍජු විදේශ ආයෝජන ලැබීම් 2020 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 351 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 398 ක් විය. එමෙන්ම, 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට මුළු විදේශ වත්කම් ප්‍රමාණය ඇ. ඩො. බිලියන 7.3 ක් වූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විශේෂ ගැනුම් හිමිකම් (SDR) ලැබීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව සහ බංගලාදේශ බැංකුව අතර ඇති කරගත් විදේශ විනිමය ද්විපාර්ශ්වික හුවමාරු ගිවිසුම යටතේ ලැබීම් ද ඇතුළත්ව 2021 වසරේ අගෝස්තු මස අවසානය වන විට දළ නිල සංචිතය (GOR) ඇ. ඩො. බිලියන 3.5 ක් විය. මේ අතර, ශ්‍රී ලංකා රුපියල 2021 වසරේ ඔක්තෝබර් 18 වන විට ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 6.8 කින් අවප්‍රමාණය විය.

**රූපසටහන 2.10 : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස්වීම**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**අපනයන**

අපනයන අංශය දිරිමත් කිරීමට සැපයූ දායකත්වයත් සමඟ කාර්මික, කෘෂිකාර්මික හා ඛනිජ අපනයන වල ඇතිවූ වර්ධනය හේතුවෙන් 2020 වසරේ පළමු මාස අටක කාලය තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 6,445.0 ක අපනයන ආදායමට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ අපනයන ආදායම ඇ. ඩො. මිලියන 7,903.0 දක්වා සියයට 22.6 කින් වර්ධනය විය. කාර්මික අපනයන ඉපයීම් 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 4,905.4 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය

වගුව 2.7 : විදේශීය වෙළෙඳාම


ඇ. ඩො. මිලියන

| අයිතමය | 2018 | 2019 | 2020 | ජන. අගෝ. 2020 | ජන. අගෝ. 2021(අ) |
|---|---|---|---|---|---|
| **අපනයන** | **11,890** | **11,940** | **10,077** | **6,445** | **7,903** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,580** | **2,462** | **2,336** | **1,516** | **1,766** |
| තේ | 1,429 | 1,346 | 1,241 | 806 | 882 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 1,151 | 1,116 | 1,095 | 710 | 883 |
| **කාර්මික අපනයන** | **9,258** | **9,427** | **7,702** | **4,905** | **6,093** |
| ඇඟලුම් හා නිමි ඇඳුම් | 5,318 | 5,597 | 4,423 | 2,853 | 3,435 |
| ආහාර පාන සහ දුම්කොළ | 462 | 447 | 464 | 303 | 354 |
| රබර් නිෂ්පාදන | 875 | 866 | 786 | 489 | 682 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 435 | 400 | 338 | 210 | 329 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 622 | 521 | 374 | 268 | 295 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,546 | 1,596 | 1,317 | 783 | 998 |
| **ඛනිජමය අපනයන** | **34** | **34** | **25** | **14** | **31** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **18** | **18** | **14** | **9** | **14** |
| **ආනයන** | **22,233** | **19,937** | **16,055** | **10,257** | **13,412** |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,980** | **3,957** | **3,402** | **2,300** | **2,579** |
| ආහාර සහ පාන | 1,606 | 1,427 | 1,554 | 1,024 | 1,152 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 3,374 | 2,530 | 1,847 | 1,277 | 1,427 |
| **අතරමැදි භාණ්ඩ** | **12,488** | **11,369** | **9,077** | **5,692** | **7,942** |
| ඛනජතෙල් | 4,152 | 3,892 | 2,543 | 1,691 | 2,396 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,859 | 2,909 | 2,335 | 1,457 | 1,944 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 374 | 346 | 384 | 229 | 266 |
| අනෙකුත් | 5,104 | 4,222 | 3,814 | 2,315 | 3,336 |
| **ආයෝජන භාණ්ඩ** | **4,690** | **4,603** | **3,563** | **2,253** | **2,882** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 2,492 | 2,490 | 2,176 | 1,325 | 1,823 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,525 | 1,509 | 1,036 | 671 | 804 |
| ප්‍රවාහන උපකරණ | 668 | 597 | 348 | 255 | 252 |
| අනෙකුත් | 6 | 8 | 3 | 2 | 4 |
| **වර්ගීකරණය නොකළ ආනයනය** | **75** | **8** | **14** | **11** | **8** |
| **වෙළඳ හිඟය** | **-10,343** | **-7,997** | **-5,978** | **-3,812** | **-5,509** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*
(අ) තාවකාලික

තුළ ඇ. ඩො. මිලියන 6,093.2 දක්වා සියයට 24.2 කින් වැඩි වී ඇත. අපනයනයෙන් ලද ඉපයීම් රෙදිපිළි හා ඇඟළුම්වලින් ඇ. ඩො. මිලියන 3,434.8 දක්වා සියයට 20.4 කින් ද, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණවලින් ඇ. ඩො. මිලියන 178.0 ක් දක්වා සියයට 73.4 කින් ද, රබර් නිෂ්පාදනවලින් ඇ. ඩො. මිලියන 681.7 ක් දක්වා සියයට 39.4 කින් ද, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණවලින් ඇ. ඩො. මිලියන 329.1 ක් දක්වා සියයට 57.1 කින් සහ ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ඇ. ඩො. මිලියන 294.9 ක් දක්වා සියයට 10 කින් ද ඉහළ යාම මෙයට හේතු විය. ගුවන් යානා හා නැව් සඳහා ඉන්ධනවල මිල ඉහළ යාම මෙන්ම එම ඉන්ධන අපනයන ප්‍රමාණය ඉහළ යාමත් සමඟ ඛනිජතෙල් නිෂ්පාදන අපනයන ආදායම ඉහළ ගොස් ඇත. මේ අතර, එළවළු සහ සුළු කෘෂිකාර්මික

රූපසටහන 2.11 : අපනයන සංයුතිය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*


නිෂ්පාදන හැරුණු කොට තේ, රබර්, පොල්, කුළුබඩු, සැකසුම් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාරවල අපනයන ඉපයීම් ඉහළයාම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 1,516.0 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 1,765.5 දක්වා සියයට 16.5 කින් වර්ධනය විය. රබර්වලින් ලද අපනයන ආදායම ඇ. ඩො. මිලියන 27.3 ක් දක්වා සියයට 52.7 කින් ද, පොල්වලින් ලද ආදායම ඇ. ඩො. මිලියන 276.9 ක් දක්වා සියයට 25.0 කින් ද, කුළුබඩුවලින් ලද ආදායම ඇ. ඩො. මිලියන 282.4 ක් දක්වා සියයට 45.2 කින් ද, මුහුදු ආහාරවලින් ලද ආදායම ඇ. ඩො. මිලියන 165.5 ක් දක්වා සියයට 24.3 කින් ඉහළ ගොස් ඇත. තේ අපනයන පරිමාව වැඩිවීමත් සමඟ, විශේෂයෙන්ම 2021 වසරේ අගෝස්තු මස වැඩිවීමත් සමග තේ අපනයන ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 805.6 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 882.4 දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. මේ අතර, පාෂාණ සහ ගල් වර්ග වලින් ලද ආදායම වැඩිවීම හේතුවෙන් ඛනිජ අපනයන ඉපයීම් ඇ. ඩො. මිලියන 30.7 ක් දක්වා සියයට 115.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

### ආනයන

ආනයන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 10,257.4 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 13,411.5 දක්වා සියයට 30.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආහාර පාන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යාම නිසා පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වියදම ඇ.ඩො. මිලියන 2,579.3 ක් දක්වා සියයට 12.1 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්ත නිෂ්පාදන සඳහා ආනයන වියදම සියයට 16.1 කින් සහ සීනි සහ රසකැවිලි නිෂ්පාදන සඳහා ආනයන වියදම සියයට 30.0 කින් ඉහළ යාම හේතුවෙන් ආහාර සහ පාන වර්ග සඳහා ආනයන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 1,023.7 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 1,151.9 දක්වා සියයට 12.5 කින් වර්ධනය විය. විශේෂයෙන් කොවිඩ්-19 සඳහා වන එන්නත් ඇතුළුව වෛද්‍ය උපකරණ සහ ඖෂධ, ගෘහ උපකරණ සහ විදුලි සංදේශ උපාංග ආනයනය වැඩිවීමත් සමඟ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 1,427.3 දක්වා සියයට 11.8 කින් වැඩි විය. කෙසේ වෙතත්, මෝටර් වාහන ආනයනය සඳහා පනවා ඇති සීමාවන් පිළිබිඹු කරමින්, පුද්ගලික මෝටර් වාහන ආනයන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ ඇ. ඩො. මිලියන 280.8 සිට 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 7.8 දක්වා සියයට 97.2 කින් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, මූල ලෝහ, රසායනික නිෂ්පාදන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආදියේ ආනයන වියදම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, අතරමැදි භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 5,692.4 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 7,942.4 දක්වා සියයට 39.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් සහ බොරතෙල් මිල ඉහළ යාම පිළිබිඹු කරමින් ඉන්ධන ආනයන වියදම ඇ. ඩො. මිලියන 2,395.9 දක්වා සියයට 41.7 කින් වැඩි විය.

සමාලෝචන කාලසීමාව තුළ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වන ආනයන වියදම් ඉහළ යාම නිසා 2020 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. මිලියන 2,253.2 ක් ව පැවති ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ සමාන කාල පරිච්ජේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,882.3 ක් දක්වා සියයට 27.9 කින් වැඩි විය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,822.5 දක්වා සියයට 37.6 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඇ. ඩො. මිලියන 803.9 ක් දක්වා සියයට 19.7 කින් ද, ඉහළ ගොස් ඇති අතර ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඇ. ඩො. මිලියන 252.1 දක්වා සියයට 1.2 කින් අඩු වී ඇත.

රූපසටහන 2.12 : ආනයන සංයුතිය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

### සංචාරක ඉපයීම් සහ සේවක ප්‍රේෂණ

වසංගතයට ප්‍රතිචාර වශයෙන් පනවන ලද ගෝලීය සංචරණ සීමාවල බලපෑම පිළිබිඹු කරමින් සංචාරක පැමිණීම් 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ පුද්ගලයින් 507,311 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 24,377 දක්වා සියයට 95.2 කින් අඩු විය. ඒ අනුව, සංචාරක ඉපැයීම් 2020 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ ඇ. ඩො. මිලියන 682 ක සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 33 ක් දක්වා සියයට 95.2 කින් අඩුවී ඇත. සේවක ප්‍රේෂණ 2020 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 4,346 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 4,224 ක් දක්වා සියයට 2.8 කින් සුළු වශයෙන් පහත වැටුණි.

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය | 03

### 3.1 සමාලෝචනය

රජය සතු ව්‍යවසායයන් විසින් සිදු කරනු ලබන භූමිකාවේ වැදගත්කම, කොවිඩ් - 19 වසංගතය හමුවේ වඩාත් ඉස්මතුවිය. කෙසේ වෙතත්, ධාරිතාවය, විනිවිදභාවය සහ මෙහි පවතින දුර්වලතා හේතුවෙන් රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය ප්‍රශස්ත මට්ටම කරා ළඟා වී නොමැති අතර, එබැවින් ඇතැම් ආයතන රාජ්‍ය මූල්‍ය මත වැය බරක් ඇති කර ඇත. ඒ අනුව, රජය සතු ව්‍යවසායයන් තවදුරටත් මූල්‍යමය ශක්‍යතාවයෙන් හෙබි, තරඟකාරී සහ නවෝත්පාදන සඳහා යොමුවන ආයතන බවට පත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

රජය සතු උපායමාර්ගික වශයෙන් වැදගත් ව්‍යවසායයන් 52 ක් විසින් 2021 වර්ෂයේ පළමු මාස හත සඳහා රු. බිලියන 7.3 ක සමස්ත ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, ඒ අතරින් ව්‍යවසායයන් 32 ක් විසින් රු. බිලියන 102.8 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, මෙම කාර්ය සාධනය ඉතිරි 20 හි සමස්ථ ශුද්ධ අලාභය වන රු. බිලියන 95.5 ක් හේතුවෙන් රජය සතු ව්‍යවසායයන් 19 කින් පමණක් 2021 මුල් මාස හත තුළ රු. බිලියන 13.7 ක අයබදු හා ලාභාංශ ලැබී ඇති අතර, මෙය පෙර වර්ෂයේ සමාන කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 63 ක වැඩි වීමක් වන අතර මූල්‍ය අංශයේ හා විදුලි සංදේශ අංශයේ වර්ධිත අයබදු හා ලාභාංශ ගෙවීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වී ඇත.

රජයේ ප්‍රතිපත්ති රාමුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තෝරාගත් රජය සතු ව්‍යවසායයන්යන්හි සේවක පාරිශ්‍රමික සහ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි පිළිබඳව තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇත. ඒ අනුව, ආර්ථික වර්ධන ඉලක්ක කරා යොමු වීමේ අරමුණින් ඍජු විදේශ ආයෝජන ඉහළ නැංවීම උදෙසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට, ක්ෂේත්‍රයේ නිපුණතාවක් සහිත වෘත්තිකයන් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තවද, අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන්යන්හි මූල්‍ය හා මෙහෙයුම් කළමනාකරණ පද්ධතීන් තුළට තාක්ෂණය හඳුන්වාදීමේ ඇති වැදගත්කම හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන්, රාජ්‍ය ව්‍යවසායයන් අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, අන්තර්ජාලය පාදක කරගත් තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

### 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය

මෙහිදී මූල්‍ය, රක්ෂණ, විදුලිය, ජලය සහ ගුවන් සේවා ආදී ක්ෂේත්‍ර ආවරණය වන රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහයක කාර්යසාධනය සමාලෝචනය කරනු ලැබේ.

#### ලංකා බැංකුව

මෙරට ප්‍රමුඛ වාණිජ බැංකුව ලෙස සිය ස්ථාවරත්වය අඛණ්ඩව තහවුරු කර ගනිමින් 2020 වර්ෂය අවසාන වන විට රු. බිලියන 2,983 ක් වූ සිය වත්කම් පදනම 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 3,420ක් දක්වා සියයට 14.6 කින් ඉහල නංවා ගැනීමට ලංකා බැංකුව සමත් වී ඇත. 2020 වර්ෂය අවසාන වන විට රු. බිලියන 2,475 ක් වූ බැංකුවේ තැන්පතු පදනමද 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 2,633 ක් දක්වා සියයට 6.3 කින් ඉහළ ගොස් ඇත. මූලිකවම වසංගත කාලසීමාව තුල ණය අයකිරීම් පමා කිරීම ඇතුළුව ගණුදෙනුකරුවන්ට ලබාදුන් සහන තවදුරටත් ක්‍රියාත්මක වීම හේතුවෙන් 2020 වර්ෂය අවසන් වන විට වාර්තා කරන ලද සියයට 4.8 ක් වූ අක්‍රිය ණය අනුපාතය 2021 ජූලි මාසය අවසානය වන විට සියයට 4.5 ක් දක්වා පදනම් අංක 30 කින් අඩු වී, වර්ධනීය තත්ත්වයක් පෙන්නුම් කරයි. 2020 සමස්ත වර්ෂය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 24 ක් වූ ලංකා බැංකුවේ බදු පෙර ලාභය 2021 මුල් මාස හත තළදී රු. බිලියන 31 ක් දක්වා ඉහළ ගොස් ඇත.

#### මහජන බැංකුව

2020 වර්ෂය අවසානය වන විට රු. බිලියන 2,230 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 2,495 ක් දක්වා සියයට 11.8 කින් ඉහළ ගොස් ඇත. 2020 වර්ෂය අවසානය වන විට රු. බිලියන 1,835 ක් වූ මහජන බැංකුවේ තැන්පතු පදනම 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 2,081 ක් දක්වා සියයට 13 කින් ඉහල ගොස් ඇත. 2020 වර්ෂය අවසානය වන විට රු. බිලියන 1,723 ක් වූ ණය සහ අත්තිකාරම් වටිනාකම 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 1,911 ක් දක්වා සියයට 10.9 කින් ඉහළ ගොස් ඇත. 2020 වර්ෂය අවසානය වන විට සියයට 3.2 ක් වූ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය, 2021 ජූලි මාසය අවසානය වන විට සියයට 3.3 ක් දක්වා පදනම් අංක 10 කින් පමණ මද වශයෙන් ඉහළ ගොස් ඇත. 2020 සමස්ත වර්ෂය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 21.2 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2021 වර්ෂයේ මුල් මාස හත සඳහා රු. බිලියන 15 ක පමණ බදු පෙර ලාභයක් මහජන බැංකුව විසින් වාර්තා කර ඇත. තවද, මහජන බැංකුව එහි ව්‍යවස්ථාපිත අනුපාතයන් වර්ධනය කර ගනිමින් 2021 මාර්තු මාසයේදී රු. බිලියන 3.5 ක පළමු ස්ථරයේ අමතර ප්‍රාග්ධනයක්, ණයකර නිකුතුවක් මඟින් සාර්ථකව රැස් කර ගැනීමට සමත්ව ඇත.

#### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2020 වර්ෂය අවසානය වන විට රු. බිලියන 1,364 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 1,511 ක් දක්වා සියයට 10.8 කින් වර්ධනය වී ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පාදක වී ඇත්තේ 2020 වර්ෂය අවසාන වන විට රු. බිලියන 1,237 ක්ව

පැවති තැන්පතු ප්‍රමාණය 2021 ජූලි මාසය අවසානය වන විට රු. බිලියන 1,363 ක් දක්වා සියයට 10.2 කින් (මුළු වත්කම් වලින් සියයට 90 ක්) පමණ ඉහළ යාමයි. 2021 වර්ෂයේ පළමු මාස හත තුළ බැංකුව විසින් රු. බිලියන 126 ක් වටිනා අමතර තැන්පතු ප්‍රමාණයක් රැස්කිරීමට සමත්ව ඇත. ණය සහ අත්තිකාරම් කළඹ 2020 වර්ෂය අවසන් වන විට පැවති රු. බිලියන 517 සිට 2021 ජූලි මාසය අවසන් වන විට රු. බිලියන 510 ක් දක්වා මඳ වශයෙන් පහළ ගොස් ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2020 සමස්ත වර්ෂය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 15.6 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2021 වර්ෂයේ මුල් මාස හත සඳහා රු. බිලියන 16.6 බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2020 සමස්ත වර්ෂය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 23.7 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2021 වර්ෂයේ මුල් මාස හත තුළ රු. බිලියන 13.7ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. තවද, සංස්ථාව 2020 වර්ෂයේ පළමු මාස හත තුළ වාර්තා කරන ලද රු. බිලියන 26.5 ක මුළු ආදායමට සාපේක්ෂව 2021 වර්ෂයේ පළමු මාස හත තුළ සියයට 25 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. බිලියන 33.2 ක මුළු ආදායමක් වාර්තා කර ඇත. 2021 මුල් මාස හත තුළ රක්ෂණ කර්මාන්තයේ පැවති හිතකර තත්ත්වයන් මනා ලෙස උපයෝජනය කර ගැනීම මඟින් සිය වත්කම් පදනම රු. බිලියන 249.5 දක්වා පුළුල් කරගෙන ඇති අතර, 2021 ජූලි මාසය අවසන් වන විට ජීවිත හා ජීවිත නොවන අරමුදල් ද පිළිවෙලින්, රු. බිලියන 147.6 සහ රු. බිලියන 18.5 දක්වා වර්ධනය කර ගැනීමට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමත් ව ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය

ප්‍රධාන වශයෙන් සංචරණ සීමා ලිහිල් කිරීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමත් සමඟම ලංකා විදුලිබල මණ්ඩලයේ 2021 වසරේ පළමු මාස හත තුළ විදුලිය විකිණීමෙන් ලද ආදායම, 2020 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ලද ආදායම වූ රු. බිලියන 137 ට සාපේක්ෂව රු. බිලියන 143 දක්වා සියයට 4 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත කාල සීමාව වන 2021 පළමු මාස හත තුළ පැවති අධික වර්ෂාපතනයත් සමඟ ජල විදුලි උත්පාදනය ඉහළ යාම හේතුවෙන් 2020 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 110 ක් වූ ඍජු විදුලි උත්පාදන වියදම රු. බිලියන 94 දක්වා සියයට 14 කින් පහළ ගොස් ඇත. මේ අතර, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා වන විදුලි උත්පාදනය, විශේෂයෙන්ම සුළං සහ කුඩා ජලවිදුලි බලාගාර ඇතුළු සූර්ය බල උත්පාදනය, මෙම කාලය තුළ කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. ඒ හේතුවෙන්, 2020 වසරේ පළමු මාස 7 තුළ කිලෝවොට් පැයක් සඳහා රු. 20.08 ක් වූ විදුලි ඒකකයක් සඳහා පිරිවැය 2021 වසරේ අනුරූපී කාල පරිච්ඡේදය තුළ කිලෝවොට් පැයක් සඳහා රු. 17.30 ක් දක්වා සියයට 13 කින් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වර්ෂයේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 23 ක් වූ මෙහෙයුම් අලාභයට සාපේක්ෂව 2021 මුල් මාස හත තුළ මෙහෙයුම් අලාභය රු. බිලියනයකට ආසන්න අගයක් දක්වා සියයට 96 කින් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2021 අප්‍රේල් 8 වැනි දින රු. බිලියන 20 ක් වටිනා ජොෂ්ඨ, සුරක්ෂිත නොකරන ලද, ලැයිස්තුගත, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත, වසර පහකදී (5) කල් පිරෙන ණයකර නිකුතුවක් සිදු කරන ලද අතර එය නිකුත් කළ දිනම අධිදායකත්වයක් ලැබිණි.

**වගුව 3.1 : විදුලි උත්පාදන සංයුතිය හා ධාරිතාවය**

| | විදුලි උත්පාදනය ජන. - ජූලි | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | | | 2021 | | |
| | ස්ථාපිත ධාරිතාව මෙ.වො | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස | ගි. වො. පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස | ගි. වො. පැ. |
| ජලවිදුලි | 1,399 | 20% | 1,864 | 1,383 | 28% | 2,737 |
| තාප විදුලිය - ලංවීම (ඉන්ධන) | 654 | 10% | 961 | 654 | 8% | 841 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් | 704 | 19% | 1,756 | 457 | 12% | 1,161 |
| සුළං -ලංවීම | - | – | - | 31 | 2% | 150 |
| තාප විදුලිය - ගල්අඟුරු | 900 | 41% | 3,936 | 900 | 38% | 3,825 |
| සාම්ප්‍රදායිකනොවන පුනර්ජනනනීය බලශක්ති | 660 | 8% | 782 | 698 | 10% | 1,024 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 236 | 2% | 154 | 305 | 2% | 214 |
| **එකතුව** | **4,553** | **100%** | **9,453** | **4,428** | **100%** | **9,952** |

මූලාශ්‍ර - ලංකා විදුලිබල මණ්ඩලය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2020 වර්ෂය අග වන විට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රාජ්‍ය බැංකුවලින් ලබාගත් ණය ප්‍රමාණය වන රු. බිලියන 41.5, 2021 ජූලි මස අග වන විට රු. බිලියන 24.5 ක් දක්වා සියයට 41 කින් පමණ පහත වැටී ඇත. කෙසේ වෙතත්, 2020 වර්ෂය අවසානයේ දී රු. බිලියන 371.9 ක් වූ ව්‍යාපෘති ණය ඇතුළුව බැංකු වෙත ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණය 2021 ජූලි මස අවසන් වන විට රු. බිලියන 365.5 ක් ලෙස වාර්තා වී ඇත. තවද, 2020 වර්ෂය අවසන් වන විට රු. බිලියන 136 ක් වූ ලංකා ඛනිජ තෙල් සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ගෙවිය යුතු බැඳීම් 2021 ජූලි මස අවසානය වන විට රු. බිලියන 128 දක්වා පහත වැටී ඇත.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, 2020 මුල් මාස හතේ වාර්තා කළ රු. මිලියන 4,584 ක අලාභයට සාපේක්ෂව 2021 සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 61,886 ක අලාභයක් වාර්තා කරඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වාර්ෂික ජාත්‍යන්තර බොර තෙල් බැරලයක මිල ඇ. ඩො. 51 සිට ඇ.ඩො. 75 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 47 කින් ඉහළ යාම හා, ඇ.ඩො. ට සාපේක්ෂව රුපියලේ අගය රු. 182.73 සිට රු. 199.49 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9 කින් අවප්‍රමාණය වීමයි. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කම්පනයන් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක එනම් ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් තාවකාලිකව අවශෝෂණය කර ගෙන ඇති අතර, 2021 වසරේ ජූලි මාසය අවසන් වන විට ගෙවීමට ඇති මුළු මුදල රු. මිලියන 707,505 ක් දක්වා වර්ධනය වී ඇත.

නිමි ඛනිජ තෙල් ලීටර් මිලියන 2,942 ක ඉල්ලුම සපුරාලීම සඳහා 2021 මුල් මාස හත තුළ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රු. මිලියන 253,668 ක සමස්ත පිරිවැයකින් යුත් බොර තෙල් හා පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන බැරල් මිලියන 18.4 ක් ආනයනය කර ඇත. 2021 මුල් මාස හත තුළදී වාර්තා කළ රු. මිලියන 315,885 ක මුළු විකුණුම් පිරිවැය, 2020 වර්ෂයේ සමගාමී කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන 268,225 ට සාපේක්ෂව සියයට 17 ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කර ඇත.

පිරිවැය අවශෝෂණය කර ගැනීමේ අරමුණින් 2021 ජූනි මාසයේදී ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ඉහළ දැමුව ද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2020 පළමු මාස හත තුළ වාර්තා කළ රු. මිලියන 17,402 ක මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 2021 පළමු මාස හත තුළ රු. මිලියන 18,848 ක මෙහෙයුම් අලාභයක් තවදුරටත් වාර්තා කර ඇත. මේ අතර, නොපියවූ ඩොලර් ණය පියවීමේ පීඩනය හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇති අතර, එහි මූල්‍ය පිරිවැය 2020 මුල් මාස හත තුළදී වාර්තා කළ රු. මිලියන 11,516 ට සාපේක්ෂව 2021 වසරේ මුල් මාස හත තුළ සියයට 19 ක වැඩි වීමක් සහිතව රු. මිලියන 13,709 ක් දක්වා ඉහළ ගොස් ඇත.

2021 ජූලි මස අවසානය වන විට රු. මිලියන 152,430 ක් දක්වා වර්ධිත ලැබිය යුතු ණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

ඉහත සියළුම කරුණු සැලකිල්ලට ගනිමින්, ගෝලීය මිල ගණන් වල අස්ථාවරත්වයේ බලපෑම අවම කිරීම සඳහා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අනාගත ආයෝජකයින් සමඟ පිරිපහදු ධාරිතාව සහ ගබඩා පහසුකම් ඉහළ නැංවීම සඳහා බහුවිධ උපාය මාර්ග යන් අනුගමනය කිරීමට සැලසුම් කර තිබේ.

### ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2021 වසරේ මුල් කාර්තුව තුළ රජය විසින් වරාය ආශ්‍රිත කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩපිළිවෙළක් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහාලුම් පර්යන්තයත්, පෞද්ගලික අංශයේ සහය ඇතිව බටහිර බහාලුම් පර්යන්තයත්, සංවර්ධනය කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. නැගෙනහිර බහාලුම් පර්යන්තයේ සහ බටහිර බහාලුම් පර්යන්තයේ සංවර්ධන කටයුතු ඉදිරි වසර පහ තුළ සමගාමීව ක්‍රියාත්මක කිරීම තුළින් ජාත්‍යන්තර නාවුක කර්මාන්තය ආශ්‍රිත සේවා සඳහා ඇති වැඩිවන ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීම සඳහා 2025 වසරේ සිට එම පර්යන්ත සම්පූර්ණ මෙහෙයුම් තත්ත්වයට ගෙන එමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරමින් සිටියි.

2021 වසරේ මුල් මාස හත තුළ, භාණ්ඩ හා වෙනත් නැව් සහ යාත්‍රා 2,249 ක් වරාය අධිකාරිය විසින් මෙහෙයවනු ලබන කොළඹ, ත්‍රිකුණාමලය සහ ගාල්ල යන වරායන් වෙත පැමිණ ඇති අතර, එය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2021 මුල් මාස හත තුළ සියයට 7 ක වැඩිවීමක් සහිතව සමස්ත අඩි විස්සේ සම ඒකක බහාලුම් මිලියන 1.28 ක් හසුරුවා ඇත.

නාවුක කටයුතු, බහාලුම් හැසිරවීම්, වාප්පු මෙහෙයුම්, වරාය පහසුකම් සැපයීම හා වෙනත් සේවා මෙහෙයුම් මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2021 වසරේ මුල් මාස හත සඳහා උපයා ගත් රු. මිලියන 31,207 ක ආදායම, 2020 වසරේ අනුගාමී කාලපරිච්ඡේදය සඳහා වාර්තා කළ රු. මිලියන 26,545 හා සැසඳීමේ දී සියයට 18 ක වර්ධනයකි. මේ අතර, සමස්ත වියදම්ද සියයට 6 ක වර්ධනයක් සහිතව රු. මිලියන 18,340 ක් වී ඇත. 2021 වර්ෂයේ මුල් මාස හත සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වාර්තා කරන ලද රු. මිලියන 11,525 ක බදු පෙර ලාභය, පෙර වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන

8,436 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී සියයට 37 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 වසරේ ජූලි මස අවසන් වන විට ආයතනයේ විදේශීය හා දේශීය ණය ප්‍රමාණය පිළිවෙළින්, රු. මිලියන 55,434 ක් සහ රු. මිලියන 8,364 ක් විය.

### ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2025 වන විට රටේ සමස්ත ජනතාවටම පිරිසිදු හා සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ රජයේ වැඩපිළිවෙල අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2020 වන විට සියයට 43.8 ක පැවති ජල සැපයුම් ආවරණය 2025 අවසානය වන විට සියයට 78.8 දක්වාත්, නල අපවහන ආවරණය 2020 දී පැවති සියයට 2.2 සිට 2025 දී සියයට 3.0 දක්වා වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ. 2021 ජූලි මස අවසන් වන විට සමස්ත නල ජල ආවරණය සියයට 55 දක්වාත්, ආරක්ෂිත ජල සැපයුම් ආවරණය සියයට 95.1 දක්වාත්, නල ජලාපවහන ආවරණය සියයට 2.05 දක්වාත් වැඩි වී ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පෙර වර්ෂයේ මුල් මාස හත තුළ වාර්තා කළ රු. මිලියන 15,928 ක ආදායම සියයට 4 ක වාර්ෂික වර්ධනයක් සමඟ 2021 වසරේ මුල් මාස හත තුළ රු. මිලියන 16,560 ක් දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත්, විකුණුම් පිරිවැයේ වැඩිවීම හේතු කොට ගෙන 2021 පළමු මාස හත තුළ ආයතනයේ දළ ලාභය රු.මිලියන 6,298 ක් දක්වා සියයට 7.7 කින් පහත වැටී ඇත. එහි අඛණ්ඩ බලපෑම හේතුවෙන් 2020 වර්ෂයේ පළමු මාස හත තුළ වාර්තා වූ මෙහෙයුම් ලාභය වන රු. මිලියන 198 ට සාපේක්ෂව 2021 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 1,011 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2021 වර්ෂයේ පළමු මාස හත තුළදී ජලය ඝන මීටර් මිලියන 471 ක් නිෂ්පාදනය කරමින් ඝන මීටර් මිලියන 352 ක ජලය අලෙවි කර ඇති අතර, නව සම්බන්ධතා 101,861 ක් ලබා දෙමින් සමස්ත ජල සැපයුම් පද්ධතිය ජල සම්බන්ධතා මිලියන 2.66 ක් දක්වා වැඩි කර ඇත. කෙසේ වෙතත්, 2020 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය වන විට පැවති සියයට 24.6 ක් වූ ආදායම් නොලබන ජල ප්‍රතිශතයට සාපේක්ෂව 2021 ජූලි මස අවසානය වන විට එම අගය සියයට 25.3 දක්වා වැඩි වී ඇති අතර මෙය පාලනය කිරීම සඳහා විචක්ෂණශීලීව තීරණ ගත යුතු වේ.

නාගරික ජල ව්‍යාපෘති සියයට 50 ක්, ග්‍රාමීය ජල ව්‍යාපෘති සියයට 75 ක් සහ නිදන්ගත වකුගඩු රෝග (සීකේඩී) අවම කිරීමේ ජල ව්‍යාපෘති සියයට සියයක් ආවරණය වන පරිදි එකඟ වූ ණය සේවාකරණය සඳහා මෙම වසරේ මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 8,447 ක දායකත්වයක් ලබා දී ඇත.

### ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

කොවිඩ්-19 වසංගතය සහ ඒ ආශ්‍රිත පාලනයන් හේතුවෙන් ගුවන් සේවා අංශයේ ගුවන් මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2021 පළමු භාගය තුළ වාර්තා වී ඇත්තේ 166,648 ක ගුවන් මගීන්ගේ පැමිණීමක් සහ 125,525 ක ගුවන් මගීන්ගේ පිටවීමක් පමණි. මෙහෙයුම් සීමා වීම හේතුවෙන්, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින්, පෙර මූල්‍ය වර්ෂයේ වාර්තා කළ ශුද්ධ අලාභය වූ රු. මිලියන 3,748 ට සාපේක්ෂව, 2021 මුල් මාස හත තුළ රු. මිලියන 1,792 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.

2025 වන විට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ධාරිතාව වසරකට මගීන් මිලියන 20 දක්වා ඉහළ නැංවීම සඳහා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් ගුවන්තොටුපළේ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අඛණ්ඩව ආයෝජනය කර ඇත. ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය විසින් ගුවන්තොටුපළ සෞඛ්‍ය ප්‍රතීතන සහතිකය ප්‍රදානය කිරීමත් සමඟ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ලොව පුරා පවතින වාණිජ ගුවන්තොටුපළ 17,600 ක් අතුරින් එවැනි ප්‍රතීතනයක් ලබා ගත් ප්‍රධාන ගුවන් තොටුපල 600 අතරට එක් වීය.

### ශ්‍රී ලංකන් ගුවන් සේවය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඛණ්ඩව පනවන ලද දේශසීමා හරහා ගමන් සීමා කිරීම් සහ ගුවන් තොටුපළ වසා දැමීම් හමුවේ වුවද, ජාතික ගුවන් සේවය ලෙස ජාත්‍යන්තර වෙළඳාම පවත්වා ගෙන යාමටත්, නැවත සිය රටට පැමිණීමට අපේක්ෂාවෙන් සිටි ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීමටත්, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, 2021 මාර්තු මස අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ ප්‍රවාහනය කරන ලද මගීන් 166,969 හා සසඳන විට, සියයට 20 ක පමණ ආසන ධාරිතාවක් පවත්වා ගනිමින්, 2021 අප්‍රේල් සිට ජූලි දක්වා මගීන් 121,944 ක් ප්‍රවාහනය කිරීමට ශ්‍රී ලංකන් ගුවන් සේවය සමත් වී ඇත. 2020/21 වසර තුළ ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් ප්‍රවාහනය කරන ලද මුළු භාණ්ඩ ටොන් 56,406 හා සසඳන විට, 2021 අප්‍රේල් සිට ජූලි දක්වා කාලය තුළ භාණ්ඩ ටොන් 29,442 ක් ප්‍රවාහනය කර ඇත.

2021 මාර්තු මාසයෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ ලද ආදායම වූ රු. මිලියන 39,600 ට සාපේක්ෂව, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් 2021 අප්‍රේල් මස සිට ජූලි මස දක්වා කාලය තුළ රු. මිලියන 28,600 ක ආදායමක් උපයා ගෙන ඇත. 2020/21 මූල්‍ය වර්ෂයේ දී රු. මිලියන 58,066 ක් වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව, 2021 අප්‍රේල් සිට ජූලි දක්වා සමාගමේ ශුද්ධ අලාභය රු. මිලියන 24,800 ක් වී ඇත.

වගුව 3.2: ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායීත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යවසාය | 2019* | 2020* | 2021.07.31 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා (කෙටුම්පත්) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 29,685 | 23,552 | 31,056 |
| 2 | මහජන බැංකුව | 19,666 | 21,227 | 15,006 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 10,462 | 15,645 | 16,652 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 465 | 587 | 316 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 774 | 978 | 638 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,222 | 1,586 | 412 |
| 7 | සේවා නියුක්තයන්ගෙ භාර අරමුදල් මණ්ඩලය | 29,761 | 32,500 | 2,475 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 19,865 | 23,663 | 13,728 |
| 9 | ජාතික රක්ෂණභාර අරමුදල | 3,009 | 9,015 | 4,523 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 253 | 265 | 183** |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 627 | 1,257 | 207 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -85,411 | -62,561 | -929 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -11,836 | 2,371 | -61,886 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 16,155 | 20,327 | 11,525 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | -1,111 | 663 | -825 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 15,223 | -3,748 | -1,792 |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම (අ) | -47,198 | -58,066 | -24800 |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,890 | -2,383 | -3,215 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -976 | -997 | -730 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 340 | 261 | -6 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | -844 | -243 | -106 |
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | -619 | 417 | 240 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | -362 | 6 | 110** |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -330 | -150 | -95 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -757 | -350 | -118 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 120 | 214 | 289 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 64 | 283 | 295 |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | -53 | 43 | -34 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 43 | 15 | 2** |
| 30 | සිමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 1,982 | 69 | 450 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 21 | 66 | 23** |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 21 | 1 | 6 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,897 | 2,994 | 1,857 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,323 | 1,435 | 1,369** |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 592 | 1,164 | 653 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 3 | 9 | 5 |

| | රාජ්‍ය ව්‍යවසාය | **2019*** | 2020* | 2021.07.31 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා (කෙටුම්පත්) |
|---|---|---|---|---|
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2,176 | 2,546 | 485 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | -94 | 174 | 21 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -571 | -213 | -244 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -501 | -234 | -56 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -101 | -28 | 29 |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 99 | -98 | -58 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 317 | 464 | 80 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | -27 | -120 | 31** |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -2,982 | -1,381 | -151** |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -169 | 23 | -226** |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -100 | -48 | -43 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -71 | -109 | -83 |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 189 | 268 | 12 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 306 | 241 | 58 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -312 | -892 | -153 |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | -1,304 | 1,171 | 158 |
| | එකතුව | **3,821** | **33,879** | **7,344** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යවසායයන් දෙපාර්තමේන්තුව
* කෙටුම්පත්
** 2021.06.30 දිනට ලාභය (2021 ජනවාරි මස සිට ජූනි මස දක්වා)
(අ) - මූල්‍ය වර්ෂය මාර්තු 31 න් අවසන් වේ (උදා: 2020- 2020/21)

වගුව 3.3 : රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම — රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | 2019 | තත්‍ය 2020 | 2021.07.31 දක්වා | ප්‍රක්ෂේපිත 2022 | 2023 |
|---|---|---|---|---|---|
| අයබදු | **22,634** | **14,769** | **10,058** | **22,537** | **22,610** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,000 | 1,000 | 1,500 | 1,510 | 1,520 |
| ලංකා බැංකුව | - | 1,250 | 1,500 | 2,010 | 2,020 |
| මහජන බැංකුව | 2,200 | 2,500 | 500 | 3,000 | 3,000 |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 8,950 | 5,000 | 5,500 | 10,050 | 10,100 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 169 | – | – | - | - |
| රාජ්‍ය දැව සංස්ථාව | 50 | – | – | 50 | 50 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 3,268 | 782 | 412 | 2,000 | 2,000 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2,300 | – | – | 350 | 350 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 25 | – | – | 15 | 15 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 250 | 156 | – | 500 | 500 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 53 | – | – | - | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 15 | – | – | 25 | 25 |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 25 | – | – | 25 | 25 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 500 | – | – | 300 | 300 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 800 | – | – | 500 | 500 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | | | | 200 | 200 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | | | 200 | 200 |

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | 2019 | තත්‍ය 2020 | 2021.07.31 දක්වා | ප්‍රක්ෂේපිත 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 200 | – | – | 200 | 200 |
| ශ්‍රී ලංකා විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | 650 | – | – | 500 | 500 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 50 | – | – | - | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 200 | – | – | 300 | 300 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | 29 | – | – | 150 | 150 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 900 | – | – | - | - |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | – | 81 | 80 | 82 | 83 |
| ජාතික ව්‍යවසායයන් කළමනාකාරීත්ව විද්‍යායතනය | - | - | 16 | 18 | 20 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | | | | 2 | 2 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | – | 4,000 | – | - | - |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | | | 350 | 350 | 350 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | | | 200 | 200 | 200 |
| **ලාභාංශ** | **5,025** | **2, 855** | **3,685** | **5,818** | **5,881** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 30 | 65 | 70 |
| ලංකා බැංකුව | 346 | 347 | 173 | 350 | 355 |
| මහජන බැංකුව | 316 | 316 | 158 | 320 | 321 |
| සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | 1 | - | - |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,720 | 695 | 899 | 2,000 | 2,000 |
| සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම | 500 | - | - | 350 | |
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | 130 | - | 500 | 500 | 500 |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 7 | - | 5 | 5 | 7 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 2 | - | - | - |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | 37 | - | - | 30 | 30 |
| සීමාසහිත මාන්තායි සෝල්ට් සමාගම | – | 2 | 1 | 8 | 8 |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 15 | 304 | - | 8 | 8 |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | - | - | 10 | 10 |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | – | 10 | - | 20 | 20 |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 947 | 947 | 1,331 | 1,350 | 1,350 |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 133 | - | 159 | 175 | 175 |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | 501 | - | 327 | 350 | 350 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 82 | - | 60 | 60 |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 23 | 77 | 48 | 100 | 100 |
| සීමාසහිත ලංකා ත්‍රිපෝෂ සමාගම | | | | 30 | 30 |
| වැවිලි සමාගම් | 172 | 12 | 53 | 86 | 86 |
| වෙනත් | 12 | - | - | 1 | 1 |
| **එකතුව** | **27,659** | **17,624** | **13,743** | **28,355** | **28,491** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යවසායයන් දෙපාර්තමේන්තුව

# 2022 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක | 04

**2022 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරන පදනම**

2022 අයවැයෙහි සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය ඇස්තමේන්තු, අයවැය සකස් කරන අවස්ථාවේ පවත්නා උපකල්පන, විශ්ලේෂණ සහ කාර්ය මණ්ඩල විනිශ්චයන් මාලාවක් පදනම් වී ඇත. මෙමගින් දළ දේශීය නිෂපාදිතය, උද්දමනය, විදේශ අංශයේ වර්ධනයන් හා සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික දර්ශකවල සහ ඇස්තමේන්තු සඳහා භාවිතා කරන උපකල්පන වල විස්තර ද සපයනු ලබයි.

**දළ දේශීය නිෂ්පාදිතය**

දේශීය හා විදේශීය දෙඅංශයෙහිම පෙර නොවූ විරූ අභියෝග පැවතියද, 2021 වසරේ පළමු භාගයේ දී සියයට 8.0 ක ආකර්ෂණීය ආර්ථික වර්ධනයත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය 'V' හැඩැති යථාතත්වයට පත්වීම සිදු විය. සමාජයේ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් ආරක්ෂා කරන අතරම හොඳින් කළමනාකරණය කරන ලද එන්නත්කරණ ක්‍රියාවලිය හා වසංගතය පාලනය සඳහා රජයේ කැපවීම සමඟ 2022 වසරේ දී ආර්ථිකය සියයට 5.0 කින් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. අපනයන සැකසුම් කලාප, රෙදිපිළි උද්‍යානය, ඖෂධ සැකසුම් කලාපය ආදී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති, වරාය නගරය, තාක්ෂණ උද්‍යාන ආදී ප්‍රධාන ව්‍යාපෘති සඳහා අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන ගලා ඒම, ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කිරීමට උපකාරී විය. නිදහස් වරාය ක්‍රියාකාරකම් පුළුල් කරන අතරම රජයේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා මෙය තවදුරටත් ශක්තිමත් වනු ඇත. කෙසේ වුවද වසංගත ආශ්‍රිත අවදානම් සහ එහි ප්‍රතිවිපාක, සැපයුම් අංශයට වන බාධා, සේවා වියුක්තියේ වර්ධනය සහ උද්ධමන පීඩනය අපේක්ෂිත වර්ධනය කෙරෙහි පීඩනයක් එල්ල කරනු ඇත.

ඉල්ලුම් අංශයෙන් බලන කල, පෞද්ගලික හා රජයේ අවසාන පාරිභෝජන වියදම්, ශුද්ධ අපනයනය සහ දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 2022 වසරේ දී වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. සැපයුම් අංශයෙන්, කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන වර්ධන අපේක්ෂාවන් සඳහා ධනාත්මක දායකත්වයක් සපයනු ඇත. අපේක්ෂිත හිතකර කාළගුණික තත්ත්වයන් බද්ද වූ පැහැදිලි ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම් තුළින් පළතුරු, එළවළු සහ විසිතුරු මල් ආදී සාම්ප්‍රදායික නොවන කෘෂිකාර්මික අයිතම හා විශේෂයෙන් වැවිලි බෝග සහ අපනයන බෝග ආදියෙන් සමන්විත කෘෂිකාර්මික අංශය පුනර්ජීවනය කිරීමට අපේක්ෂා කෙරේ සෙසු ප්‍රධාන අංශ අතර නිෂ්පාදන කර්මාන්ත හා ඉදිකිරීම් අංශයේ ඇතිවිය හැකි වර්ධනයේ ප්‍රතිලාභ ලබමින් 2022 වසරේ දී කර්මාන්ත අංශය යළි යථාතත්වයට පත් වීමට අපේක්ෂා කෙරේ. දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වය සපයන සේවා අංශය ද, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ප්‍රවාහන, මූල්‍ය සේවා සහ දේපල වෙළඳාම් අංශයේ ධනාත්මක දායකත්වය ද සමඟින් තවදුරටත් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා අංශයෙහි පුළුල්වීම සඳහා රටෙහි අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශ උත්ප්‍රේරකයක් ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පාරිභෝගික මිල**

මෑත කාලීනව දේශීය හා විදේශීය යන දෙඅංශයෙහි වසංගතයෙන් ඇති වූ ඉල්ලුම් සහ සැපයුම් පාර්ශවයේ නොගැලපීම් හේතුවෙන් 2021 වසරේපළමු භාගයේ දී මිල ඉහළ යාමක් දක්මට ලැබුන ද, වර්තමාන ඉහළ උද්ධමනය 2022 වසරේදී අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර එය 2022 වසරේදී මැදි තනි ඉලක්කම් මට්ටමේ උද්ධමනයක් පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. රටේ ආහාර සුරක්ෂිතතාව ළඟා කර ගැනීම සඳහා දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වන රජයේ කැපවීම් සැපයුම් අංශය වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇත. මීට අමතරව, අවශ්‍ය විට අදාළ බදු සහ තීරු බදු සහ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සංශෝධනය කිරීම මගින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවර කිරීමට වෙළඳ සහ මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සැපයුම් අංශයේ බාධක සහ ආර්ථිකයන් නැවත විවෘත වීමට ආරම්භ වීමත් සමඟ ඉන්ධන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම හේතුවෙන් 2018 වසරෙන් පසු ප්‍රථම වතාවට 2021 ඔක්තෝම්බර් මාසයේදී බැරලයක් ඇ.ඩො. 80 ඉක්මවා වාර්තා කරමින් ඉන්ධන මිල ඉහළ යමින් පවතින අතර, එය ශ්‍රී ලංකාවේ ඉන්ධන මිලට අමතර පීඩනයක් වනු ඇත. මෙය 2022 වසරේදී යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟින් රාජ්‍ය මූල්‍ය අංශයේ අපේක්ෂිත ඉහල කාර්ය සාධනය සමඟ, උද්ධමනය 2022 වසරේදී ඉලක්ක ගත මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය**

විශේෂයෙන්ම කාර්මික සහ සේවා අංශයන් සඳහා දේශීය හා විදේශීය ආයෝජන ආකර්ශනය කර ගැනීම තුළින් වැඩි අවස්ථා නිර්මාණය කරමින් රැකියා තිරසාර මට්ටමක තබා ගැනීමට රජය විසින් අඛණ්ඩ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. වසර ගණනාවක් පුරා නිරීක්ෂණය කළ පරිදි, කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2020 වසරේදී සියයට 32.0 ක් වන අතර එය ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම් හා සලකා බැලීමේදී බෙහෙවින්ම අවම අගයකි. එබැවින්, මාර්ගගත පිවිසුම් තුළින් සේවා සැපයීමට පහසුකම් සැලසීමේ නම්‍යශීලී පරිපාලන ක්‍රියාමාර්ග සමඟින් කාන්තා ශ්‍රම බලකායේ ක්‍රියාකාරී සහභාගීත්වයක් අපේක්ෂා කෙරේ. 2021 වසරේ දෙවන කාර්තුවේදී විරැකියා අනුපාතය ප්‍රතිශතාංක 0.6 කින් පළමු කාර්තුවේ සියයට 5.7 සිට සියයට 5.1 දක්වා අඩු වීමත් සමඟ නව සාමාන්‍ය ආර්ථික තත්ත්වයේ ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම තුළ විරැකියා අනුපාතය අඩු

වී ඇත. එබැවින්, විරැකියා අනුපාතය 2022 වසරේදී සියයට 4.5 ට අඩු කර එම මට්ටමේ පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**විදේශ අංශය**

අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කර තිබියදීත් ආනයන සාමාන්‍ය තත්වයට පත්වෙමින් අපනයන වැඩිවීමත් සමඟ 2022 දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයෙහි යළිත් පිබිදීමක් අපේක්ෂා කරන බැවින් වෙළඳ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 හා 2022 වසරවල දී ප්‍රවාහන සේවා සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය පුළුල් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීමත් සමඟ සංචාරක ව්‍යාපාරය සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යථා තත්ත්වයට පත් වනු ඇතැයිද අපේක්ෂා කෙරේ. මෙලෙස විදේශීය ජංගම ගිණුමේ හිඟය මධ්‍ය කාලීනව අඩු වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. වරාය නගර ව්‍යාපෘතියේ ආරම්භ කිරීමත් සමග සෘජු විදේශ ආයෝජන ගලා ඒම නැවත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර 2022 වසරේදී ස්ථාවර විනිමය අනුපාතයක් අපේක්ෂා කෙරේ.

**මුදල් සමස්තයන්**

2021 වසරේ දී අපේක්ෂිත නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට අනුකූල වන පරිදි මුදල් සැපයුම පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමත් සමගම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍ර කිරීමේ ප්‍රයත්නයන්, 2022 වසරේදී අපේක්ෂිත ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගැනීමට පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා භාවිතා කළ හැකි, වැඩි සම්පත් ප්‍රමාණයක් වෙළෙඳපොළට එක් කෙරෙනු ඇත.

**ආදායම**

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කළ උපකල්පන ඇමුණුම IV හි දක්වා ඇත.

**වියදම්**

වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගත් පදනම් පහත සඳහන් වේ.

- රාජ්‍ය අංශයේ මිලියන 1.5 ක පමණ සේවක පිරිසක් සිටින අතර, ඔවුන්ට වාර්ෂිකව හිමිවන අනුමත වැටුප් වර්ධක හේතුවෙන් සිදුවන වාර්ෂික නාමික වැටුප් වැඩිවීම මත වැටුප් හා වේතන වියදම පදනම් වී ඇත.
- 2021 සහ 2022 වසරවල දී පිළිවෙලින් විශ්‍රාම යාමට නියමිත විශ්‍රාමිකයින් 25,000 ක් සහ 28,000 පමණකගේ ආංශික බලපෑම සමඟ විශ්‍රාම වැටුප් ගෙවීම වන වියදම් ඇස්තමේන්තු කිරීමේ දී විශ්‍රාමිකයින් සංඛ්‍යාව මිලියන 0.71ක් පමණ ලෙස උපකල්පනය සඳහා කර ඇත.
- උද්ධමනයේ මධ්‍යස්ථ වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේදී අපේක්ෂිත ඉහළ දේශීය පොලී අනුපාත වලට අනුව පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යනු ඇත.
- උපයෝගිතා සේවා සහ සැපයුම් ආදිය මත වන වියදම් එහි මධ්‍ය කලීන මූල්‍ය ඉලක්ක දැඩිව ලෙස කළමනාකරණය කිරීම තුළින් තවදුරටත් දැඩි කරනු ඇත.
- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ලබා දෙන මුදල් ප්‍රදානයන්ට අමතරව පාසල් සිසුන් සහ ආබාධිත සෙබළුන් සඳහා ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් කුටුම්බ සඳහා වන සහනාධාර අඛණ්ඩව ලබා දෙනු ඇත. කෘෂිකාර්මික ආධාර වැඩසටහන් සමඟ එක්ව නොමිලේ ඖෂධ, දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන් වැනි අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණ සහ සුබසාධන යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- සියලුම අංශ සඳහා තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල්කරණය පදනම් වූ විසඳුම් ප්‍රවර්ධනයට ප්‍රමුඛත්වය ලබා දී ඇත.
- රාජ්‍ය ආයතන සහ සංස්ථා වෙත සිදු කරන පැවරුම් අපේක්ෂිත මට්ටමින් පවත්වාගෙන යනු ලබන අතර ඒවායේ කාර්ය සාධනයේ ඉහල දියුණුවක් අපේක්ෂා කෙරේ.
- ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පුද්ගලික අංශය උත්තේජනය කරමින් මාර්ග, ප්‍රවාහනය, ජලය, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ වෘත්තීය පුහුණුව වැනි ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන මධ්‍ය කාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5-7 ත් අතර පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
- රාජ්‍ය වියදම් වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සහ ඵලදායි නොවන වියදම් සීමා කිරීම සඳහා දරන උත්සාහයන් ශක්තිමත් කරනු ඇත.
- සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී අයවැය ප්‍රතිපාදන උපයෝජනයේ සුමට ක්‍රියාකාරිත්වයට සහ ද්විකරණය වැළැක්වීමට, විමධ්‍යගත ආයතතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ මනා අධීක්ෂණයකින් සහ සමීප සම්බන්ධතාවයකින් කටයුතු කෙරේ.

- රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය සඳහා ඒකාග්‍රතා කළමනාකරණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කෙරේ.

- ක්‍රියාවලිය, සේවා සැපයීම සහ නීතියේ ආධිපත්‍යය අනුව ආයතනික සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.

**ණය ගැනීම්**

2020 වර්ෂය වන විට පැවති රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය ක් ලෙස සියයට 101.0 සිට 2021 වසරේ දී සියයට 102.8 දක්වා වැඩිවීමට නියමිත අතර එම අනුපාතය 2022 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 101.6 දක්වා අඩු වනු ඇත. මෙම ණය, 2027 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 75 ක් පමණ දක්වා අඩු කරගනු ඇත පුරෝකථනය කෙරේ. රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස අඛණ්ඩව පහත හෙළීම තහවුරු කිරීම සඳහා දේශීය හා විදේශීය ණය ගැනීම්වල නිසි සංයෝජනයක් පවත්වාගෙන යනු ඇත. බදු ආදායම ඉහළ නැංවීම, වියදම් තාර්තික කිරීම සහ විදේශ අංශය ශක්තිමත් කිරීම සිදු කරන අතරතුර ආදායම් මත පදනම් වූ මූල්‍ය ඒකාබද්ධතාවය තුලින් ණය සීමා කිරීමට අපේක්ෂා කෙරේ රජයේ මූල්‍ය අවශ්‍යතා අවම පිරිවැයකින් සපුරාලීම සහතික කිරීම සඳහා ණය කළමනාකරණයට අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.

**ඇස්තමේන්තු වල සංවේදීතාව**

ආර්ථික පුරෝකථන පහත සඳහන් අභියෝග මත සංවේදී වනු ඇත.

- 2022 වසරේදී ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම අපේක්ෂා කරමින් ජාත්‍යාන්තර බලශක්ති සහ අනෙකුත් භාණ්ඩවල මිල ගණන් වැඩි වූයේ නම් ආනයන පිරිවැය, දේශීය පාරිභෝගික මිල, නිෂ්පාදන පිරිවැය මෙන්ම අයවැය වියදම් කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති නමුත්, ඒ හේතුවෙන් ඇතිවන අපනයන වැඩිවීම වැනි හිතකර ප්‍රතිඵල

- කෝවිඩ් 19 වසංගතය හෝ වෙනත් ආශ්‍රිත සෞඛ්‍ය අවදානම් තිව්‍ර වීම.

- දේශීය නිෂ්පාදිතය ජාත්‍යන්තර වෙළඳාම, දේශීය මිළ සහ සමස්ත වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බාහිර කම්පන සඳහා ගැලපුම් පිරිවැය.

- ස්වාභාවික විපත් හා ජාත්‍යන්තර භූ දේශපාලන අවිනිශ්චිතතාවයන් හා සම්බන්ධ අවදානම්

- කෘෂිකර්මාන්තය, ජල විදුලි උත්පාදනය සහ රාජ්‍ය අයවැය මත ඇතිවන අහිතකර බලපෑම් ඇති කළ හැකි අහිතකර කාලගුණික තත්ත්වයන්.

- පරිපාලන හා ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ අවහිරතාවයන්

- මධ්‍යකාලීනව අපේක්ෂා කරන පරිවර්තනයන් සිදු කිරීමට පවතින සීමිත හැකියාව හේතුවෙන් විදේශ අරමුදල් මඟින් සිදුකෙරෙන විශාල ව්‍යාපෘති වලට සහ එමඟින් ආයෝජන මට්ටම සහ ආර්ථික වර්ධනය කෙරෙහි ඇතිවන බලපෑම්

- රාජ්‍ය මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවදානම්

- ගෝලීය අසමතුලිතතාවයන් පහතවැටීම හේතුවෙන් අපේක්ෂිත ගෝලීය ආර්ථික වර්ධනයට වඩා අඩු අගයක් ගන්නා අතර එමඟින් ශ්‍රී ලාංකික භාණ්ඩ හා සේවා සඳහා වන විදේශීය ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති අතරම, එමඟින් ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වීම.

- ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඛනිජ තෙල් සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් උච්චාවචනයන් සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනයේ අපේක්ෂිත ඉලක්ක කෙරෙහි බලපෑම් ඇති කරනු ලැබිය හැකි අතර එමඟින් රජයේ ආදායම් හා වියදම් කෙරෙහි ද ඇතිවන බලපෑම්

- රාජ්‍ය අංශයේ සේවකයින්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් ආශ්‍රිත පුනරාවර්තන වියදම් වැඩිවීමේ ප්‍රවණතාවන්

- දුර්වල කාර්යසාධනයක් පිළිබිඹු කරන රජය සතු වාණිජ ව්‍යවසායයන්

**2021 අගෝස්තු 31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව**

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 26,526.65 | 312,841.80 |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 185,990.76 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 14,734.29 | |
| | | සීමාසහිත ලංකා ගල් අඟුරු (පෞද්ගලික) සමාගම | 11,000.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,427.77 | |
| | | ජාතික කඩදාසි සංස්ථාව | 140.00 | |
| | | වී අලෙවි මණ්ඩලය | 1,942.95 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 51,249.95 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,350.00 | |
| | | ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 10,138.44 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100.00 | |
| | | සී/ස ලංකා සතොස සමාගම | 3,241.00 | |
| 2 | ලංකා බැංකුව | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | 406,432.90 |
| | | ලංකා විදුලිබල, මණ්ඩලය | 5,000.00 | |
| | | ලංකා ධීවර සංස්ථාව | 350.00 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 184,407.93 | |
| | | ඇල්කඩුව වැවිලි සමාගම | 30.00 | |
| | | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 835.00 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 140.00 | |
| | | සීමාසහිත ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල | 8,600.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 55,176.62 | |
| | | නෝර්ත්සී ලිමිටඩ් | 39.02 | |
| | | වී අලෙවි මණ්ඩලය | 2,500.00 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 135,443.03 | |
| | | ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 7,621.42 | |
| | | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 1,000.00 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව | 200.00 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,189.88 | |
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 7,500.00 | 176,011.61 |
| | | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 35,923.35 | |
| | | ලක්දනව් ලිමිටඩ් | 2,992.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 30,710.61 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 92,615.66 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ආයතනය | 3,500.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 4 | කොමර්ෂල් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 968.36 | 5,724.29 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,755.93 | |
| 5 | ඩීඑෆ්සීසී බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | 11,922.75 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,896.51 | |
| 6 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | ලක්දනව් ලිමිටඩ් | 2,992.00 | 2,992.00 |
| 7 | චීන එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 18,165.21 | 18,165.21 |
| 8 | හැටන් නැෂනල් බැංකුව | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 4,000.00 | 37,637.50 |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 13,504.35 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 20,133.15 | |
| 9 | හොංකොං සහ ෂැංහයි බැංකු සමාගම | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 9,043.76 | 42,003.77 |
| | | වෙස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගම | 32,960.01 | |
| 10 | සීමාසහිත චීන කර්මාන්; හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 8,600.05 | 8,600.05 |
| 11 | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (ජයිකා) | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 142,038.75 | 142,038.75 |
| 12 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 21,380.43 | 21,380.43 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 6,299.21 | 6,299.21 |
| 13 | ඉන්දියන් එක්සිම් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 52,597.24 | 52,597.24 |
| 14 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 12,799.28 | 12,799.28 |
| 15 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 95,277.43 | 95,277.43 |
| 16 | සම්පත් බැංකුව | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 |
| 17 | යුනිකෙඩිට් බැංකුව ඔස්ට්‍රියා ඒ.ජී. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 12,368.56 | 12,368.56 |
| 18 | අයි' එන්' ජී' බැංකුව" නෙදර්ලන්තය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 20,276.59 | 20,276.59 |
| 19 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2,458.77 | 2,458.77 |
| 20 | සීමාසහිත චයිනා ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 8,969.40 | 8,969.40 |
| 21 | සීමාසහිත ඩීබී ට්‍රස්ටීස් (හොං කොං) සමාගම | ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 35,857.10 | 35,857.10 |
| 22 | ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | සීමාසහිත නෝර්ත් සී සමාගම | 60.00 | 60.00 |
| 23 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | ලංකා බැංකුව සහ මහජන බැංකුව | 36,881.59 | 36,881.59 |
| | | **එකතුව** | **1,484,096.23** | **1,484,096.23** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

සාර්ව ආර්ථික දර්ශක

**වගුව 1 : මූලික අංශයන්හි වර්ධන අනුපාතය %**

| | 2019 | 2020 | 2021 පළමු කාර්තුව (අ) | 2021 දෙවන කාර්තුව (අ) |
|---|---|---|---|---|
| ද.දේ.නි. | 2.3 | -3.6 | 4.3 | 12.3 |
| කෘෂිකර්මාන්තය | 1.0 | -2.4 | 6.1 | 8.1 |
| කර්මාන්ත | 2.6 | -6.9 | 5.5 | 22.1 |
| සේවා | 2.2 | -1.5 | 3.0 | 7.5 |
| උද්ධමනය - ද.දේ.නි. අවධමනකය (%) | 2.2 | 3.4 | 4.1 | 7.4 |
| සේවා වියුක්ති අනුපාතය (%) | 4.8 | 5.5 | 5.7 | 5.1 |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**වගුව 2: කෘෂිකාර්මික අංශයන්හි ක්‍රියාකාරිත්වය : 2019-2021**

| අංශය | 2019 | 2020 | 2021 (අ) | |
|---|---|---|---|---|
| | | | පළමු කාර්තුව | දෙවන කාර්තුව |
| තේ (කි. ග්‍රෑම් මිලියන) | 300.1 | 278.5 | 73.8 | 85.9 |
| වර්ධනය (%) | -1.2 | -7.2 | 37.5 | 11.8 |
| රබර් (කි. ග්‍රෑම් මිලියන) | 74.8 | 78.2 | 22.7 | 20.8 |
| වර්ධනය (%) | -9.5 | 4.6 | 16.0 | 15.6 |
| පොල් (ගෙඩි මිලියන) | 3085.6 | 2792.2 | 720.5 | 770.8 |
| වර්ධනය (%) | 17.6 | -9.5 | 7.4 | 13.5 |
| මත්ස්‍ය (මෙ. ටොන්)'000 | 505.8 | 428.7 | 108.9 | 101.3 |
| වර්ධනය (%) | -4.0 | -15.2 | -9.7 | 20.3 |
| | මහ | යල | මහ | |
| වී (මෙ.ටොන්)'000 | 3072.6 | 1924.2 | 3196.8 | |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

**වගුව 3 : කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය : 2019-2021**

රු. මිලියන

| අංශය | 2019 | 2020 | 2021 (අ) | 2021 (අ) |
|---|---|---|---|---|
| | | | පළමු කාර්තුව | දෙවන කාර්තුව |
| ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදනය | 574,888 | 599,902 | 185,555 | 121,937 |
| වර්ධන අනුපාතය | 2.8 | 4.4 | 6.0 | 5.4 |
| රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 326,803 | 287,844 | 108,972 | 56,943 |
| වර්ධන අනුපාතය | 0.7 | -11.9 | 8.4 | 60.7 |
| රසායනික ද්‍රව්‍යසහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 100,511 | 101,312 | 25,891 | 27,957 |
| වර්ධන අනුපාතය | 2.7 | 0.8 | 20.0 | 13.0 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 83,009 | 68,334 | 11,573 | 23,851 |
| වර්ධන අනුපාතය | -3.4 | -17.7 | 12.9 | 66.8 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 85,341 | 81,844 | 23,783 | 22,529 |
| වර්ධන අනුපාතය | 4.4 | -4.1 | 15.3 | 41.3 |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 100,797 | 87,299 | 32,125 | 23,833 |
| වර්ධන අනුපාතය | 8.4 | -13.4 | 9.4 | 54.4 |
| **කාර්මික අංශයේ එකතුව** | **2,608,211** | **2,427,844** | **716,261** | **546,207** |
| **කාර්මික අංශයේ සමස්ත වර්ධනය** | **2.6** | **-6.9** | **5.5** | **22.1** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**වගුව 4 : විදුලි බල නිෂ්පාදනය හා සේවා අංශයේ ක්‍රියාකාරිත්වය: 2020- 2021**

| අංශය | 2020 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කාර්තු 1 | කාර්තු 2 | අගෝ. | ජන. - අගෝ. | කාර්තු 1 | කාර්තු 2 | අගෝ. | ජන. - අගෝ. |
| **විදුලිබල නිෂ්පාදනය** | | | | | | | | |
| මුළු නිෂ්පාදනය (ස්වයංඋත්පාදනය හැර) | 3,987.1 | 3,644.7 | 1,371.3 | 10,406.0 | 4,073.8 | 4,088.7 | 1,344.7 | 10,945.8 |
| වර්ධන අනුපාතය | 1.4 | -10.0 | -0.1 | -3.3 | 2.2 | 12.2 | -1.9 | 5.2 |
| ජල විදුලිය (සුළු පරිමාණ ජල විදුලිය හැර) | 784.4 | 818.1 | 468.3 | 2,321.7 | 691.8 | 1,459.2 | 458.8 | 3,215.2 |
| වර්ධන අනුපාතය | -7.4 | 60.5 | 56.9 | 26.3 | -11.8 | 78.4 | 4.4 | 38.5 |
| ඉන්ධන | 1,453.9 | 854.0 | 312.1 | 2,999.0 | 1,227.5 | 528.9 | 88.8 | 2,062.5 |
| වර්ධන අනුපාතය | -2.3 | -46.9 | -31.1 | -26.3 | -15.6 | -38.1 | -71.5 | -31.2 |
| ගල් අඟුරු | 1,440.2 | 1,520.7 | 401.0 | 3,960.1 | 1,720.7 | 1,370.4 | 557 | 4,019.6 |
| වර්ධන අනුපාතය | 9.2 | -1.3 | -6.7 | 3.5 | 19.5 | -9.9 | 38.9 | 1.5 |
| NCRE (සුළු පරිමාණ ජල විදුලිය ඇතුළත්ව) | 308.6 | 451.9 | 189.9 | 1,125.2 | 433.8 | 730.1 | 210.0 | 1,648.5 |
| වර්ධන අනුපාතය | 10.9 | 16.1 | -0.6 | 10.0 | 40.6 | 61.6 | 10.6 | 46.5 |
| ජලඃඉන්ධනඃගල් අඟුරුඃNCRC අනුපාතය | 20:36:36:8 | 22:23:42:12 | 34:23:29:14 | 22:29:38:11 | 17:30:42:11 | 36:13:34:18 | 36:7:41:16 | 29:19:37:15 |
| | කාර්තු 1 | කාර්තු 2 | සැප්. | ජන.-සැප්. | කාර්තු 1 | කාර්තු 2 | සැප්. | ජන.-සැප්. |
| ජලාශ වල ජල මට්ටම (සාමාන්‍ය) | 69.6 | 54.5 | 67.8 | 62.3 | 75.4 | 74.1 | 78.1 | 76.3 |
| | කාර්තු 1 | කාර්තු 2 | අගෝ. | ජන. - අගෝ. | කාර්තු 1 | කාර්තු 2 | අගෝ. | ජන. - අගෝ. |
| **වරාය සේවා** | | | | | | | | |
| හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය (මෙ. ටො.'000) | 27,249.0 | 20,911.9 | 9,624.2 | 67,102.6 | 27,142.8 | 27,645.1 | 9,296.3 | 73,765.5 |
| වර්ධන අනුපාතය | 1.0 | -22.1 | 5.3 | -6.5 | -0.4 | 32.2 | -3.4 | 9.9 |
| හසුරුවන ලද මුළු බහළුම් ගණන (බහළුම් '000) | 1,803.9 | 1,475.1 | 647.9 | 4,545.5 | 1,749.5 | 1,826.3 | 601.6 | 4,796.5 |
| වර්ධන අනුපාතය | 0.7 | -18.1 | 0.2 | -5.8 | -3.0 | 23.8 | -7.2 | 5.5 |
| **විදුලි සංදේශ සේවා (ග්‍රාහකයින් සංඛ්‍යාව)** | | | | | | | | |
| ස්ථාවර දුරකථන ('000) | 2,325.4 | 2,328.1 | ලැ.නො | ලැ.නො | 2,823.7 | 2,870.0 | ලැ.නො | ලැ.නො |
| වර්ධන අනුපාතය | -1.8 | -1.1 | ලැ.නො | ලැ.නො | 21.4 | 23.3 | ලැ.නො | ලැ.නො |
| ජංගම දුරකථන ('000) | 31,875.8 | 27,679.0 | ලැ.නො | ලැ.නො | 29,243.6 | 29,048.7 | ලැ.නො | ලැ.නො |
| වර්ධන අනුපාතය | -2.1 | -15.4 | ලැ.නො | ලැ.නො | -8.3 | 4.9 | ලැ.නො | ලැ.නො |
| මුළු ස්ථාවර හා ජංගම දුරකථන('000) | 34,201.2 | 30,007.1 | ලැ.නො | ලැ.නො | 32,067.3 | 31,918.7 | ලැ.නො | ලැ.නො |
| වර්ධන අනුපාතය | -2.1 | -14.5 | ලැ.නො | ලැ.නො | -6.2 | 6.4 | ලැ.නො | ලැ.නො |
| අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල ('000) | 13,079.0 | 13,295.3 | ලැ.නො | ලැ.නො | 19,371.0 | 20,628.9 | ලැ.නො | ලැ.නො |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික
ලැ.නො. - ලැබී නොමැත

**වගුව 5 : අපනයන කාර්යසාධනය: 2020-2021**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 ජන. - අගෝ. | 2021 ජන. - අගෝ. [අ] |
|---|---|---|
| **කෘෂිකාර්මික නිෂ්පාදන** | **1,516** | **1,766** |
| තේ | 806 | 882 |
| රබර් | 18 | 27 |
| පොල් නිෂ්පාදන | 222 | 277 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 471 | 579 |
| **කාර්මික නිෂ්පාදන** | **4,905** | **6,093** |
| රෙදිපිළි හා ඇඟළුම් | 2,853 | 3,435 |
| ඛනිජ තෙල් | 268 | 295 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,784 | 2,364 |
| **ඛනිජ අපනයන** | **14** | **31** |
| **අනෙකුත් අපනයන** | **9** | **14** |
| **මුළු අපනයන** | **6,445** | **7,903** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංක-ව
(අ) තාවකාලික

**වගුව 6 : ආනයන කාර්ය සාධනය 2020–2021**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 ජන. - අගෝ. | 2021 ජන. - අගෝ. [අ] |
|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **2,300** | **2,579** |
| සහල් | 21 | 24 |
| සීනි | 163 | 211 |
| අනෙකුත් ආහාර නිෂ්පාදන | 141 | 233 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,976 | 2,110 |
| **අතර මැදි භාණ්ඩ** | **5,692** | **7,942** |
| ඉන්ධන | 1,691 | 2,396 |
| තිරිඟු හා බඩ ඉරිඟු | 229 | 266 |
| පොහොර | 124 | 104 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,457 | 1,944 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 2,190 | 3,233 |
| **ආයෝජන භාණ්ඩ** | **2,253** | **2,882** |
| **අනෙකුත් ආනයන** | **11** | **8** |
| **එකතුව** | **10,257** | **13,412** |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

වගුව 7 : ගෙවුම් ශේෂය - 2021

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2021 කාර්තු 1 [අ] | 2021 කාර්තු 2 [අ] |
|---|---|---|
| **වර්තන ගිණුමේ ශේෂය** | **-546** | **-990** |
| **වෙළඳ ශේෂය** | **-2,059** | **-2,257** |
| අපනයන | 2,982 | 2,717 |
| ආනයන | 5,041 | 4,974 |
| **සේවා (ශුද්ධ)** | **207** | **342** |
| ලැබීම් | 684 | 688 |
| ගෙවීම් | 477 | 346 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-493** | **-464** |
| ලැබීම් | 39 | 30 |
| ගෙවීම් | 532 | 494 |
| **ද්විතීක ආදායම් (ශුද්ධ)** | **1,798** | **1,389** |
| ද්විතීක ආදායම්: බැර | 1,868 | 1,459 |
| ද්විතීක ආදායම්: හර | 70 | 70 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **2** | **9** |
| ප්‍රාග්ධන ගිණුම :බැර | 10 | 14 |
| ප්‍රාග්ධන ගිණුම : හර | 8 | 6 |
| **වර්තන සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-544** | **-982** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-1,134** | **-786** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **4** | **4** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **129** | **174** |
| **කළඹ ආයෝජන : වත්කම්** | **–** | – |
| ණය සුරැකුම් | 0.57 | 31.81 |
| **කළඹ ආයෝජන : වගකීම්** | **-79** | **-5** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | -79 | -37 |
| ණය සුරැකුම් | 1 | 32 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **–** | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **-334** | **371** |
| විනිමය සහ තැන්පතු | -304 | 253 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 50 | 50 |
| අනෙකුත් ලැබීම් | -80 | 69 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **-800** | **967** |
| විනිමය සහ තැන්පතු | -277 | 100 |
| ණය | -722 | 710 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 266 | -28 |
| අනෙකුත් ගෙවීම් | -67 | 185 |
| විශේෂ ගැනුම් හිමිකම් | – | – |
| **වත්කම් සංචිත** | **-1,555** | **-26** |
| **ශුද්ධ වැරදි හා අත්හැරීම්** | **-590** | **196** |
| **සමස්ථ ශේෂය** | **-1,101** | **-1,261** |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

## වගුව 8 : විදේශ සංචිත

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 අවසන | 2021 - ජුනි | 2021 - ජූලි | 2021 - අගෝ. |
|---|---|---|---|---|
| මුළු විදේශ සංචිත | 8,521 | 6,824 | 5,947 | 7,309 |
| ආනයන ආවරණය කළ හැකි කාල සීමාව (මාස) | 6.4 | 4.5 | 3.8 | 4.6 |
| දළ නිල සංචිත | 5,664 | 4,060.0 | 2,806 | 3,544 |
| ආනයන ආවරණය කළ හැකි කාල සීමාව (මාස) | 4.2 | 2.6 | 1.8 | 2.2 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## වගුව 9 : ගෙවීමට ඇති විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණය

ඇ.ඩො. මිලියන

| අයිතම | 2021 ජූලි අවසානය * |
|---|---|
| **ගෙවීමට ඇති සම්පූර්ණ ණය** | **37,437.87** |
| රජයේ විදේශ ණය (අ) (ආ) | 32,186.92 |
| ඩොලර් මත පදනම් වූ දේශීය ණය | 5,250.95 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs)(අ) | 2,312.11 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (FCBUs) | 1,027.88 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර(අ) | 1,859.03 |
| විදේශ ව්‍යවහාර මුදල් මත පදනම් වූ දේශීය ව්‍යාපෘති ණය | 51.93 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) සටහන නැත
(ආ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, විදේශ ව්‍යාපෘති ණය සහ ඒකාබද්ධ ණය, විදේශයන්හි රැඳි භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර
* විදේශ විනිමය අනුපාතය-ඇ.ඩො.1 = 199.90 (2021 ජූලි 31)

## වගුව 10 : විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් නොපියවූ දේශීය ණය

ඇ.ඩො. මිලියන

| | 2020 අවසානය | 2021 සැප්තැම්බර් අවසානය |
|---|---|---|
| **නොපියවූ ණය** | | |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | 1,220.00 | 890.63 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (අ) | 2,638.60 | 2,305.41 |
| **ලැබීම්** | | |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ආ) | 507.03 | 991.33 |
| **ගෙවීම්** | | |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඇ) | 952.80 | 1,324.52 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) නේවාසික හා අනේවාසික සංවර්ධන බැඳුම්කර රඳවාගැනීම් ඇතුලත් වේ.
(ආ) මෙම කාලපරිච්ඡේදයේදී ලැබීම් යනු නිකුත් කිරීම් වේ.
(ඇ) මෙම කාලපරිච්ඡේදයේ ගෙවීම් යනු කල්පිරීම් වේ.

**වගුව 11 : තෝරාගත් විදේශ විනිමය අනුපාතයන්ගේ විචලනය (ඇ.ඩොලරයට සාපේක්ෂව)**

| මුදල් ඒකක | අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) | |
|---|---|---|
| | **2019** අවසානය -**2020** අවසානය | **2020** අවසානය - **2021** සැප්තැම්බර් |
| ශ්‍රී ලංකා රුපියල් | -2.56 | -6.79 |
| ඉන්දියන් රුපියල් | -2.56 | -1.56 |
| බංගලාදේශ ටකා | 0.29 | -1.02 |
| පාකිස්ථානු රුපියල් | -3.51 | -6.07 |
| සිංගප්පූරු ඩොලර් | 1.93 | -2.91 |
| තායිලන්ත බාත් | -0.25 | -11.92 |
| තායිවාන් ඩොලර් | 6.69 | 0.89 |
| ඉන්දුනීසියානු රුපියා | -1.12 | -1.83 |
| පිලිපීන පෙසෝ | 5.52 | -5.57 |
| කොරියානු වොන් | 6.77 | -8.47 |
| ජපාන යෙන් | 5.39 | -7.81 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**වගුව 12 : ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්**

රු. බිලියන

| කාලපරිච්ඡේදය අවසානයේ | දළ මුහුණත් අගය | ප්‍රති මිලදී ගැනීම් වලින් පසුව පොත් අගය |
|---|---|---|
| 2012 | 154.01 | 163.31 |
| 2013 | 3.05 | 13.29 |
| 2014 | 123.50 | 3.14 |
| 2015 | 104.75 | 79.05 |
| 2016 | 331.39 | 330.08 |
| 2017 | 9.91 | 25.60 |
| 2018 | 45.80 | 274.20 |
| 2019 | 74.74 | 125.30 |
| 2020 | 725.19 | 737.41 |
| 2021 සැප්තැම්බර් අවසානය | 1,332.21 | 1,640.18 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**වගුව 13 : පුද්ගලික අංශය සඳහා වාණිජ බැංකු මගින් ලබා දී ඇති ණය සංයුතිය - 2021 ජූනි (අ, ආ, ඇ)**

| | ප්‍රමාණය (රු. මිලියන) | මුළු මුදලින් % ලෙස |
|---|---|---|
| **1. කෘෂිකාර්මික හා ධීවර** | **529,706** | **7.7** |
| එයින් ... | | |
| තේ | 107,890 | 1.6 |
| රබර් | 36,564 | 0.5 |
| පොල් | 32,439 | 0.5 |
| වී | 42,710 | 0.6 |
| එළවළු සහ පලතුරු වගා කිරීම සහ සුළු ආහාර භෝග | 29,784 | 0.4 |
| පශු සම්පත් සහ කිරි ගොවිතැන | 28,870 | 0.4 |
| ධීවර | 21,154 | 0.3 |
| **2. කර්මාන්ත** | **2,768,377** | **40.4** |
| එයින් ... | | |
| ඉදිකිරීම් | 1,449,403 | 21.1 |
| එයින් ... | | |
| ... පෞද්ගලික නිවාස මිලදී ගැනීම/ ඉදිකිරීම්/අළුත්වැඩියා කිරීම් | 681,061 | 9.9 |
| ... නිල නිවාසය | 95,924 | 1.4 |
| ආහාර හා පාන වර්ග | 173,753 | 2.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 265,743 | 3.9 |
| දැව හා ලී බඩු ඇතුලත්ව දැව නිෂ්පාදන | 24,001 | 0.3 |
| කඩදාසි හා කඩදාසි නිෂ්පාදන | 20,907 | 0.3 |
| රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ඖෂධ සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 147,145 | 2.1 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 13,553 | 0.2 |
| මූලික ලෝහ නිෂ්පාදන | 53,988 | 0.8 |
| සකස් කල ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 145,337 | 2.1 |
| අනෙකුත් නිෂ්පාදන | 26,522 | 0.4 |
| **3. සේවා** | **1,882,564** | **27.5** |
| එයින් ... | | |
| තොග සහ සිල්ලර වෙළඳාම | 558,006 | 8.1 |
| සංචාරක කර්මාන්තය | 284,610 | 4.2 |
| මූල්‍ය සහ ව්‍යාපාර සේවා | 366,473 | 5.3 |
| ප්‍රවාහනය | 79,906 | 1.2 |
| සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය | 73,517 | 1.1 |
| මුද්‍රණ සහ ප්‍රකාශන | 29,082 | 0.4 |
| අධ්‍යාපන | 20,900 | 0.3 |
| සෞඛ්‍ය | 59,719 | 0.9 |
| නාවික ගුවන් හා සැපයුම් සහ භාණ්ඩ නිෂ්පාදනය | 23,875 | 0.3 |
| **4. පුද්ගල ණය සහ අත්තිකාරම් (ඈ)** | **1,677,224** | **24.5** |
| එයින් ... | | |
| කල්පවතින පාරිභෝගික භාණ්ඩ | 348,013 | 5.1 |
| උකස් | 268,402 | 3.9 |
| ණය කාඩ්පත් | 128,820 | 1.9 |
| පුද්ගල අධ්‍යාපනය | 11,366 | 0.2 |
| පෞද්ගලික සනීපාරක්ෂාව | 1,996 | 0.0 |
| **5. අනෙකුත්** | **861,001** | **12.6** |
| **එකතුව (ඉ)** | **6,857,871** | **100.0** |

මූලාශ්‍රයඃලංකා බැංකුව

(අ) තාවකාලික

(අ) වාණිජ බැංකුවල කාර්තුමය සමීක්ෂණය පදනම්ව, පෞද්ගලික අංශයට ලබාදුන් ණය සහ අත්තිකාරම් තුළ වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකයන්හි ණය සහ අත්තිකාරම් ද ඇතුලත්ය.

(ආ) ණය, අයිරා පහසුකම්, වට්ටම් කල බිල්පත් ඇතුලත් වන අතර රැස්කිරීමේ ක්‍රියාවලියේ ඇති මුදල් අයිතම ඇතුලත් නොවේ.

(ඇ) තාවකාලික

(ඈ) කර්මාන්ත යටතේ වර්ගීකරණය කල ඉදිකිරීම් හී ඇතුලත් කර ඇති පුද්ගල නිවාස ණය ඇතුලත් නොවන අතර, ශුද්ධ යෝජනා ක්‍රමය හා සම්බන්ධිත ණය ඇතුලත් වේ.

(ඉ) සම්පාදනය කිරීමෙ ක්‍රමවේදයන්හී පවත්නා වෙනස්කම් නිසා කාර්තුමය සමීක්ෂණය අනුව පෞද්ගලික අංශයට ලබාදුන් මුලු ණය ප්‍රමාණයට වඩා මාසික මුදල් සමීක්ෂණය අනුව එම අගය වෙනස් වේ.

වගුව 14 : **පොලී අනුපාතවල වෙනස්වීම් 2020–2021**

| පොලී අනුපාතය | **2020** ජූලි අවසානය | **2020** දෙසැම්බර් අවසානය | **2021** මාර්තු අවසානය | **2021** ජූනි අවසානය | **2021** සැප්. අවසානය |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතය** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) | 4.50 | 4.50 | 4.50 | 4.50 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) | 5.50 | 5.50 | 5.50 | 5.50 | 6.00 |
| **බර තැබූ සාමාන්‍ය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතය** (AWCMR) | 4.53 | 4.55 | 4.62 | 4.93 | 5.94 |
| **බර තැබූ සාමාන්‍ය විවට වෙළඳපොළ වෙන්දේසි අනුපාත (ප්‍රති මිලදී ගැනීම්)** | - | - | - | - | - |
| **බර තැබූ සාමාන්‍ය විවට වෙළඳපොළ වෙන්දේසි අනුපාත (ප්‍රති විකුණුම්)** | - | - | - | - | - |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | | | |
| දින - 91 | 4.59 | 4.69 | 5.05 | 5.18 | 6.70 |
| දින - 182 | 4.68 | 4.80 | 5.10 | 5.19 | 6.99 |
| දින -364 | 4.86 | 5.05 | 5.11 | 5.23 | 7.01 |
| **ණය දීමේ අනුපාතය** | | | | | |
| බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (AWPR) (සතිපතා) | 7.47 | 5.83 | 5.78 | 5.51 | 6.42 |
| බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (AWPR) (මාසික) | 7.79 | 5.74 | 5.67 | 5.67 | 6.39 |
| බර තැබූ සාමාන්‍ය ණයදීමේ අනුපාතය (AWLR) | 12.29 | 10.29 | 9.91 | 9.50 | - |
| **තැන්පතු අනුපාතය** | | | | | |
| බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR) | 7.16 | 5.80 | 5.20 | 4.87 | 4.75 |
| බර තැබූ සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතය | 8.69 | 7.14 | 6.29 | 5.82 | 5.64 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

## 2022 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන

2021 ඇස්තමේන්තුව සඳහා වන ආදායම් උපකල්පන, 2021 අගෝස්තු දක්වා එකතු කරන ලද තත්‍ය ආදායම සහ කොවිඩ්-19 හි බලපෑම ඇතුළු නැගී එන ප්‍රවණතා මත පදනම් වී ඇත. දේශ සීමා හරහා පැතිරී යන වසංගත තත්ත්වය හේතුවෙන් මෙම උපකල්පන වඩාත් තීරණාත්මක බවට පත් වී ඇත. අර්ථික ප්‍රවණතා, වසංගත තත්ත්වයේ බලපෑම සහ රටේ බදු ක්‍රමය මෙන්ම ආර්ථිකයේ සහ ආදායම් එකතුකිරීමේ කාර්යසාධනය පිළිබඳ කාර්ය මණ්ඩලයේ විනිශ්චය මත 2022 සඳහා වන ආදායම් ඇස්තමේන්තු පදනම් වී තිබේ.

පුළුල් උපකල්පන පහත පරිදි වේ.

- 2020 වසරේ දී වසංගත තත්ත්වය හේතුවෙන් අඩපණ වන ලද ආර්ථික වර්ධනයේ සිට ක්‍රමිකව ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමගම 2022 වසරේ දී ආර්ථිකය නැවත පණ ගැන්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සාර්ථක වූ කඩිනම් එන්නත්කරණ වැඩසටහනේ සහාය ඇතිව, 2021 වසරේ දී V හැඩැති ආර්ථික වර්ධනයක් දක්නට ලැබුණු අතර, 2022 වසරේ ආර්ථිකය සියයට 5-6 කින් වර්ධනය වීමට එය පදනම් වනු ඇත.
- 2021 වසර අවසානය වන විට සුදුසුකම් ලත් (අවුරුදු 16 ට) වැඩි සියළු ජනගහනය එන්නත්කරණයට ලක් කිරීමත් සමඟ "නව සාමාන්‍යකරණය" තත්ත්වයට ශ්‍රී ලංකාව සූදානම් වීමට අපේක්ෂා කෙරේ.
- මූල්‍ය අංශයේ ලාභ ඉපයීමේ හැකියාව තවදුරටත් වර්ධනය වෙතැයි අපේක්ෂා කෙරේ.
- දේශීය කෘෂිකාර්මික සහ කර්මාන්ත අංශයේ නිෂ්පාදන වර්ධනය වීම සහ ප්‍රමුඛතා පදනම මත සිදු කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය හේතුවෙන් වැඩි ආදායමක් සහ රැකියා අවස්ථා උත්පාදනය කර ගැනීමට ද, එමගින් ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව වර්ධනය කර ගැනීමට ද අපේක්ෂා කෙරේ.
- උද්ධමනය 2022 වසරේ දී සියයට 4-6 පරාසය තුළ පවත්වා ගෙන යාමට අපේක්ෂිතය.
- රැකියා වියුක්තිය 2022 වසරේ දී සියයට 5 පමණ මට්ටමට අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- අපනයන සංයුතියේ විවිධාංගීකරණයට සහ අගය එකතු කිරීමට ලබා දෙනු ලබන දිරිගැන්වීම්වල උපකාරයෙන් රජය විසින් අපනයනකරුවන්ට ලබා දෙනු ලබන සහාය සමඟ විදේශ අංශය බලගැන්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- විශේෂයෙන්ම එක්සත් ජනපදය සහ ඉන්දියාව වැනි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ගෙන් ලැබෙන බාහිර ඉල්ලුම වැඩි වීමත් සමඟ අපනයනවල වර්ධනයක් අපේක්ෂා කරනු ලබන අතර, දේශීය ආර්ථික කටයුතුවල ද ඒ හා සමාන වැඩි දියුණු වීමක් ඇති වීමට එය උපකාරී වනු ඇත.
- අපනයනවල ඉහළ වර්ධනයක් සහ ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා සහාය සැලසීම සඳහා පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශය විසින් ම ආයෝජන සහ අන්තර් භාණ්ඩ සඳහා වන ඉල්ලුම ඉහළ යාම සමඟ ආනයනවල ද සාපේක්ෂ ඉහළ වර්ධනයක් සිදු වනු ඇතැයි අපේක්ෂිතය.
- වැඩි වන ලද විදේශ සංචිත හේතුවෙන් ස්ථාවර විනිමය අනුපාතයක් තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- පහළ පොලී අනුපාත මට්ටම සමඟ දේශීය ආර්ථික කටයුතුවල ප්‍රබල වර්ධනය හේතුවෙන් දේශීය ඉල්ලුම ඉහළ යනු ඇත.
- ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 10.8 ක් ලෙස අපේක්ෂිත නාමික වර්ධනයට අනුකූල වන මට්ටමකින් 2022 වසර සඳහා මුදල් සැපයුම පවත්වා ගෙන යාමට අපේක්ෂිතය.
- ඩිජිටල්කරණ පද්ධති ක්‍රියාත්මක කිරීම මඟින් ආදායම් පරිපාලනමය හැකියාව සම්බන්ධ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සමඟින් නව ආදායම් ප්‍රභවයන් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.
- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) රජයේ සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කරනු ඇත.
- අන්තර්ජාතික ගමනාගමන කටයුතු සහ සංචාරක කර්මාන්තය 2022 වසරේදී ක්‍රමිකව ආරම්භ වීමට නියමිතය.
- විදේශ සේවා නියුක්තිය 2022 වසරේදී වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.

වගුව 1 : මෝටර් වාහන සඳහා නිෂ්පාදන බදු ව්‍යුහය (2021.09.30 දිනට)

| අයිතමය/ එන්ජින් ධාරිතාවය | අනුපාතය |
|---|---|
| **(i) මෝටර් කාර් - පෙට්‍රල්** | |
| සිලින්ඩර ධාරිතාවය 1000 ට අඩු | ඒකකයකට රු. 1,650,000/- හෝ ඝන සෙන්ටිමීරයකට රු. 2,000/- |
| සිලින්ඩර ධාරිතාවය 1000 - 1300 | ඝන සෙන්ටිමීරයකට රු. 3,200/- |
| සිලින්ඩර ධාරිතාවය 1300 - 1500 | ඝන සෙන්ටිමීරයකට රු. 3,700/- |
| සිලින්ඩර ධාරිතාවය 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 4,250/- |
| සිලින්ඩර ධාරිතාවය 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 5,300/- |
| සිලින්ඩර ධාරිතාවය 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 6,350/- |
| සිලින්ඩර ධාරිතාවය 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 7,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| සිලින්ඩර ධාරිතාව 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 11,000/- |
| **(ii) මොටර් කාර් - ඩීසල්** | |
| සිලින්ඩර ධාරිතාවය 1500 ට අඩු | ඝන සෙන්ටිමීරයකට රු. 4,600/- |
| සිලින්ඩර ධාරිතාවය 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 5,750/- |
| සිලින්ඩර ධාරිතාවය 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 6,900/- |
| සිලින්ඩර ධාරිතාවය 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| සිලින්ඩර ධාරිතාවය 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 11,000/- |
| සිලින්ඩර ධාරිතාවය 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 12,000/- |
| **(iii) මෝටර් කාර් - දෙමුහුන් - පෙට්‍රල්** | |
| සිලින්ඩර ධාරිතාවය 1000 ට අඩු | ඒකකයකට රු. 1,500,000/- |
| සිලින්ඩර ධාරිතාවය 1000 - 1300 | ඝන සෙන්ටිමීරයකට රු. 2,300/- |
| සිලින්ඩර ධාරිතාවය 1300 - 1500 | ඝන සෙන්ටිමීරයකට රු. 2,850/- |
| සිලින්ඩර ධාරිතාවය 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 4,000/- |
| සිලින්ඩර ධාරිතාවය 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 5,200/- |
| සිලින්ඩර ධාරිතාවය 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 5,700/- |
| සිලින්ඩර ධාරිතාවය 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 6,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 7,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| **(iv) මෝටර් කාර් - දෙමුහුන් - ඩීසල්** | |
| සිලින්ඩර ධාරිතාවය 1000 ට අඩු | ඝන සෙන්ටිමීරයකට රු. 3,400/- |
| සිලින්ඩර ධාරිතාවය 1000 - 1300 | ඝන සෙන්ටිමීරයකට රු. 3,400/- |
| සිලින්ඩර ධාරිතාවය 1300 - 1500 | ඝන සෙන්ටිමීරයකට රු. 3,400/- |
| සිලින්ඩර ධාරිතාවය 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 4,600/- |
| සිලින්ඩර ධාරිතාවය 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 5,700/- |
| සිලින්ඩර ධාරිතාවය 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 6,900/- |
| සිලින්ඩර ධාරිතාවය 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 7,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| සිලින්ඩර ධාරිතාව 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 11,000/- |

| අයිතමය/ එන්ජින් ධාරිතාවය | අනුපාතය |
|---|---|
| **(v) මෝටර් කාර් - විද්‍යුත්** | |
| **මෝටර් කාර් - විද්‍යුත් - බාහිර මූලාශ්‍ර හෝ විදුලි ජනන යන්ත්‍ර මඟින්** | |
| කි.වො.50 ට වඩා අඩු | කි.වො. 1 කට රු. 7,500/- |
| කි.වො. 50 - 100 | කි.වො. 1 කට රු. 10,000/- |
| කි.වො. 100 - 200 | කි.වො. 1 කට රු. 15,000/- |
| කි.වො.200 ට වැඩි | කි.වො. 1 කට රු. 40,000/- |
| **(v) මෝටර් කාර් - විද්‍යුත් -සූර්ය කෝෂ මගින්** | කි.වො. 1 කට රු. 7,500/- |
| **(vi)** වෑන් | |
| පුද්ගලයින් 13 -25 / ඩීසල් | එකකයකට රු. 4,500,000/- |
| පුද්ගලයින් 13 -25 / පෙට්‍රල් | ඝන සෙන්ටිමීටරයකට රු. 1,750/- |
| පුද්ගලයින් 13 ට වඩා අඩු/ ඩීසල් | 200% |
| පුද්ගලයින් 13 ට වඩා අඩු/ පෙට්‍රල් | 150% |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 2 : දුම්වැටි සඳහා නිෂ්පාදන බදු ව්‍යුහය (2021.09.30 දිනට)**

| කාණ්ඩය | රුපියල් /1000 කට |
|---|---|
| දුම්වැටි 1 ක දි මි.මී. 60 නොඉක්මවන | 13,360 |
| දුම්වැටි 1 ක දි මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී.67 නොඉක්මවන | 22,300 |
| දුම්වැටි 1 ක දි මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන | 37,650 |
| දුම්වැටි 1 ක දි මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන | 43,100 |
| දුම්වැටි 1 ක දි මි.මී. 84 ඉක්මවන | 48,350 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 3 : ඛනිජ තෙල් සඳහා වන නිෂ්පාදන බදු ව්‍යුහය (2021.09.30 දිනට)**

| අයිතමය | ලීටරයට රු. |
|---|---|
| පෙට්‍රල් | 27.00 |
| ඩීසල් - ඔටෝ | 6.00 |
| ඩීසල් - සුපර් | 13.00 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 4 : සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු ව්‍යුහය (2021. 09. 30 දිනට)

| වර්ගීකරණය | බදු අනුපාතය (රු.) |
|---|---|
| **මත්පැන්** | |
| මොලැසස්, තල්, පොල් සහ පදම් කළ අරක්කු (මධ්‍යසාර සෑම ලීටරයකටම) | 4,050 |
| මෙරට සෑදූ විදේශීය මත්පැන් (මධ්‍යසාර සෑම ලීටරයකටම) | 4,150 |
| ධාන්‍ය මත්පැන් ( මධ්‍යසාර සෑම ලීටරයකටම) | 3,200 |
| තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් පැලෑටියකින් ගන්නා ස්වාභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් මධ්‍යසාර (මධ්‍යසාර සෑම ලීටරයකටම) | 3,200 |
| **එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමු ද්‍රව්‍ය** | |
| පොල් රා (තොග ලීටරයක් සඳහා) | 5 |
| මොලැසස් (තොග කි. ග්‍රෑමයක් සඳහා) | 10 |
| ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සහල් (තොග කි. ග්‍රෑමයක් සඳහා) | 10 |
| ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ඉරිඟු (තොග කි. ග්‍රෑමයක් සඳහා) | 10 |
| ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන පළතුරු (තොග කි. ග්‍රෑමයක් සඳහා) | 10 |
| **විදේශ මත්පැන්** | |
| ආනයනික ධාන්‍ය මත්පැන් (බියර්) (තොග ලීටරයක් සඳහා) | 135 |
| ආනයනික වයින් (තොග ලීටරයක් සඳහා) | 230 |
| අනෙකුත් ආනයනික විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් හා වයින් හැර)(තොග ලීටරයක් සඳහා) | 650 |
| පානීය නොවන ස්ප්‍රිතු (තොග ලීටරයක් සඳහා) | 6 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 5 : වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බද්ද (2021.09.30 දිනට)

| අයිතමය | අනුපාතය |
|---|---|
| සාමාන්‍ය අනුපාතය | 10.0% |
| සහනදායී අනුපාතය | 7.5%, 5.0%, 2.5% |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 6 : එකතු කළ අගය මත බද්ද

| අනුපාතය | අයිතමය |
|---|---|
| ශුන්‍ය අනුපාතය | අපනයන භාණ්ඩ |
| සම්මත අනුපාතය (8%) | පොදු අයිතම |
| නිදහස් කිරීම් | එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ II වන කොටසේ ලැයිස්තුගත කර ඇති භාණ්ඩ හා සේවා |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### වගුව 7 : ආනයන රේගු බදු ව්‍යුහය (2021.09.30 දිනට)

| අයිතමය | අනුපාතය |
|---|---|
| මූලික අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර | ශූන්‍ය |
| අර්ධ නිමි අයිතම සහ අතර මැදි භාණ්ඩ | 10% |
| නිමි භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ | 15% |

මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### වගුව 8 : බදු කුලී ආදායම

රු. මිලියන

| අයිතමය | 2019 | 2020 (තාවකාලික) | 2021 (සංශෝධිත ඇස්තමේන්තුව) | 2022 (ඇස්තමේන්තු) |
|---|---|---|---|---|
| රජයේ ගොඩනැගිලි සහ නිවාස මත බදු කුලී | 1,069 | 1,153 | 1,200 | 1,800 |
| රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම් | 1,837 | 1,290 | 1,500 | 2,500 |
| ඉඩම් සහ අනෙකුත් බදු කුලී | 111 | 105 | 70 | 100 |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී | 754 | 952 | 1,420 | 1,700 |
| අනෙකුත් | 956 | 8,555 | 810 | 900 |
| **මුළු බදු කුලී ආදායම** | **4,727** | **12,055** | **5,000** | **7,000** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### වගුව 9 : ගාස්තු සහ අයකිරීම්

රු.මිලියන

| අයිතමය | 2019 | 2020 (තාවකාලික) | 2021 (සංශෝධිත ඇස්තමේන්තුව) | 2022 (ඇස්තමේන්තු) |
|---|---|---|---|---|
| රජයේ මුද්‍රණාලය විසින් කරනු ලබන සේවා සඳහා අයකිරීම් | 1,118 | 1,041 | 500 | 800 |
| ගමන් බලපත්‍ර,වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 14,054 | 5,533 | 5,700 | 8,480 |
| විභාග සහ අනෙකුත් ගාස්තු | 325 | 312 | 200 | 325 |
| මෝටර් රථ පනත යටතේ ගාස්තු සහ අනෙකුත් ලැබීම් | 10,289 | 7,237 | 6,000 | 7,400 |
| අනෙකුත් විවිධ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන මුදල් | 32,032 | 15,590 | 13,019 | 21,123 |
| **එකතුව** | **57,818** | **29,712** | **25,419** | **38,128** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 10 : විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත

කි. ග්‍රෑමයට රු.

| | අයිතමය | 2020 අවසානයට | 2021 සැප්. අවසානයට |
|---|---|---|---|
| 1 | හාල්මැස්සන් | 1 | 100 |
| 2 | අල | 55 | 50 |
| 3 | රතුළූනු | 50 | 50 |
| 4 | බී - ළූනු | සත 25 | 40 |
| 5 | සුදු ළූනු | 50 | 50 |
| 6 | වටානා - සම්පූර්ණ | 5 | 5 |
| | වටානා - පියලි කළ | 10 | 10 |
| 7 | කඩල - සම්පූර්ණ | 5 | 5 |
| | කඩල - පියලි කළ | 10 | 10 |
| 8 | මුංඇට | 40 | 40 |
| 9 | මයිසූර් පරිප්පු - සම්පූර්ණ | සත 25 | සත 25 |
| | මයිසූර් පරිප්පු - පියළි කළ | සත 25 | සත 25 |
| 10 | මිරිස් - නොඇඹරූ හෝ කුඩු නොකළ | 100 | 100 |
| | මිරිස් - ඇඹරූ හෝ කුඩු කළ | 125 | 125 |
| 11 | ටින් මාළු | 100 | 100 |
| 12 | සීනි | සත 25 | සත 25 |
| 13 | උඳු- සම්පූර්ණ | 200 | 200 |
| | උඳු - පොත්ත රහිත | 300 | 300 |
| 14 | කව්පි | 70 | 70 |
| 15 | කුරක්කන් | 70 | 70 |
| | මෙනේරි/ අනෙකුත් | 70 | 70 |
| 16 | උම්බලකඩ | 302 | 302 |
| 17 | කරවල | 127 | 100 |
| 18 | නැවුම් දොඩම් | 125 | 125 |
| 19 | නැවුම් මිදි | 200 | 200 |
| 20 | නැවුම් ඇපල් | 100 | 100 |
| 21 | කොත්තමල්ලි - නොඇඹරූ හෝ කුඩු නොකළ | 26 | 26 |
| | කොත්තමල්ලි - ඇඹරූ හෝ කුඩු කළ | 52 | 52 |
| 22 | සූදුරු | 162 | 162 |
| 23 | මහදුරු | 162 | 162 |
| 24 | කහ - නොඇඹරූ හෝ කුඩු නොකළ | 102 | 102 |
| | කහ - ඇඹරූ හෝ කුඩු කළ | 360 | 360 |
| 25 | උළුහාල් | 50 | 50 |
| 26 | කුරක්කන් පිටි | 150 | 150 |
| 27 | උඳු පිටි | 325 | 325 |
| 28 | රටකජු | 220 | 220 |
| 29 | අබ ඇට | 62 | 62 |
| 30 | පාම් තෙල්/එලවළුතෙල් - පිරිපහදු නොකළ | 250 | 250 |
| | පාම් ඔලෙයින් | 255 | 255 |
| | පාම් ස්ටියරින් | 250 | 250 |
| | පාම් තෙල් - පිරිපහදු කළ | 275 | 275 |
| | එලවළුතෙල් - පිරිපහදු කළ | 275 | 275 |
| | පාම් මද තෙල් | 250 | 250 |
| | පාම් මද ඉවත් කළ තෙල් | 275 | 275 |

| | අයිතමය | 2020 අවසානයට | 2021 සැප්. අවසානයට |
|---|---|---|---|
| | පොල්තෙල් - පිරිපහදු නොකළ | 125 | 125 |
| | පොල්තෙල් - පිරිපහදු කළ | 150 | 150 |
| 31 | මාළු | 10% හෝ රු. 200 | 10% හෝ රු. 200 |
| 32 | මැකරල් (ජැක්/හොර්ස් මැකරල්) | 6 | 6 |
| 33 | යෝගට් | 800 | 800 |
| 34 | බටර් | 880 | 880 |
| 35 | මාගරින් (මේදය 80%ට >) | 650 | 650 |
| | මාගරින් අනෙකුත් (මේදය 80%ට <) | 650 | 650 |
| 36 | ලූණු | 40 (බදු නිදහස්-30) | 40 (බදු නිදහස්-30) |
| 37 | රටඉඳි | 100 | 100 |
| 38 | වියලි මිදි | 200 | 200 |
| 39 | මැංගුස්ටින් | 200 | 200 |
| 40 | වියලි දොඩම් | 125 | 125 |
| 41 | පෙයාර්ස් | 220 | 220 |
| 42 | චෙරි | 315 | 315 |
| 43 | ප්ලම්ස් සහ ස්ලෝස් | 250 | 250 |
| 44 | කිවි පළතුරු | 175 | 175 |
| 45 | දෙළුම් (වෙනත්) | 200 | 200 |
| 46 | පෙරන් ගාන ලද/පිටි කරන ලද කේජු | 200 | 200 |
| 47 | බඩ ඉරිඟු | 25 | 25 |
| 48 | මුහුණු ආවරණ | 1 | 1 |
| 49 | ක්ලෙමන්ටයින්ස් - නැවුම් | 120 | 120 |
| 50 | ක්ලෙමන්ටයින්ස් -වියලි | 250 | 250 |
| 51 | අනෙකුත් (සිට්රස්) පළතුරු - නැවුම් | 120 | 120 |
| 52 | අනෙකුත් (සිට්රස්) පළතුරු - වියලි | 250 | 250 |
| 53 | ග්‍රේප් ෆෘට් - නැවුම් | 285 | 285 |
| 54 | ග්‍රේප් ෆෘට්-වියළි | 300 | 300 |
| 55 | දෙහි - නැවුම් | 350 | 350 |
| 56 | දෙහි - වියළි | 400 | 400 |
| 57 | අනෙකුත් (සිට්රස්) පළතුරු - නැවුම් | 300 | 300 |
| 58 | අනෙකුත් (සිට්රස්) පළතුරු - වියලි | 375 | 375 |
| 59 | වීසස් | 350 | 350 |
| 60 | ඇප්‍රිකට් | 350 | 350 |
| 61 | චෙරි - ඇඹුල් | 330 | 330 |
| 62 | පීච්ස් සහ නෙක්ටරින් | 310 | 310 |
| 63 | එලවළු මේදය සහ තෙල් | 160 | 160 |
| 64 | මාගරින් - දියර | 200 | 200 |

මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 11 : රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම සහ 2021 වර්ෂය සඳහා සංශෝධිත ඇස්තමේන්තුව

රු. මිලියන

| | | 2019 | 2020 | සංශෝධිත ඇස්තමේන්තුව 2021 |
|---|---|---|---|---|
| | **අයබදු** | **22,634** | **14,769** | **27,397** |
| 1 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,000 | 1,000 | 1,000 |
| 2 | ලංකා බැංකුව | – | 1,250 | 2,000 |
| 3 | මහජන බැංකුව | 2,200 | 2,500 | 3,000 |
| 4 | විදුලි සංදේශ හා නියාමන කොමිසම | 8,950 | 5,000 | 16,000 |
| 5 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 169 | - | – |
| 6 | රාජ්‍ය දුව සංස්ථාව | 50 | - | 50 |
| 7 | ජාතික රක්ෂණ භාර අරමුදල | 3,268 | 782 | 2,000 |
| 8 | භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 2,300 | - | 350 |
| 9 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 25 | - | 15 |
| 10 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 250 | 156 | 500 |
| 11 | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම | 53 | - | – |
| 12 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 15 | - | 25 |
| 13 | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය | 25 | - | 25 |
| 14 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශය | 500 | - | 300 |
| 15 | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය | 800 | - | 500 |
| 16 | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 200 | - | 200 |
| 17 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 650 | - | 500 |
| 18 | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 50 | - | – |
| 19 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 200 | - | 300 |
| 20 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 29 | - | 150 |
| 21 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 900 | - | – |
| 22 | ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය | - | 81 | 80 |
| 23 | මාර්ග සංවර්ධන අධිකාරිය | - | 4,000 | – |
| 24 | අනෙකුත් | | | 402 |
| | **ලාභාංශ** | **5,025** | **2,855** | **5,139** |
| 1 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB Fund Management Ltd) | 60 | 60 | 60 |
| 2 | ලංකා බැංකුව (Financial Accounting Unit) | 346 | 347 | 347 |
| 3 | මහජන බැංකුව (Restructuring Bond) | 316 | 316 | 317 |
| 4 | ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | – |
| 5 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,720 | 695 | 2,000 |
| 6 | ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 500 | - | 600 |
| 7 | ලංකා ඛණිජ වැලි සමාගම | 130 | - | 200 |
| 8 | ලංකා පොස්පේට් සමාගම | 7 | - | 3 |
| 9 | ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 2 | – |
| 10 | රක්නා ආරක්ෂක ලංකා සමාගම | 37 | - | 30 |
| 11 | මාන්තායි සෝල්ට් සමාගම | – | 2 | 8 |
| 12 | ලංකා පොහොර සමාගම | 15 | 304 | 8 |
| 13 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | - | 10 |
| 14 | පරන්තන් කෙමිකල්ස් සමාගම | – | 10 | 20 |
| 15 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 947 | 947 | 947 |
| 16 | ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 133 | - | 140 |
| 17 | ලංකා විදුලි පුද්ගලික සමාගම | 501 | - | 300 |
| 18 | ලංකා කර්මාන්ත වතු සමාගම | 82 | 82 | 60 |
| 19 | සිලෝන් ඇග්‍රො ඉන්ඩස්ට්‍රීස් | 23 | 77 | 35 |
| 20 | වැවිලි සමාගම් | 172 | 12 | 53 |
| 21 | අනෙකුත් | 12 | - | 1 |
| | **එකතුව** | **27,659** | **17,624** | **32,536** |

මූලාශ්‍ර : රජය සතු ව්‍යවසායන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව